# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 12,162 — 1960 ජූලි 22 වැනි සිකුරාදා — 22.7.1960

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (II) වැනි ඡේදය — පලකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි, සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... | 537 | තෝටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | 541 | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... | 545 | රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... | — | වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම ... ... | 560 | විවිධ දැන්වීම් ... ... ... | — |


## තනතුරු — ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාළවන පොදු කොන්දේසි

**දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ ජීවන දීමනාව යන මෙම දීමනා, ඒ සම්බන්ධයෙන් අන්‍යාකාර යෙන් සඳහන් කොට නැති අවස්ථාවන්හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

**2. සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කාර්‍ය්‍ය සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට හෝ යටත් වන්නේ ය.

**3. සේවයට බාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර) ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් සවකීය මනාපය පරිදි තවත් සියයට 5ක් ද ඊට එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7½කට සමාන වන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබිම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානයන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගේ (ඇප) ආඥාපනතට අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවා වෙහි සිටින්නන්ට හැර සෙස්සන්ට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

**4. නවප්‍රවේශක නිලධාරීහු.**—(i) විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත් කරනු ලබන "නවප්‍රවේශක නිලධාරීන්" සම්බන්ධයෙන් කිසියම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම් කොට ඇති අවස්ථාවන්හිදී මිස අන් හැම අවස්ථාවකදීම ආධුනික/පරීක්ෂා කාලය යථායෝග්‍ය පරිදි තුන් වර්ෂයක් වේ.

(ii) "නවප්‍රවේශක නිලධාරීන්" ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීමත් විශේෂයෙන්ම 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමත් සඳහා දැනට පනවා ඇති ව්‍යවස්ථාවලට මෙන් ම මින් මතු පනවනු ලබන ව්‍යවස්ථාවලට ද අනුකූලව ක්‍රියා කළ යුතු වේ.

(iii) (අ) මෙම නිලධාරීන් සවකීය ආධුනික/පරීක්ෂා කාලය ඇතුළත සිංහල භාෂා විෂයෙහි ප්‍රවීණතාවක් ලබා ගත යුතුය.

(ආ) සිංහල භාෂාව පිළිබඳ ප්‍රවීණතා පරීක්ෂණයකින් සමත් වීම, ආධුනික/පරීක්ෂා කාලය අවසන් වීමෙන් එම නිලධාරීන්ගේ තනතුරු ස්ථිර කිරීම සඳහා අවශ්‍ය වන සුදුසුකම් අතුරින් එකක් වේ.

ආධුනික/පරීක්ෂා කාලය ඇතුළත සිංහල භාෂා විෂයෙහි ප්‍රවීණතාව සම්බන්ධයෙන් නියමිත වූ තත්ත්වයට එළඹීමට අසමත් වන අය තනතුරෙන් පහකරනු ලැබීමට ඉඩ තිබේ. එහෙත් "ඔවුන් රාජ්‍ය භාෂාව හැදෑරීමෙහි ලා අව්‍යාජ ප්‍රයත්නයක් දරා ඇත" යි ඔවුන් එම තනතුරුවලට පත් කළ බලධාරීන් විසින් පිළිගැණෙතොත් එසේ තනතුරුවලින් පහ කිරීම ප්‍රමාද කිරීමට ඉඩ තිබේ. එබඳු වූ කිසියම් නිලධාරියකු නියමිත දිනයට පසු සෑහෙන කාල සීමාවක් ඇතුළත සිංහල භාෂා ප්‍රවීණතාව සම්බන්ධයෙන් පැවැත්වෙන පරීක්ෂණයකින් සමත් වුවහොත්, කලින් අසමත් වීම නිසා ඔහුට නැති වී ගිය ජ්‍යෙෂ්ඨත්වය නැවත ලබා දීම එම කාර්යය පිළිබඳ නිසි බලධාරීහුගේ කැමැත්ත පරිදි සිදු වේ.

(iv) සිංහල මාධ්‍යයෙන් සුදුසු කම් ලබා රාජ්‍ය සේවාවට ඇතුළු වන නවප්‍රවේශක නිලධාරීහු සිංහල භාෂා ප්‍රවීණතා පරීක්ෂණයෙන් නිදහස් කරනු ලැබෙත්.

**සංලක්ෂ්‍යය.**—"නව ප්‍රවේශක නිලධාරීහු" යනුවෙන් මෙහි දී අදහස් කෙරෙනුයේ 1956 සැප්තැම්බර් 24 වැනිදා හෝ ඊට පසු ව හෝ රාජ්‍ය සේවාවේ තනතුරුවලට පත් කරනු ලැබුවා වූද එසේ ම 1957 මැයි 23 වැනි දින නිකුත් කළ අංක 379 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛනයේ 2 (ii) (ආ) සහ 2 (ii) (ඇ) දරන අනුච්ඡේදයන්ට අනුකූල ව ආදී ප්‍රවේශක නිලධාරීන් වශයෙන් නොසැලකෙන්නා වූද තැනැත්තෝ වෙත්.

5. **අවශ්‍ය සුදුසුකම්.**—තමා ලාංකිකයකු වූ බවට සෑහෙන සාක්ෂ්‍ය සෑම ඉල්ලුම්කරුවකු විසින්ම ඉදිරිපත් කළ යුතු ය. "ලාංකික" යනුවෙන් අදහස් කෙරෙනුයේ පරම්පරාවෙන් හෝ ලියා පදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියකු වූවෙකි.

6. **යුද්ධ සේවා අනුග්‍රහය.**—මෙම තනතුරු සඳහා අන්‍ය සෑම අයුරෙක ම සුදුසුකම් ලැබ සිටින්නා වූද, මහා රාජිනියන් වහන්සේගේ යුද හමුදාවන්හි යෙදී සිට සේවා මුක්ත වූද අයට හා සහාය ගිනි නිවන සේවාව, ගගන ප්‍රහාර නිවාරණ සේවාව, මහජනාරක්ෂක සේවාව යන මෙම සේවාවන්හි සම්පූර්ණ කාල සේවයෙහි යෙදී සිටි (සිය කැමැත්තෙන් ම සේවයෙන් අස් වූවන් හැර) සෑම කෙනෙකුට මද ඔවුහු 1945 අගෝස්තු මස 15 වැනි දිනට පෙර එම හමුදාවන්ට බැඳී සතුටුදායක ලෙස නොකඩව සේවය කළෝ නම්, වයස පිළිබඳ සුදුසුකම් ලබා ගැනීම සඳහා පමණක්, ඉතා ඈතින් 1939 සැප්තැම්බර් 3 වැනි දිනත් ඉතා මෑතින් 1949 දෙසැම්බර 31 වැනි දිනත් යන මෙදැතුර තමන් එසේ සේවයෙහි යෙදී සිටි කාලපරිච්ඡේදය තම වයසින් අඩු කර ගැනීමට ඉඩ දෙනු ලැබේ.

7. **වෙනත් අවශ්‍ය කරුණු.**—(i) දැනට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින අවශ්‍ය සුදුසුකම් ඇති නිලධාරීන් මෙම තනතුරුවලට ඉල්ලුම් පත් එවිය යුත්තේ සවකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් මාර්ගයෙනි. රාජ්‍ය සේවාවේ ස්ථිර තනතුරු දරන නිලධාරීන් විසින් එවන ලද ඉල්ලුම් පත් ඉදිරිපත් කිරීමේදී, ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානීහු, එම ඉල්ලුම් කරුවන් (තෝරාගනු ලැබුවහොත්) කාර්ය සංවිධාන සංග්‍රහයේ 109 වැනි පාලන රෙගුලාසියට අනුකූල ව ඔවුන්ගේ නිලවලින් මුදා හැරීමට තමන් සූදානම් ව සිටිත් ද නැද්දැයි සඳහන් කොට එවිය යුතු ය.

(ii) සම්මුඛ පරීක්ෂණයක් සඳහා නියමිත වේලාවක, දන්වනු ලබන තැනකට පැමිණෙන ලෙස අපේක්ෂකයන්ට නියම කරනු ලැබිය හැකි ය. මේ සම්බන්ධයෙන් කිසි ම ගමන් වියදමක් හෝ අන් කිසි වියදමක් හෝ ගෙවනු නො ලැබේ.

(iii) කිසියම් අපේක්ෂකයකු ගැන නිර්දේශයක් කිරීමට යමකුට වුවමනා නම් ඔහු එසේ කළ යුත්තේ එම අපේක්ෂකයාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්ෂකයකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමකින් වුවත් අයථා අනුග්‍රහයක් ලබා ගැනීමකට හෝ බල පැවැත්වීමකට හෝ උත්සාහයක් දරන ලැබුව හොත්, ඒ හේතුවෙන් ම ඒ අපේක්ෂකයා නුසුදුසු බවට පත්වන්නේ ය.

(iv) යම් අයදුම්කරුවකුගේ ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි අසත්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැනගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ම ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් රාජකාර්යයෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

(v) මේ දැන්වීමේ සඳහන් නියමයන්ට කවර ලෙසකින් වුවත් නො ගැළපෙන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

---

## රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව

### දෙවැනි ශ්‍රේණියේ තාවකාලික සිංහල භාෂා පරිවර්තක තනතුරු දෙකක්

රාජ්‍යභාෂා දෙපාර්තමේන්තුවට දෙවැනි ශ්‍රේණියේ තාවකාලික සිංහල භාෂා පරිවර්තක තනතුරු දෙකක් සඳහා අයදුම් පත් එවන ලෙස සුදුස්සන්ට මෙයින් ආරාධනය කරමි. මෙහි පහත දැක්වෙන ආකෘතිපත්‍රයේ අන්දමට පිළියෙල කරන ලද අයදුම් පත්, 1960 අගෝස්තු මස 5 වැනි දිනට පෙර මා වෙත ලැබෙන සේ එවිය යුතුය.

2. **වැටුප්.**—මේ තනතුරුවලට නියමිත වැටුප් ක්‍රමය රුපියල් 1,620න් පටන් ගෙන රු. 120සේ වැඩිවීම් ඇති රුපියල් 3,780 තෙක් නගී.

3. **සේවාව පිළිබඳ කොන්දේසි :—**

(i) මේ තනතුරු තාවකාලිකය. තෝරාගනු ලබන අපේක්ෂකයන්ගේ පත්වීම් මසක් කල් දීමෙන් පසුව නතර කිරීමට ඉඩ තිබේ.

(ii) තෝරාගනු ලබන අපේක්ෂකයන් සුළු කාලයක් ඇතුළත දී තනතුරුවල වැඩ බාරගත යුතු වේ.

(iii) ඔවුන්ට බාර කටයුතු නම්, ඉංග්‍රීසියෙන් සිංහලට පරිවර්තනය කිරීම හා සිංහලෙන් ඉංග්‍රීසියට පරිවර්තනය කිරීම, වෙන දෙපාර්තමේන්තුවලින් ලැබෙන පරිවර්තනයන් ප්‍රතිශෝධනය කිරීම සහ මෙම දෙපාර්තමේන්තුවෙන් නියම කෙරෙන වෙනත් කටයුතු කිරීම ද වේ.

4. **අවශ්‍ය සුදුසුකම් :**—හැම අයදුම් කරුවකුම—

(අ) යටත් පිරිසෙයින්

(i) සිංහල භාෂා විෂයෙහි ලන්ඩන් විශ්ව විද්‍යාලයේ අධ්‍යයන පොදු සහතිකය (උසස් පෙළ) හෝ

(ii) සිංහල විෂයක් වශයෙන් ඇති (විශෙෂ සිංහල නො වේ.) උසස් පාඨශාලා සහතිකය හෝ

(iii) සිංහල විෂයයක් වශයෙන් ඇතිව ලන්ඩන් විශ්ව විද්‍යාලයේ කලා අංශයේ මධ්‍යම සහතිකය හෝ ලංකා විශ්ව විද්‍යාලයේ පොදු කලා විභාගයට සුදුසුකම් ලැබීමේ (ප්‍රථම) විභාග සහතිකය හෝ

(iv) භාණ්ඩාගාරයෙන් පැවැත්වෙන සිංහල ප්‍රවීණතා විභාගයේ (උසස් පෙළ) සාමාර්ථයක්

යන ප්‍රධාන සුදුසුකම්වලින් එකක් හා යටත් පිරිසෙයින් පහත සඳහන් අතිරේක සුදුසුකම්වලින් එකක් ද ලබා තිබිය යුතු ය :—

(i) ඉංග්‍රීසි භාෂාවෙන් හෝ ඉංග්‍රීසි සාහිත්‍යයෙන් හෝ සම්මාන සාමාර්ථ්‍යයක් ද ඇතිව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය. (මේ සම්මාන සාමාර්ථ්‍යය ලබා තිබිය යුත්තේ අපේක්ෂකයා එම සහතිකය ලැබීමට සුදුසු වූ අවස්ථාවේ දී පෙනී සිටි විභාගයේ දී හෝ ඊට පසු පැවැත් වූ යම් ජ්‍යෙ. පා. ස. විභාගයක දී හෝ ඕනෑම අ. පො. ස (සා. පෙ.) විභාගයක දී) ; හෝ

(ii) ඉංග්‍රීසි භාෂාවෙන් හෝ ඉංග්‍රීසි සාහිත්‍යයෙන් හෝ සම්මාන සාමාර්ථ්‍යයක් ද ඇතුළුව විෂයයන් හයකින් අ. පො. ස. (සා. පෙ) විභාගයෙන් සාමාර්ථ්‍යයක්, එහෙත් එකී විෂයයන් හයෙන් පහකින් සමර්ථ වී තිබිය යුත්තේ, එකම වරක දී ය.

(ආ) 1960 අගෝස්තු මස 5 වැනි දිනට වයස අවුරුදු 19ට නොඅඩු හෝ 25ට නොවැඩි හෝ විය යුතුය. දැනට ආණ්ඩුවේ සේවයේ යෙදී සිටින අයට මෙම වයස සීමාව අදාල නොවේ. එහෙත් 1960 අගෝස්තු මස 5 වැනි දිනට ඔවුන්ගේ වයස අවුරුදු 45ට වැඩි නොවිය යුතුය.

(ඇ) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුත් අය විය යුතුය.

5. සෑම අයදුම්කරුවකු විසින්ම පහත පෙනෙන සහතිකවල පිටපත් (මුල් පිටපත් නොවේ) තම අයදුම්පතට අමුණා එවිය යුතුයි :—

(අ) උප්පැන්න සහතිකය (බව්තීස්ම සහතික පත්‍ර හෝ උපකෘත පාඨශාලා පිළිබඳ ව්‍යවස්ථා පොතේ සඳහන් කටයුතු සඳහා දෙන සහතික පත්‍ර බාරගනු නො ලැබේ).

(ආ) 4 වන ඡේදයේ (අ) කොටසෙහි නිර්දේශ කර ඇති අධ්‍යාපන සුදුසුකම් පිළිබඳව ලැබූ සහතික පත්.

(ඇ) අයදුම්කරුගේ සුදුසුකම්, චරිතය, මේ තනතුරට ඇති යෝග්‍යතාව යන මේවා සම්බන්ධයෙන් මෑත දී ලබාගන්නා ලද සහතික තුනක් (රාජ්‍ය සේවාවෙහි සිටින අයදුම්කරුවන්ගෙන් මේ බලාපොරොත්තු නොවේ.)

**සැළකිය යුතුයි.**—සහතික පත්‍රවල හා චරිත සහතිකවල පිටපත් ආපසු එවනු නොලැබේ.

6. ආණ්ඩුවේ සේවාවෙහි නියුක්ත කොයි නිලධාරියකු වුවත් එවන අයදුම්පත් නියමිත දිනයෙන් පසුව මෙහි ලැබුණොත්, ඒ අයදුම්පත ඒ අයදුම්කරුගේ දෙපාර්තමේන්තුවේ ප්‍රධානයාට ඒ දිනයට කලින් ලැබුණෙන් එය ප්‍රමාද වීමට සෑහෙන හේතු දක්වමින් ඒ දෙපාර්තමේන්තුවේ ප්‍රධානයා එය බාරගන්නා ලෙස නිර්දේශ කළහොත් මිස, බාරගනු නොලැබේ.

7. අයදුම්පත් හා ඒ පිළිබඳ සෙසු ලියුම් කියුම් රාජ්‍යභාෂා දෙපාර්තමේන්තුවේ යම්කිසි නිලධාරියකුගේ පෞද්ගලික නමට නොව රාජ්‍ය භාෂා කටයුතු පිළිබඳ විශේෂ කොමසාරිස් වෙත එවිය යුතුය.

8. ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ I වැනි කොටසේ II වැනි ඡේදයෙහි පළවූ ද රාජ්‍ය සේවාවේ තනතුරුවලට කෙරෙන පත්කිරීම් පිළිබඳවූ ද පොදු කොන්දේසි බලනු මැනවි.

9. එවන හැම අයදුම් පතක්ම මෙහි ලැබුණ බව දන්වා එවනු ලැබේ. අයදුම් පත් බාර ගන්නා අවසාන දිනයේ සිට, තුන් දවසක් ඇතුළත එවැනි දැන්වීමක් යම් අයදුම්කරුවකුට නො ලැබුණොත් ඔහු විසින් ඒ බව රාජ්‍ය භාෂා කටයුතු පිළිබඳ විශෙෂ කොමසාරිස් තැනට වහාම දන්වා එවිය යුතුය. එසේ නොකරන අයගේ හිමිකම් ගැන සලකනු නොලැබේ.

රාජ්‍යභාෂා කටයුතු පිළිබඳ විශේෂ කොමසාරිස්.

1960 ජූලි මස 22 වැනි දින,
රාජ්‍යභාෂා දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 598, පිඩ් මාවත, කොළඹ 7.

## රාජ්‍යභාෂා දෙපාර්තමේන්තුව

### දෙවැනි ශ්‍රේණියේ තාවකාලික සිංහල භාෂා පරිවර්තක තනතුර සඳහා ඉල්ලුම් පත්‍රය

(1) අයදුම්කරුගේ සම්පූර්ණ නම :————.

(අ) අගට යෙදෙන නම :————.

(ආ) වෙනත් නම් :————.

(2) ලිපිනය :————.

(3) (අ) වර්ෂ 1960 අගෝස්තු මස 5 වැනි දිනට සම්පූර්ණ වන වයස—අවුරුදු :————මාස :————දවස් :————.

(ආ) උපන් දිනය හා ස්ථානය (උප්පැන්න සහතිකයේ පිට පතක් අමුණා එවිය යුතුයි) :————.

(4) ජාතිය සහ එය කෙසේ හිමිවී ද යන බව :————.

(5) (අ) පියාගේ සම්පූර්ණ නම :————.

(ආ) පියා උපන් දින සහ ස්ථානය :————.

(ඉ) ඔහුගේ ජාතිය :————.

(6) අයදුම්කරු විවාහකද, අවිවාහකද, කනවැන්දුම් ද යන බව :————.

(විවාහක නම් විවාහක වූ දිනයත් දරුවන් ගණනත් සඳහන් කළ යුතුයි) :————.

(7) මූලික අධ්‍යාපනය ලත් පාඨශාලා සහ විද්‍යාල (ඒවාට ඇතුළත් වූ සහ අස්වූ දින සඳහන් කළ යුතුයි) :————.

(8) (අ) සිංහලෙන් හෝ විෂයයක් වශයෙන් සිංහල සහිතව සාමාර්ථ්‍යය ලත් උසස්තම විභාගය :————.

(ආ) ඉංග්‍රීසි භාෂාවෙන් හෝ ඉංග්‍රීසි සාහිත්‍යයෙන් හෝ සම්මාන සාමාර්ථ්‍යයක් ලත් විභාගය :————.

(9) (අ) පරිවර්තක වැඩ සම්බන්ධයෙන් පළපුරුදුකම් තිබේ නම් දින සමග විස්තර සඳහන් කරන්න :————.

(ආ) සාහිත්‍ය කෘතීන් කර පළපුරුදුකම් තිබේ නම් දින සමග ඒවා ද සඳහන් කරන්න :————.

(10) (අ) පාඨශාලාවෙන් හෝ විද්‍යාලයෙන් හෝ අස් වූ පසු නියුක්තව සිටි රක්ෂාවල් ද ඒ පිළිබඳ වකවානු ද, ලැබූ වැටුප් ද සඳහන් කරන්න :————.

(11) විශේෂ පළපුරුදු, පුහුණුවීම් සුදුසුකම් සහ හිමිකම් :————.

(12) පුද්ගලික ලෙස ආශ්‍රය කරන තිදෙනෙකුගේ නම් (තත්වය සහ ලිපිනය සඳහන් කරන්න. මේ අය ඔබේ ඥාතීන් නොවිය යුතුයි) :

(1) :————.

(2) :————.

(3) :————.

(13) චරිත සහතික දී ඇති අයගේ නම් සහ තත්ව (ඥාතීන් නොවිය යුතුයි. මෑතක දී ලත් චරිත සහතිකවල පිටපත් පමණක් අමුණා එවිය යුතුයි) :————.

(14) මුදල් කරදර නැති වූවෙක් ද යන වග—නැති නම් ණය ප්‍රමාණය (ගණන් විස්තර කරන්න) :————.

(15) වෙනත් කරුණු :————.

මෙහි සඳහන් කර ඇති යම්කිසි කරුණක් වැරදි හෝ අසත්‍ය බව හෝ පත්වීම දෙන්නට පෙර හෙළිවෙන්ට යෙදුනොත් මගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ද, පත්වීම් ලැබුවාට පසු හෙළි වූවොත් කිසිම වන්දි ගෙවීමක් නැතිව මා තනතුරෙන් අස් කිරීමටත් යටත් වන බව දැනගෙන සිටින බව ද, මේ අයදුම් පතෙහි දක්වෙන සියළු විස්තර සත්‍ය සහ නිවැරදි බව ද මෙයින් සහතික කරමි.

අයදුම්කරුගේ අත්සන :————.

දිනය :————.

---

## බන්ධනාගාර දෙපාර්තමේන්තුව

### මෝටර් කාර්මික වැඩ/මුද්‍රණ වැඩ සහ පොත් බැඳීම පිළිබඳ පළමුවෙනි ශ්‍රෙණියේ වෘත්තීය උපදේශක තනතුරු

බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ මෝටර් කාර්මික වැඩ පිළිබඳ පළමුවෙනි ශ්‍රෙණියේ වෘත්තීය සහ මුද්‍රණ වැඩ හා පොත් බැඳීම පිළිබඳ පළමුවෙනි ශ්‍රෙණියේ වෘත්තීය උපදේශක යන තනතුරු දෙක සඳහා ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ. පහත දැක්වෙන ආකෘති පත්‍රය අනුව පිළියෙළ කරගත් ඉල්ලුම් පත්‍ර අපේක්ෂකයින් නම අත් අකුරින්ම පුරවා, 1960 අගෝස්තු මස 10 වන දිනට හෝ ඊට පෙර මෙම කාර්යාලයට ලැබෙන සේ, "බන්ධනාගාර කොමසාරිස්, බන්ධනාගාර මූලස්ථානය, කොළඹ 9" යන ලිපිනයට එවිය යුතුයි.

ස. ල.—ඉල්ලුම් පත්‍ර බහා එවන ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ *"මෝටර් කාර්මික වැඩ පිළිබඳ පළමුවෙනි ශ්‍රෙණියේ වෘත්තීය උපදේශක තනතුර"/"මුද්‍රණ වැඩ සහ පොත් බැඳීම පිළිබඳ පළමුවෙනි ශ්‍රෙණියේ වෘත්තීය උපදේශක තනතුර" සඳහා ඉල්ලුම් කිරීම" යනුවෙන් සඳහන් කළ යුතුයි. ඉල්ලුම් පත්‍ර ලැබුණු බව දැනුම් දෙනු නො ලැබේ.

2. **වැටුප් ක්‍රමය.**—රු. 1,320න් පටන් ගෙන, රු. 72 වාර්ෂික වැඩි වීම් 12කින් රු. 2,184 දක්වා වැඩිවන වාර්ෂික වැටුපක් මෙම තනතුරට හිමි වේ.

3. **සේවයට බඳවා ගැනීම පිළිබඳ කොන්දේසි.**—පත්වීම ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයකට සහභාගිවිය යුතුයි.

4. **සේවා කොන්දේසි**—

(අ) පත්වීම තුන් අවුරුද්දක පරීක්ෂාවට භාජන වේ.

(ආ) තෝරාගත් අපේක්ෂකයින් විසින් බන්ධනාගාර නිලධාරීන් පුහුණු කිරීමේ මධ්‍යස්ථානයේ දී, කෙටි අභ්‍යාස මාලාවක් සාර්ථක ලෙස සම්පූර්ණ කළ යුතුයි.

(ඇ) පරීක්ෂා කාලය ඇතුළත, ඔහු තවදුරටත් සේවයෙහි රඳවා ගැනීම, නුසුදුසු යැයි මෙහි පහත අත්සන් කරන්නාට හැගේ නම් ඔහු සේවයෙන් පහ කිරීමට ඉඩ තිබේ.

5. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අපේක්ෂකයෙක්ම තමන්ට පහත සඳහන් සුදුසුකම් ඇති බවට සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි :—

(අ) (i) ලාංකිකයෙකු බව,

(ii) 1960.8.10 වන දිනට අවුරුදු 30ට නො අඩු හෝ අවුරුදු 45ට නො වැඩි බව,

(iii) ඉංග්‍රීසි 7 වන ප්‍රමාණය සමත් වී ඇති බව හෝ ඉංග්‍රීසි සාමාන්‍ය දැනීමක් සමග සිංහල හෝ දෙමළ 7 වන ප්‍රමාණය සමත්වී ඇති බව.

(iv) (අ) මෝටර් කාර්මික වැඩ පිළිබඳ පළමුවෙනි ශ්‍රෙණියේ වෘත්තීය උපදේශක තනතුර සඳහා—

මෝටර් කාර්මික වැඩ පිළිබඳ ආධුනිකත්වයේ සිට ඉන් පසු කුලියට වැඩ කරන්නෙකු ලෙස හෝ නිපුණයෙකු ලෙස හෝ අවුරුදු 10ක් එම වැඩෙහි යෙදීමෙන්, තෙල් දැමීම, "සර්විස්" කිරීම ඇතුළු මෝටර් රථ අලුත්වැඩියා කිරීම සහ නඩත්තු කිරීම පිළිබඳ ලබාගත් සැළැකිය යුතු නිපුනත්වයක් ඇති බව, හෝ

ලංකා කාර්මික විද්‍යාලය මගින් හෝ වෙනත් පිළිගත් ආයතනයකින් හෝ, මෝටර් කාර්මික වැඩ පිළිබඳ අභ්‍යාස පාඨ මාලාවක් සාර්ථක ලෙස සම්පූර්ණ කළ බවට සහතික යක් ලබා, අවුරුදු 10ක වැඩ කිරීමේ පළපුරුද්දෙන් ලබාගත් නිපුනත්වයක් ඇති බව.

(iv) (ආ) මුද්‍රණ වැඩ සහ පොත් බැඳීම පිළිබඳ පළමුවෙනි ශ්‍රෙණියේ වෘත්තීය උපදේශක තනතුර සඳහා—

මුද්‍රණ වැඩ සහ පොත් බැඳීම පිළිබඳ ආධුනිකත්වයේ සිට ඉන්පසු කුලියට වැඩ කරන්නෙකු ලෙස හෝ නිපුණයකු ලෙස හෝ අවුරුදු 10ක් එම වැඩෙහි යෙදීමෙන්, මුද්‍රණ වැඩ සහ පොත් බැඳීම පිළිබඳ ලබාගත් සැළකිය යුතු නිපුනත්වයක් ඇති බව, හෝ

ලංකා කාර්මික විද්‍යාලය මගින් හෝ වෙනත් පිළිගත් ආයතනයකින් හෝ මුද්‍රණ වැඩ සහ පොත් බැඳීම පිළිබඳ අභ්‍යාස පාඨමාලාවක් සාර්ථක ලෙස සම්පූර්ණ කළ බවට සහතිකයක් ලබා, අවුරුදු 10 වැඩ කිරීමේ පළපුරුද්දක් ලබාගත් නිපුනත්වයක් ඇති බව.

(ආ) සමාජ සේවා වැඩ පිළිබඳ පුහුණුවක් හෝ සුදුසුකම් ඇති අපේක්ෂකයින් ගැන විශෙෂයෙන් සළකා බලනු ලැබේ.

6. ඉල්ලුම්කරුවන් විසින් තම ඉල්ලුම් පත්‍රයට පහත සඳහන් **සහතික පිටපත් පමණක්** අමුණා එවිය යුතුයි :—

(අ) උප්පැන්න සහතිකය.

(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපන සහතිකය.

(ඇ) *මෝටර් කාර්මික වැඩ පිළිබඳ/මුද්‍රණ වැඩ සහ පොත් බැඳීම පිළිබඳ සුදුසුකම් දක්වන සහතිකය.

(ඈ) චරිතය පිළිබඳ ළඟදී ලබාගත් සහතික 3ක්.

---

* නුවමනා දේ කපා හරින්න.

7. මෙම ගැසැට් පත්‍රයේ I වෙනි කොටසේ II වෙනි ඡේදයේ ආරම්භයේ එන රාජ්‍ය සේවා තනතුරුවලට අදාල වන පොදු කොන්දේසි බලනු මැනැවි.

8. මෙම නිවේදනයේ ප්‍රකාර නොවන සියලුම අයදුම් පත් ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

ඇෆ්. ඞී. ඇල්. රත්නායක,
වැඩබලන බන්ධනාගාර කොමසාරිස්.

1960 ජූලයි 14 වැනිදා,
කොළඹ 9,
බන්ධනාගාර මූලස්ථානයේදීය.

## බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ * මෝටර් කාර්මික වැඩ/මුද්‍රණ වැඩ සහ පොත් බැඳීම පිළිබඳ පළමුවෙනි ශ්‍රෙණියේ වෘත්තීය උපදේශක තනතුර සඳහා ඉල්ලුම් කිරීම

(**ස.ල.**—එවිය යුත්තේ සහතිකවල පිටපත් මිස මුල් සහතික නොවේ. එවනු ලබන සහතික ආපසු නො එවනවාත් හැර තැපෑලේ දී නැති වන සහතික ගැන මෙම දෙපාර්තමේන්තුව වග කියන්නේ ද නැත).

1. සම්පූර්ණ නම :————.
   නම :————.
   වාසගම :————.

2. ස්ථිර ලිපිනය :————.

3. 1960 අගෝස්තු මස 10 වන දිනට වයස සහ උපන් දිනය (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි) : ————.

4. පියාගේ නම සහ රක්ෂාව :————.

5. උපන් ස්ථානය—
   (අ) ඉල්ලුම්කරුගේ පියා :————.
   (ආ) ඉල්ලුම්කරුගේ පියාගේ පියා :————.

6. (අ) ජාතිය—
   (ආ) ඔබ ලාංකිකයෙක්ද යන බව—
   (i) උත්පත්තියෙන්ද :————.
   (ii) නැතහොත් ලියාපදිංචි කරවා ගැනීමෙන්ද :————.

7. කසාද බැඳලාද නැද්ද යන වග :————.

8. අධ්‍යාපනික සුදුසුකම්—
   (අ) සිංහල :————,
   (ආ) දෙමළ :————.
   (ඇ) ඉංග්‍රීසි :————.

9. *මෝටර් කාර්මික වැඩ/මුද්‍රණ වැඩ සහ පොත් බැඳීම පිළිබඳ ලබාගත් සහතික සහ පළපුරුද්ද ගැන විස්තර (සහතිකවල පිටපත් ඇමිණිය යුතුයි) :————.

10. සමාජ සේවා වැඩ පිළිබඳ සුදුසුකම් හා පළපුරුද්ද ගැන විස්තර (සහතිකවල පිටපත් ඇමිණිය යුතුයි) :————.

11. දැනට රක්ෂාවක් තිබේ නම් එය :————.

12. චරිත සහතිකයක් දෙනු ලබන්නන්ගේ නම් සහ ලිපිනයන් : ————.

13. පාසලින් අස්වූදා සිට කරන ලද රැකියාවන් (ස්වාමියාගේ නම, සේවා කාලය සඳහන් කරන්න. අපේක්ෂකයා රජයේ සේවයේ සිටින්නේ නම් හෝ සිටියේ නම් ඒ පිළිබඳ විස්තර සැපැයිය යුතුයි) :————.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

* නුවමනා දේ කපා හරින්න.

---

## කර්මාන්ත දෙපාර්තමේන්තුව

### ආර්ථික සහායක තනතුරු

කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ආර්ථික සහායක තනතුරු දෙකක් සඳහා ඉල්ලුම් පත් එවන ලෙස මෙයින් ආරාධනා කරනු ලැබේ. මෙහි පහත දක්වා ඇති ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙල කරන ලද ඉල්ලුම් පත්‍ර 1960 අගෝස්තු 10 වැනිදට හෝ ඊට පෙර කර්මාන්ත අධ්‍යක්ෂට ලැබෙන සේ එවිය යුතුය.

2. **පඩි දීමනා සහ සේවා කොන්දේසි.**—මෙම තනතුරට හිමි පඩි ක්‍රමය වර්ෂයකට රුපියල් 3,180න් පටන්ගෙන රු. 120 වාර්ෂික පඩි වැඩිවීම් 6 කින්, රු. 180 වැඩිවීම් 8 කින් සහ රු. 240 වැඩිවීම් 6 කින් යුතුව රු. 4,080, 4,800 සහ රු. 5,580ට පෙර කාර්යක්ෂම කඩඉම සහිතව වර්ෂයට රු. 6,780 තෙක් නගී.

3. **සේවයට බාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—විශ්‍රාම වැටුප් සහිත ස්ථිර තනතුරු වන මේවා අවුරුදු තුනක කාලයක ආධුනිකත්වයට යටත් වේ.

4. **අවශ්‍ය සුදුසුකම්.**—පහත දක්වෙන සුදුසුකම් සෑම අයැදුම්කරු වෙකුටම ඇති බැව් පෙන්වීමට සෑහෙන තරම් සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(i) 1960 අගෝස්තු 10 වැනි දින වන විට අවුරුදු 21 කට නොඅඩු බව හා අවුරුදු 30 කට නොවැඩි බව. දැනට රාජ්‍ය සේවාවේ නියුක්ත වුවන් සම්බන්ධයෙන් මෙකී වයස් සීමාවන් ක්‍රියාවෙහි නොයෙදේ.

(ii) පිළිගත් විශ්වවිද්‍යාලයක ආර්ථික විද්‍යාව පිළිබඳ උපාධි ධරයකු වීම.

5. අයැදුම්කරු විසින් තම ඉල්ලුම් පත් වලට පහත දක්වෙන සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය. (මුල් පිටපත නොවේ) :—

(අ) උප්පැන්න සහතික පත්‍රය (බව්තීස්ම සහතික පත්‍ර හෝ උපකෘත පාඨශාලා පිළිබඳ ව්‍යවස්ථා පොතේ පරමාර්ථයන් උදෙසා නිකුත් කළ සහතික පත්‍ර හෝ පිළිගනු නොලැබේ.).

(ආ) තමා ලත් උසස්ම අධ්‍යාපනික සහ/හෝ වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතිකපත්.

(ඉ) චරිතය පිළිබඳ මෑතකදී ලබා ගත් සහතික පත්‍ර දෙකක්, මින් එකක් අධ්‍යයන අධ්‍යක්ෂගෙන්, විද්‍යාලීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්යවරයාගෙන් ලද්දක් විය යුතුය.

(ඊ) සිංහලෙන් සහ/හෝ දෙමළෙන් සමත් වී ඇති උසස්ම විභාගය පිළිබඳ සහතික පත්‍ර.

**සංලක්ෂ්‍යය :** මෙකී සහතික පත් සහ චරිත සහතික පත්වල පිටපත් ආපසු එවනු නොලැබේ.

6. අයැදුම්පත් හෝ ඒ සම්බන්ධයෙන් එවන අනිකුත් ඕනෑම ලිපියක් වෙතොත් එවිය යුත්තේ කර්මාන්ත අධ්‍යක්ෂට විනා පුද්ගලිකව මෙම දෙපාර්තමේන්තුවේ වෙන කිසිම නිලධාරියෙකුට නොවේ.

7. ආණ්ඩුවේ සේවයේ නියුක්ත නිලධාරීන්ගේ අයදුම් පත් එවිය යුත්තේ ඒ ඒ දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් මගිනි. නියමිත දිනෙන් පසුව මෙම දෙපාතර්මේන්තුවට ලැබෙන ඇයැදුම් පත් බාර ගනු ලබන්නේ ඒවා නියමිත දිනයට කලින් දෙපාතර්මේන්තුවල ප්‍රධානීන්ට ලැබී තිබුණහොත් ද එවා ප්‍රමාද වීමට සෑහෙන හේතු දක්වමින් එම අයැදුම් පත් බාර ගන්නා ලෙස දෙපාර්තමේන්තු ප්‍රධානීන් නිර්දේශ කළහොත් ද පමණකි.

8. මෙම ගැසට් පත්‍රයෙහි පළ වෙන I වැනි කොටසේ මුල II ඡෙදයේ දක්වෙන රාජ්‍ය සේවාවේ තනතුරුවලට කරන පත් කිරීම් වලට අදාළ වූ පොදු කොන්දේසි කියවා බලන ලෙස ඉල්ලමි.

ඊ. සී. ඇස්. පෝල්,
වැඩ බලන කර්මාන්ත අධ්‍යක්ෂ.

1960 ජූලි 14,
කොළඹ 2.

## කර්මාන්ත දෙපාර්තමේන්තුව

### ආර්ථික සහායක තනතුරට පත් කිරීම සඳහා ඉල්ලුම් පත්‍රය

(1) දන්වීම් සඳහන :————.

(2) අයැදුම්කරුගේ නාමය සම්පූර්ණයෙන් (වාසගම මුලට) : ————.

(3) තැපැල් ලිපිනය :————.

(4) (අ) වයස සහ උපන් දිනය (උප්පැන්න සහතිකයේ පිටපත් ඇමිණිය යුතුයි) :————.

(ආ) විවාහක අවිවාහක බව :————.

(5) ජාතිය සහ එය හිමි වූ අන්දම :————

(6) උපන් ස්ථානය—
   (අ) ඇයැදුම්කරු :————.
   (ආ) ඔහුගේ පියා :————.

(7) අධ්‍යාපනික සුදුසුකම් හා සමත් වූ අන්තිම විභාගයේ දී පෙනී සිටි විෂයයන් (දින සහිතව) :————.

(8) අධ්‍යාපනය ලත් පාසැල සහ පාසලෙන් අස් වූ දිනය :————.

(9) පාසලෙන් අස් වූ දා සිට යෙදී සිටි රක්ෂාව සහ රජයේ සේවය යටතේ සිටියා නම් ඒ පිළිබඳ වකවානු හා සම්පූර්ණ විස්තර :————.

(10) සිංහල සහ/හෝ දෙමළ කියවීම, ලිවීම, භාෂන පරිවර්තනය පිළිබඳ ප්‍රවීනත්වය :————.

(11) විශෙෂ සුදුසුකම් වෙතොත් ඒවා පිළිබඳ විස්තර. උදා :— වෘත්තීය, කාර්මික :————.

(12) චරිත සහතික ලබා ගත් අයගේ නම් සහ තනතුරු :————.

(13) ඇයැදුම්කරු පුද්ගලිකව අඳුනන සහ සහතික පත් ලබා ගන්නට නොයෙදුණු, අවශ්‍ය වුවහොත් තොරතුරු ලබා ගත හැකි අය ගේ නම් සහ තනතුරු :————.

(14) හිමිකම් වෙතොත් ඒවා පිළිබඳ විස්තර :————. උදා :— මෙවැනි තනතුරක ලත් පල පුරුද්ද.

————,
අයැදුම්කරුගේ අත්සන.

දතම :—.

කොළඹ 2,
ජිනරතන පාරේ,
අංක 48, කර්මාන්ත දෙපාර්තමේන්තුවේ,
කර්මාන්ත අධ්‍යක්ෂ වෙතට.

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

**1961 වර්ෂය සඳහා සාත්තු සේවා අභ්‍යාස විද්‍යාලවලට ආධුනික සාත්තු සේවිකාවන් බඳවා ගැනීම (ස්වභාෂාවෙන් හා ඉංග්‍රීසියෙන්).**

සාත්තු සේවා අභ්‍යාස විද්‍යාලවලට ආධුනික සාත්තු සේවිකාවන් බඳවා ගැනීම සඳහා ලාංකික අවිවාහක කාන්තාවන්ගෙන් අයදුම් පත් කැඳවනු ලැබේ.

2. **අවශ්‍ය සුදුසු කම්.**—පහත සඳහන් සුදුසුකම් සෑම අපේක්ෂිකාවක්ම පිළිගත හැකි සාධක සහිතව ඉදිරිපත් කළ යුතුයි :—

(අ) මෙම දෙපාර්තමේන්තුවේ සේවිකාවන් හැර සෙසු අය 1960 ජූලි මස 31 වැනි දිනට වයස අවුරුදු 18 ට නො අඩුවූත්, 22 ට නො වැඩිවූත් අය විය යුතුය. එහෙත් දෙපාර්තමේන්තුවේ සේවයේ යෙදී සිටින අයගේ වයස උඩත් පිරිසෙයින් අවුරුදු 32 ට නොවැඩි විය යුතුයි.

(ආ) කවර මාධ්‍යයෙන් හෝ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය හෝ උසස් සහතිකයක් ලබා සිටිය යුතුයි.

(ඇ) අඩුම උස ප්‍රමාණය අඩි 4 අඟල් 10 ක් වත් විය යුතුයි.

(ඈ) අංග විකලත්වයෙන් තොරවූ, දිවයිනේ ඕනෑම පළාතක සේවය කිරීමට හැකි, ශාරීරික සෞඛ්‍ය සුදුසුකම් ඇති යහපත් චරිතයකින් යුතු තැනැත්තියක් විය යුතුයි.

3. **අයදුම් පත්‍රයේ ආකාරය.**—පහත දැක්වෙන ආකෘති පත්‍රය අනුව අයදුම් පත පිළියෙල කොට "සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ තැන, තැ. පෙ. 500, කොළඹ" යන ලිපිනයට ලියා පදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය.

කවරයේ ඉහළ වම් කොනේ "ශිෂ්‍ය සාත්තු සේවිකාවන් තෝරා ගැනීම" යනුවෙන් සඳහන් කළ යුතුයි.

(අ) මේ අයදුම් පත් පහත අත්සන් කරන මගේ හෝ මේ දෙපාර්තමේන්තුවේ වෙනයම් නිලධාරියෙකුගේ පෞද්ගලික නමට එවීම හෝ ප්‍රධාන කායඝාලයේ කිසිම නිලධාරියෙකුට භාරදීම නො කළ යුතුයි.

(ආ) අයදුම් පතෙහි සඳහන් කරුණු සියල්ල සපයනවා හැර කිසිදු ලියවිල්ලක් අයදුම් පත් සමග නො එවිය යුතුයි.

(ඇ) සෑම අයදුම් පත්‍රයකටම රුපියල් 5ක් වටිනා මුද්දරයක් අලවා, එය ඉල්ලුම්කරුගේ අත්සනින් අවලංගු කළ යුතුයි. කිසිදු හේතුවක් නිසා මේ මුදල ආපසු ගෙවනු නො ලැබේ.

(ඈ) අයදුම් පත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ තුමා වෙත 60.8.8 දිනට මත්තෙත් ලැබෙන සේ ඉදිරිපත් කළ යුතුයි.

(ඉ) ඉහත සඳහන් කළ අවශ්‍ය කරුණු අසම්පූර්ණවූ අයදුම් පත් ප්‍රතික්ෂෙප කරනු ලැබේ. එසේ ප්‍රතික්ෂෙප කරණු ලබන්නාවූ අයදුම්පත් එවූ අයදුම් කරුවන්ට දන්වනු නො ලැබේ.

(ඊ) දැනට දෙපාර්තමේන්තුවේ නියුක්තව සිටින සේවිකාවන්ගේ අයදුම් පත් නිසි මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය.

4. **තෝරා ගැනීමේ ක්‍රමය.**—(අ) ඉහත සඳහන් සුදුසුකම් ඇති ආධුනිකයින් විභාග දෙපාර්තමේන්තුව මගින් පොදු සහතික පත්‍ර (සාමාන්‍ය) විභාගයට සමාන තරඟ කිරීමේ පරීක්ෂණයකට ඉදිරිපත් විය යුතුයි. විභාග කොමසාරිස් තුමා සකස් කොට ඇති නීති රීති වලට මේ ආධුනිකයන්ද බැඳී ඇත. 60.9.24 දින පහත සඳහන් ස්ථාන වලදී මෙම පරීක්ෂණය පැවැත්වේ :—

කොළඹ, මහනුවර, මාතලේ, කළුතර, ගාල්ල, මාතර, යාපනය, වවුනියාව, මඩකලපුව, කුරුණෑගල, පුත්තලම, අනුරාධපුරය, බදුල්ල, රත්නපුර සහ කෑගල්ල.

(ආ) සාමාන්‍යයෙන් එක මධ්‍යස්ථානයකට ආධුනිකයන් 50 කට අඩු වීනම්, එම මධ්‍යස්ථානය වසා දමා ඉල්ලුම් පත්‍රයේ ඇති පෞද්ගලික ලිපිනයට ඉතාම නුදුරු ස්ථානයට, වැසූ මධ්‍යස්ථානය ඉල්ලූවන් යවනු ලැබේ. සෑම ආධුනිකයාගේම ඇතුල්වීමේ බලපත්‍රයෙහි, අවසාන වශයෙන් තෝරාගත් මධ්‍යස්ථානය සටහන් කොට ඇත. මෙම බලපත්‍ර සුදුසුකම් ඇති සෑම ආධුනිකයාටම යථා කාලයේදී එවනවා ඇත.

පරීක්ෂණයට පහත පෙනෙන විශයයන් ඇත :—

(i) සාමාන්‍ය මාතෘකාවක් යටතේ වාක්‍ය රචනයක්—පැය එකයි; ලකුණු 100 යි.

(ii) ලංකාවේ දේශපාලන සහ සමාජයීය කරුණුත් ලෝකය සම්බන්ධ කරුණුත් අඩංගු සාමාන්‍ය දැනීම පත්‍රයක්—විනාඩි 30 යි; ලකුණු 100 යි.

(iii) සම්මුඛ පරීක්ෂණයක්— ලකුණු 200 යි.

ප්‍රශ්න පත්‍ර සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන ත්‍රිභාෂාවෙන්ම ඇත. සිංහල සහ දෙමළ ජ්‍යෙෂ්ඨ සහතික ලත් අය එම භාෂාවෙන් උත්තර සැපයිය යුතුයි. ඉංග්‍රීසියෙන් උත්තර දිය යුත්තේ ජ්‍යෙෂ්ඨ සහතික පත්‍ර විභාගයේදී ඉංග්‍රීසි භාෂාවෙන් සාමාර්ථය ලැබූවන් පමණී. කැමති අයදුම් කරුවෙකුට සිංහලෙන් උත්තර සැපයීමට අවකාශ ඇත. පත්‍ර දෙකටම එකම භාෂාවකින් උත්තර සැපයිය යුතුයි.

5. **අඳුනා ගැනීමේ පත්‍ර.**—තමා පෙනී සිටින සෑම විෂයයකදීම පරීක්ෂණ ශාලාවේදී, පාලක තුමාට තමා සැපිරව හඳුන්වා දිය යුතුයි. මේ කාරණයට පහත පෙනෙන ලියකියවිලි භාර ගනු ලැබේ :—

(අ) තැපැල් පතිගෙන් ලත් අඳුනා ගැනීමේ පත්‍ර ;

(ආ) මේ පරීක්ෂණ දිනයට අවුරුදු තුනකට මෑතදී විදේශ ගමන් අවසර පත්‍රය ;

(ඇ) අයදුම් කරුගේ ඡායා රූපයක් සමග රජයේ දෙපාර්තමේන්තුවකින් හෝ සංයුක්ත මණ්ඩලයකින් හෝ එවැනි ව්‍යවස්ථානුකූල සංවිධානයක් මගින් හෝ අවුරුදු 3 කට මෑත නිකුත් කෙරුන සහතිකයක්.

ඇතුලත් වීමේ බල පත්‍රයක් සමගම ඉහත සඳහන් අඳුනා ගැනීමේ පත්‍රයක් නොමැතිවී නම් මෙම පරීක්ෂණයට ඇතුලත් වීමට අවකාශ නොලැබේ.

6. **සම්මුඛ පරීක්ෂණය.**—ලිවීමේ විභාගයෙන් සතුටුදායක තත්ත්වය කට පැමිණියවුන් සම්මුඛ පරීක්ෂනය සඳහා විශේෂයෙන් සකස් වූ සංස්ථාපිත මණ්ඩලයක් ඉදිරියට කැඳවනු ලැබේ. ඉල්ලුම් කරුවන්ට සම්මුඛ පරීක්ෂණය ගැන වෙන වෙනම දන්වෙයි. මේ පරීක්ෂණයට පැමිණෙන විට පහත සඳහන් ලියකියවිලි මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුයි :—

(අ) උප්පැන්න ලියා පදිංචි කිරීමේ සහතික පත්‍රයේ සහතික කළ කොපියක් හෝ රෙජිස්ට්‍රාර් ජනරාල් තුමාගෙන් සාමාන්‍ය වයස සඳහන් කෙරුන විශේෂ සහතික පත්‍රයක් (පාඨශාලා හෝ අධ්‍යාපන කටයුතු සඳහා ලබා ගන්නා ලද උප්පැන්න සහතික හෝ බව්තීස්ම සහතික හෝ භාර ගනු නොලැබේ);

(ආ) ලාංකිකයෙක් වශයෙන් ලියා පදිංචි කළ සහතිකය හෝ ලාංකිකයෙක් වශයෙන් භාර ගැනීමේ මුල් ලිපිය (සුදුසු පිළිවෙලට) ;

(ඇ) තමා ලැබූ අධ්‍යාපනය පිළිබඳ මුල් සහතිකය හෝ සහතිකය නොලද්දේ නම් ඒ සඳහා ලැබූ බල පත්‍ර (උදා :—පෞද්ගලික ආධුනිකයන් පොදු සහතික පත් (සාමාන්‍ය) විභාගයේ ලැබූ ප්‍රතිඵල අඩංගු ලියවිල්ල හෝ ඉල්ලුම් කරුගේ පාසැලේ මූල් ගුරුවරයාගෙන් ලැබූ මූල් ලියවිල්ල) ;

(ඈ) අඳුනා ගැනීමේ පත්‍රය;

(ඉ) චරිතය පිළිබඳ සහතික පත් දෙකක්. මින් එකක් ආධුනිකයා අන්තිමට අධ්‍යාපනය ලැබූ පාසැලේ මූල් ගුරුවරයාගෙන් විය යුතුයි.

**සැලකිය යුතුයි.**—ඉල්ලුම් පත්‍රය යවන කාලයේදී උවමනා සියළුම ලිය කියවිලි අපේක්ෂකයා විසින් සූදානම්ව තබා ගත යුතුයි. සම්මුඛ පරීක්ෂණයේදී මේ ලිය කියවිලි ඉදිරිපත් කිරීමට නො හැකි වූ ආධුනිකයින්ගේ ඉල්ලුම් පත් ඉවත දමනු ඇත.

7. **තෝරා ගැනීම දන්වා යැවීම.**—තෝරා ගනු ලැබූවන්ට වෙන වෙනම දන්වනවා ඇත. ලිවීමේ විභාගයේදී හෝ සම්මුඛ පරීක්ෂණයේදී අසමත්වූවන්ට එය නොදන්වනු ලැබේ.

8. **වෛද්‍ය පරීක්ෂණය.**—තෝරාගත් අපේක්ෂිකාවන් දිවයිනේ කොයිම ප්‍රදේශයක වුවත් හෙදියක් වශයෙන් සේවය කිරීමට හැකි ශාරීරික සෞඛ්‍යයක් ඇති බව සහතික කර ගැනීමට වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතුයි. වෛද්‍ය පරීක්ෂණයේදී නුසුදුසු බව ඔප්පු වී නම් ඒ අය පත්වීම ලැබීමට නුසුදුසු අය වශයෙන් ගැනෙනු ලැබේ.

9. **අවිවාහකව සිටීමේ කොන්දේසි.**—අයදුම් පත් යවන කාලයේදීත් පුහුණුව ලබන අවුරුදු තුන ඇතුලතත්, ඉන් පසු වරින් වර නියම කරන කාල සීමාවන් තුළත් අවිවාහකව සිටිය යුතුයි. මේ කාල සීමාව අවුරුදු සතරකට වැඩි නොවේ.

10. **පුහුණු කිරීමේ ක්‍රමය.**—(අ) පුහුණුව ලැබීමට ත්‍රිභාෂාවෙන්ම පහසුකම් සලස්වා ඇත. පුහුණු වියයුතු කාලය අවුරුදු තුනකි. නිර්දේශ පත්‍රත් පුහුණු කිරීමේ ක්‍රමයත් තෝරාගත් ආධුනිකයිනට සපයනු ලැබේ. ඉංග්‍රීසි භාෂාවෙන් මෙම පුහුණුව ලැබිය හැක්කේ ඉංග්‍රීසි ජ්‍යෙෂ්ඨ සහතික පත්‍ර විභාගයේදී ඉංග්‍රීසි භාෂාවෙන් සාමාර්ථය ලැබූවනට පමණි.

(ආ) පුහුණුව ලබන කාලය තුළ යම් ශිෂ්‍යාවකගේ හැසිරීම සහ වැඩ සතුටුදායක නොවී නම්, වන්දි ගෙවීමක් නොමැතිව පහකරනු ලැබේ.

පුහුණුව ලබන කාලයේදී නිවාස ඇත්නම් නොමිලයේ සපයනු ලැබේ.

11. **වැටුප් ක්‍රමය සහ වෙනත් දීමනා :—**

(අ) ශිෂ්‍ය හෙදියකට—තුන් අවුරුදු පුහුණුව ලබන කාලයේ දී අවුරුද්දකට රු. 1,080 ක යැපීම් දීමනාවක් ලැබෙයි.

(ආ) පත්වීම් ලැබූ හෙදියනට—අවුරුද්දකට රු. 1,824—15—72—රු. 2,904

රෙදි සේදීමේ දීමනා—සිසු හෙදියනට සහ හෙදියනට මසකට රු. 60ක්, පාවහන් පිණිස දීමනාව—සිසු හෙදියනට සහ හෙදියනට මසකට රු. 20ක්, නොමිලයේ නිල ඇඳුම්—සිසු හෙදියනට සහ හෙදියනට නොමිලයේ නිල ඇඳුම් සපයනු ලැබේ.

12. **සේවය පිළිබඳ කොන්දේසි :—**

(අ) තුන් අවුරුදු පුහුණුව ලබා සතුටුදායක ලෙස සාමාර්ථය ලැබූ සිසු හෙදියනට සථිර පත්වීම් ලැබීමෙන් පසු තුන් අවුරුද්දක ප්‍රවේශන කාලයක් ඇත. ඒ පත්වීම් සථිර කරනුයේ මේ ප්‍රවේශන කාලය වූ අවුරුදු තුනෙන් පසු සිංහල භාෂාව සඳහා පැවැත්වෙන නිපුණත්වයේ පරීක්ෂණයකින් පසුව ය.

(ආ) පරීක්ෂණය අවුරුදු 3 ඇතුළත බලාපොරොත්තු වන ප්‍රමාණයට සිංහලයේ නිපුණත්වයක් නො ලැබූවන්ගේ වැඩ නතර කරනවා ඇත. සිංහල නිපුණත්වයක් ලැබීමට මහත් පරිශ්‍රම යක් දැරූ බව පත්කළ නිලධාරීන් විශ්වාස කරන්නේ නම්, වැඩ නැවැත්වීම කල් දමනු ලැබේ. සෑහෙන කාලයක් තුළ මෙම පරීක්ෂණයෙන් සමර්ථ වූයේ නම්, ජ්‍යෙෂ්ඨත්වයෙන් අඩුකිරීම වැළැක්වීම, සුදුසු බලධාරීන්ගේ රුචිය පරිදි වේ. සිංහල මාධ්‍යයෙන් තෝරාගත්තවුන් නිපුණත්වයේ පරීක්ෂණයෙන් නිදහස් වෙනවා ඇත.

(ඉ) 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනත යටතේ ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් දැනට ඇති නීති රීති හා මින්මතුවට ඇතිවන නීති රීති වලට ද මේ තෝරාගත් අපේක්ෂකයින් යටත් විය යුතු ය.

(ඊ) හෙදියන් වශයෙන් පත්වූවාට පසු, රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලෙහි කොටස් කාරියන් විය යුතු ය. 1957 අප්‍රියෙල් 29 වැනි දින පිටවූ අංක 372 දරන භාණ්ඩාගාර චක්‍ර ලේඛනය යටතේ විශ්‍රාම වැටුප් ලැබීමට කැමැත්ත ප්‍රකාශ කළ හැක.

13. තවද මෙම ගැසට් පත්‍රයේ දෙවැනි කොටසේ පළවෙනි ඡේද යෙහි පළකර ඇති රජයේ සේවයේ තනතුරුවලට පත්කිරීමේ දී අදාලවන සාමාන්‍ය කොන්දේසි කියවා අවබෝධ කර ගැනීම යෙහේ.

සී. පොන්නම්බලම්,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙනුවට.

සෞ. සේ. අ. කාර්යාලය,
තැපැල් පෙට්ටිය නො. 500,
කොළඹ, 60. 7. 18.

**ඉල්ලුම් පත්‍රයේ පිළිවෙළ**

1. සම්පූර්ණ නාමය (පැහැදිලි අකුරෙන් ලිවිය යුතුයි) :————.
2. පුද්ගලික ලිපිනය :————.
3. කාර්යාලීය ලිපිනය (රජයේ දෙපාර්තමේන්තුවල නියුක්ත වූවෙක් නම්.) :————.
4. උපන් දිනය සහ අවුරුද්ද :————.
5. සම්පූර්ණ වයස :————.
6. අධ්‍යාපනය ලත් ස්ථානය :————.
7. සාමාර්ථය ලත් විභාග :————.
8. (ඒ) ජාතිය :————.
   (බී) ඉල්ලුම්කරුගේ පියාගේ සම්පූර්ණ නාමය :————.
   (සී) ඔහුගේ ලිපිනය :————.
   (ඩී) ඔහු උපන් ස්ථානය සහ දිනය :————.
   (ඊ) ඔහුගේ ජාතිය :————.
9. පියාගේ හෝ භාරකරුගේ නාමය සහ ලිපිනය :————.
10. කලින් ආණ්ඩුවේ රැකියාවක් කළා නම් ඒ කාල සීමාව :————
11. මේ දැන්වීමෙහි පහත සඳහන් කරුණුවලට අවනත වීමට ඔබ කැමතිද ? :————.
12. මීට කලින් ඔබ තෝරා නොගත්තේ ද ? එසේ නම් ඊට හේතු :————.
13. විභාගයට පෙනී සිටීමට කැමති මධ්‍යස්ථානය (මෙය ඉල්ලුම් කරුගේ වාසස්ථානයට හෝ රැකියාව කරණ ස්ථානයට ආසන්න ස්ථානයක් වියයුතුයි.) :————.
14. ඔබ පුහුණුව ලැබීමට කැමති මාධ්‍යය සඳහන් කරන්න :————.
15. (i) අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය විභාගයේදී ඉංග්‍රීසි භාෂාවෙන් සාමාර්ථය ලද්දාවුන් පමණක් ඉංග්‍රීසි මාධ්‍ය යෙන් පුහුණුව ලැබීමට සුදුස්සෝ වෙත්.
    (ii) කිසිම කරුණක් නිසා ඉල්ලුම් පත්‍රය සමග සහතික පත් හෝ ඒවායේ පිටපත් මේ කාර්යාලයයට නො එවිය යුතුයි.

මේ ඉල්ලුම් පත්‍රයේ මා විසින් සඳහන් කරන ලද සියලු වගන්තින් නිවැරදි හා සත්‍ය බව මෙයින් මම සහතික කරමි. මෙහි මා විසින් සඳහන් කරන ලද යම් වගන්තියක් වැරදි බව, පත්වීමට කලින් ඔප්පුවුවහොත් මා පත්වීම් ලැබීමට නුසුදුස්සකු වන බවද, පත් වීමට පසු යම් කිසි වගන්තියක් ඔප්පු වී නම් වන්දි නොමැතිව පහකරනු ලබන බවද මා දනිමි.

රුපියල් 5

රු. 5ක මුද්දරයක් මෙහි අලවා ඉල්ලුම්කරුගේ අත්සනින් එය අවලංගු කරන්න.

..................
ඉල්ලුම් කරුගේ අත්සන.

දිනය :............

---

අංකය : 1/23/4/4(ඊ).

## සාමාන්‍ය ලිපිකරු සේවයේ විධායක ලිපිකරු පංතියේ දෙවැණි ශ්‍රෙණියේ නිලධාරීන් සඳහා නියමිත ජාතික භාෂා හා ගණන් පිළිබඳ පරීක්ෂණය

සාමාන්‍ය ලිපිකරු සේවයේ විධායක ලිපිකරු පංතියට අයත් මෙහි පහත නම් සඳහන් අයදුම්කරුවන්, 1960 පෙබරවාරි මස 24 වැනි දින සිට මාර්තු මස 1 වැනි දින දක්වා පවත්වන ලද, සාමාන්‍ය ලිපිකරු සේවය පිළිබඳ ව්‍යවස්ථාවේ "සී" උපග්‍රන්ථයේ නියමකොට ඇති පරීක්ෂණයේදී, ඔවුන්ගේ නම් ඉදිරි යෙන් දක්වා ඇති විෂයයන්ගෙන් සාමාර්ථය ලබා ඇති බව පොදු දැනගැනීම සඳහා මෙයින් දැනුම්දෙමි :—

| නම | | දෙපාර්තමේන්තුව | | විෂයයන් |
|---|---|---|---|---|
| අදිකාරිතිලක, යූ. ඩී. | ... | කම්කරු | ... | සිංහල (අ) |
| අන්සාර්, එම්. එම්. | ... | මහා භාණ්ඩාගාරය | ... | දෙමළ (අ) සහ (ආ) |
| අප්පදුරෙයි, ඒ. | ... | ඔඩිට් | ... | ගණන් |
| අප්පුදුරෙයි, පී. | ... | වාරිමාර්ග | ... | දෙමළ (ආ) |
| අපොන්සු, ඩබ්ලිව්. ජී. ජේ. | ... | වරාය (සංයුක්ත) මණ්ඩලය | ... | සිංහල (අ) සහ (ආ) |
| අබයරත්න, ඩී. ආර්. එච්. | ... | අධිකරණ අමාත්‍යාංශය | ... | සිංහල (අ) සහ (ආ) |
| අබේගුණසේකර, යූ. | ... | විභාග | ... | සිංහල (අ) සහ (ආ) |
| අබේවික්‍රම, පී. | ... | කර්මාන්ත | ... | සිංහල (අ) සහ (ආ) |
| අබේසේකර, ඊ. පී. | ... | අධ්‍යාපන | ... | සිංහල (ආ) |
| අරසරත්නම්, ඒ. ටී. | ... | මහා භාණ්ඩාගාරය | ... | ගණන් |
| ආරියදාස, සී. ඩබ්ලිව්. | ... | අධ්‍යාපන | ... | සිංහල (අ) සහ (ආ) |
| ආරුමුගම්, වී. | ... | ඔඩිට් | ... | ගණන් |

| නම | දෙපාර්තමේන්තුව | විෂයයන් |
|---|---|---|
| එඩී, එච්. එස්. | කච්චේරිය, කොළඹ | ගණන් |
| ඒකනායක, ජී. එල්. බී. | සෞඛ්‍ය | සිංහල (ආ) |
| කතිර්කමතම්බි, එස්. | ඔඩිට් | දෙමළ (අ) සහ (ආ) |
| කතිරවේතිපිල්ලේ, එස්. | සුරාබදු | ගණන් |
| කන්තසාමි, ඒ. සී. | වාරිමාර්ග | දෙමළ (අ) සහ (ආ) |
| කන්දය්යා, එස්. | දේශීය ආදායම් | ගණන් |
| කන්දය්යා, කේ. ඊ. | කච්චේරිය, යාපනය | දෙමළ (අ) සහ (ආ) |
| කන්දසාමි, එස්. | ඉඩම් සංවර්ධන | දෙමළ (අ) සහ (ආ) |
| කනගසබාපති, ඒ. | දේශීය ආදායම් | දෙමළ (අ) සහ (ආ) |
| කනගසිංගම්, කේ. | පොලිස් | ගණන් |
| කනගසුන්තරම්, එස්. | සෞඛ්‍ය | දෙමළ (අ) සහ (ආ) |
| කනපතිපිල්ලේ, වී. | වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් කාර්යාලය | ගණන් සහ, දෙමළ (අ) සහ (ආ) |
| ක්ලාස්, එච්. වී. | පොලිස් | ගණන් සහ සිංහල (අ) |
| කැරගල, එන්. | කැලෑ | සිංහල (අ) සහ (ආ) |
| කුමාරස්වාමි, පී. | ඔඩිට් | දෙමළ (අ) සහ (ආ) |
| කුමාරසිංහම්, එස්. | දිස්ත්‍රික් උසාවිය, මඩකලපුව | ගණන් |
| කුලතුංග, ජේ. සී. | ආණ්ඩුවේ වැඩ | සිංහල (අ) |
| කුලසේකර, ඩබ්ලිව්. බී. | ගොවිජන සේවා | සිංහල (අ) සහ (ආ) |
| කොඩිතුවක්කු, කේ. ඩී. | අධ්‍යාපන | සිංහල (ආ) |
| කෝස්තා, වයි. ඩී. | දේශීය ආදායම් | සිංහල (අ) සහ (ආ) |
| කෙලායපිල්ලේ, වී. | කර්මාන්ත | ගණන් සහ දෙමළ (අ) සහ (ආ) |
| ගනේසපිල්ලේ, කේ. | ඔඩිට් | දෙමළ (අ) සහ (ආ) |
| ගනේසලිංගම්, එස්. | මහා භාණ්ඩාගාරය | දෙමළ (අ) සහ (ආ) |
| ගම්වර, එම්. | ඔඩිට් | සිංහල (අ) සහ (ආ) |
| ගුණරත්නම්, ඊ. | ඔඩිට් | ගණන් |
| ගුණවර්ධන, ඩී. සී. එල්. | ඔඩිට් | සිංහල (ආ) |
| ගුණසේන, එස්. එම්. ඩී. | ගුරුවරුන්ගේ වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් කාර්යාලය | සිංහල (අ) |
| ගුණසේන, පී. එච්. | ඔඩිට් | සිංහල (ආ) |
| ගුණසේන, පී. ජී. | කෘෂිකර්ම | සිංහල (අ) සහ (ආ) |
| වෙල්ලය්යා, පී. | පළාත් පාලන | දෙමළ (අ) සහ (ආ) |
| ජයරත්න, කේ. ජී. සී. | ඉඩම් නිරවුල් කිරීමේ | සිංහල (අ) සහ (ආ) |
| ජයවර්ධන, කේ. වී. | කච්චේරිය, රත්නපුර | සිංහල (අ) සහ (ආ) |
| ජයසිංහ, ඩී. ඒ. | දිස්ත්‍රික් උසාවිය, රත්නපුර | සිංහල (අ) සහ (ආ) |
| තර්මලිංගම්, වී. | ඔඩිට් | ගණන් සහ දෙමළ (අ) සහ (ආ) |
| තල්ගොඩපිටිය, ආර්. ඩබ්ලිව්. | පළාත් පාලන | ගණන් |
| තිරුවෙල්වම්, එස්. | කච්චේරිය, කොළඹ | දෙමළ (අ) සහ (ආ) |
| තිරුනාවුකරසු, එස්. | ඉඩම් සංවර්ධන | දෙමළ (අ) සහ (ආ) |
| තිලගරත්නම්, සී. | ආණ්ඩුවේ ගබඩා | දෙමළ (අ) සහ (ආ) |
| තේවසිගාමනි, කේ. | පොලිස් | ගණන් |
| ද අල්විස්, ආර්. එච්. | ඔඩිට් | සිංහල (අ) සහ (ආ) |
| ද අල්විස්, පී. ඒ. ඩී. එම් | දිස්ත්‍රික් උසාවිය | සිංහල (අ) සහ (ආ) |
| දයානන්ද, එම්. ඩබ්ලිව්. එස්. | කර්මාන්ත | සිංහල (අ) සහ (ආ) |
| දසනායක, පී. ජී. ඒ. | මහෙස්ත්‍රාත් උසාවිය, මාතලේ | සිංහල (අ) |
| ද සිල්වා, එච්. ඩබ්ලිව්. පී. | පළාත් පාලන | ගණන් |
| ද සිල්වා, එස්. පී. | සමාජ සේවා | සිංහල (ආ) |
| ද සිල්වා, ඩබ්ලිව්. එම්. සී. | ග්‍රාම සංවර්ධන හා ගෘහ කර්මාන්ත | සිංහල (ආ) |
| දිසානායක, එම්. ඩබ්ලිව්. | ඔඩිට් | සිංහල (අ) සහ (ආ) |
| දිසානායක, ටී. බී. | ඔඩිට් | සිංහල (අ) සහ (ආ) |
| දිසානායක, ඩී. එම්. එන්. | ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශය | සිංහල (අ) සහ (ආ) |
| දෙඩන්වෙල, ටී. බී. | කච්චේරිය, කෑගල්ල | සිංහල (ආ) |
| ධර්මදාස, ඒ. | තක්සේරු | සිංහල (අ) සහ (ආ) |
| ධර්මවර්ධන, එච්. ටී. | රෙජිස්ට්‍රාර් ජනරාල් | ගණන් |
| නන්දදාස, පී. ජී. එස්. | සෞඛ්‍ය | සිංහල (අ) සහ (ආ) |
| නමසිවායම්, එස්. | කම්කරු | ගණන් |
| නමසිවායම්, කේ. | ආහාර කොමසාරිස්ගේ | දෙමළ (අ) සහ (ආ) |
| නමසිවායම, කේ. | පෝට් කොමිෂන් | ගණන් |
| නාගේන්ද්‍රම්, ඊ. | මහා භාණ්ඩාගාරය | දෙමළ (අ) සහ (ආ) |
| නානායක්කාර, කේ. ඒ. ඩී. එස්. | මහා භාණ්ඩාගාරය | ගණන් |
| පත්මනාතන්, කේ. | කර්මාන්ත | ගණන් |
| පත්මනාතන්, කේ. | දේශීය ආදායම් | ගණන් සහ දෙමළ (අ) සහ (ආ) |
| පත්මපෙරුම, ඕ. ඒ. ඩබ්ලිව්. පී. | දේශීය ආදායම් | සිංහල (අ) සහ (ආ) |
| පන්චාචරමූර්ති, එස්. | දේශීය ආදායම් | දෙමළ (අ) සහ (ආ) |
| පන්චාඩ්චරම්, සී. | ධීවර | ගණන් |
| පරම්සෝති, ඒ. | ඔඩිට් | දෙමළ (අ) සහ (ආ) |
| පරමසෝති, එස්. | තක්සේරු | දෙමළ (අ) සහ (ආ) |
| පරමෙන්තිරම්, ඒ. | ආණ්ඩුවේ ගබඩා | දෙමළ (අ) සහ (ආ) |
| පරමේශ්වරම්, එස්. | වාරිමාර්ග | ගණන් |
| පරරාජසේකරම්, සී. | ඔඩිට් | දෙමළ (අ) සහ (ආ) |
| පාස්කරන්, ඒ. | මහා භාණ්ඩාගාරය | ගණන් |
| පියසේන, එච්. එල්. | දේශීය ආදායම් | සිංහල (අ) සහ (ආ) |
| පියසේන, ඩබ්ලිව්. ඒ. ඩී. | දිස්ත්‍රික් උසාවිය, ගම්පහ | ගණන් |
| පීරිස්, එම්. වී. | ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශය | සිංහල (අ) සහ (ආ) |
| පෙරේරා, එම්. ඊ. ජේ. | විභාග | සිංහල (අ) සහ (ආ) |
| පෙරේරා, එම්. ඒ. එස්. | සමුපකාර | සිංහල (අ) සහ (ආ) |
| පෙරේරා, කේ. ඒ. පී. | මුදල් අමාත්‍යාංශය | සිංහල (ආ) |
| පොන්නම්පලම්, එස්. | මහා භාණ්ඩාගාරය | ගණන් සහ දෙමළ (අ) සහ (ආ) |
| පොන්නම්පලම්, වී. | ණය මණ්ඩලය | දෙමළ (අ) |

| නම | දෙපාර්තමේන්තුව | විෂයයන් |
|---|---|---|
| ප්‍රනාන්දු, කේ. එස්. ජේ. ට්. | මහා භාණ්ඩාගාරය | ගණිත් |
| ප්‍රනාන්දු, ඩී. එම්. එල්. වී. | විගණ | සිංහල (අ) |
| ප්‍රේමරත්න, එච්. එල්. | සමුපකාර | සිංහල (අ) සහ (ආ) |
| ප්‍රේමරත්න, පී. ඩී. පී. | දේශීය ආදායම් | සිංහල (අ) සහ (ආ) |
| ෆර්ඩිනැන්ඩු, ඩී. එස්. එස්. | දේශීය ආදායම් | ගණිත් |
| ෆ්‍රැන්සිස්, එම්. එල්. | ආහාර කොමසාරිස්ගේ | දෙමළ (අ) සහ (ආ) |
| ෆ්‍රැන්සිස්, එස්. එස්. | ආණ්ඩුවේ වැඩ | දෙමළ (අ) සහ (ආ) |
| ෆ්‍රැන්සිස්, ඒ. එන්. | ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශය | ගණිත් |
| බින්දුහේවා, එච්. | ග්‍රාම සංවර්ධන හා ගෘහ කර්මාන්ත | සිංහල (අ) සහ (ආ) |
| බුද්ධදාස, එල්. එච්. | ඔඩිට් | සිංහල (අ) |
| මතියාපරානම්, එස්. | ඉඩම් සංවර්ධන | දෙමළ (අ) සහ (ආ) |
| මහින්දරාම, එච්. එම්. සී. | කම්කරු | සිංහල (අ) |
| මහේස්වරන්, වී. | දේශීය ආදායම් | දෙමළ (අ) සහ (ආ) |
| මුතුක්‍රිෂ්ණ , ඊ. | ඔඩිට් | සිංහල (අ) |
| මුරුගුපිල්ලේ, එම්. | කච්චේරිය, යාපනය | දෙමළ (ආ) |
| මුරුගේසු, කේ. | ඔඩිට් | දෙමළ (අ) සහ (ආ) |
| මෛල්වාගනම්, එම්. | සෞඛ්‍ය | ගණිත් |
| රණවීර, ඩබ්ලිව්. එම්. | කච්චේරිය, කොළඹ | සිංහල (අ) සහ (ආ) |
| රත්නායක, ටී. ආර්. එම්. පී. | කෘෂිකර්ම | සිංහල (අ) සහ (ආ) |
| රසසිංහම්, වී. | ඔඩිට් | දෙමළ (අ) සහ (ආ) |
| රසසිංහම්, සී. | දේශීය ආදායම් | දෙමළ (අ) සහ (ආ) |
| රාජපක්ෂ, ආර්. පී. කේ. | අධ්‍යාපන | ගණිත් |
| රාජසිංහ, ඩී. ජේ. ඒ. | පොලිස් | සිංහළ (අ) සහ (ආ) |
| රාමලිංගම්, එස්. | මහා භාණ්ඩාගාරය | ගණිත් |
| ලියනාරච්චි, ඩී. අයි. | ඔඩිට් | සිංහල (අ) |
| ලොකුගේ, එල්. | ස්වදේශ කටයුතු සහ ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යාංශය | සිංහල (අ) සහ (ආ) |
| වල්ලිපුරනාතන්, සී. | ඉඩම් සංවර්ධන | දෙමළ (අ) සහ (ආ) |
| වල්ලිපුරම්, එස්. | කච්චේරිය, යාපනය | දෙමළ (අ) සහ (ආ) |
| වල්ලිපුරම්, කේ. | ඔඩිට් | දෙමළ (අ) සහ (ආ) |
| වාස්, ඩබ්ලිව්. ඒ. | සමුපකාර | සිංහල (අ) සහ (ආ) |
| වික්‍රමනායක, බී. ඩී. ඒ. ද එස්. | මහා භාණ්ඩාගාරය | ගණිත් |
| වික්‍රමසිංහ, ඩී. එච්. | වරාය (සංයුක්ත) මණ්ඩලය | සිංහල (අ) සහ (ආ) |
| විග්නේස්වරමූර්ති, සී. | කම්කරු | දෙමළ (අ) සහ (ආ) |
| විජයධර්ම, එන්. | ගොවිජන සේවා | ගණිත් |
| විජයසේකර, පී. ඒ. ඩී. සී. | පොලිස් | සිංහල (අ) සහ (ආ) |
| විජේතුංග, එස්. | වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් කාර්යාලය | සිංහල (අ) සහ (ආ) |
| විජේසිංහ, එම්. ඒ. පී. | අධ්‍යාපන | සිංහල (අ) |
| විජේසිංහ, ජී. බී. | සමූපකාර | සිංහල (ආ) |
| වීරසිරි, එෆ්. | කච්චේරිය, හම්බන්තොට | සිංහල (අ) සහ (ආ) |
| වීරසිංහ, ඩබ්ලිව්. පී. ජේ. | දිස්ත්‍රික් උසාවිය, මීගමුව | ගණිත් |
| වේලායුතම්පිල්ලේ, කේ. | ආහාර කොමසාරිස්ගේ | දෙමළ (ආ) |
| ෂන්මුගනාතන්, එස්. | දේශීය ආදායම් | දෙමළ (අ) සහ (ආ) |
| ෂන්මුගලින්ගම්, පී. | පරිවාස හා ළමාරක්ෂක සේවා | දෙමළ (අ) සහ (ආ) |
| සතාසිවම්, වී. | කෘෂිකර්ම | දෙමළ (අ) සහ (ආ) |
| සන්තියාපිල්ලේ, ඒ. වී. | ඔඩිට් | දෙමළ (ආ) |
| සන්මුගරාජා, ටී. | දේශීය ආදායම් | දෙමළ (අ) සහ (ආ) |
| සමරසිංහ, බී. එල්. | මහා භාණ්ඩාගාරය | සිංහල (අ) සහ (ආ) |
| සරත්චන්ද්‍ර, කේ. කේ. | පොලිස් | ගණිත් |
| සරවනමුත්තු, එස්. | වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් කාර්යාලය | දෙමළ (අ) සහ (ආ) |
| ස්රිනාතන්, එස්. ටී. | ආණ්ඩුවේ වැඩ | දෙමළ (අ) සහ (ආ) |
| සැල්ඩින්, ටී. ඒ. | අල්ලස් කොමසාරිස්ගේ | ගණිත් |
| සිරිවර්ධන, ඩී. | ස්වදේශ කටයුතු හා ග්‍රාමසංවර්ධන පිළිබඳ අමාත්‍යාංශය | ගණිත් |
| සිරිසේන, කේ. ඩබ්ලිව්. පී. | සෞඛ්‍ය | සිංහල (අ) සහ (ආ) |
| සිරිසේන, යූ. ඩබ්ලිව්. | මුදල් අමාත්‍යාංශය | ගණිත් |
| සිල්වා, එෆ්. එච්. එස්. බී. | කච්චේරිය, කුරුණෑගල | සිංහල (අ) |
| සිවඥානසුන්තරම්, එස්. | සෞඛ්‍ය | ගණිත් |
| සිවනන්තන්, ඒ. | ඔඩිට් | දෙමළ (අ) සහ (ආ) |
| සිවරාමලිංගම්, එස්. | දේශීය ආදායම් | දෙමළ (අ) සහ (ආ) |
| සිවලිංග පිල්ලේ, එස්. | ඔඩිට් | ගණිත් |
| සිවලිංගම්, සී. | ඉඩම් සංවර්ධන | දෙමළ (අ) සහ (ආ) |
| සිවසම්බූ, ඒ. | සෞඛ්‍ය අමාත්‍යාංශය | දෙමළ (අ) සහ (ආ) |
| සිවසුබ්‍රමනියම්, පී. | දේශීය ආදායම් | ගණිත් |
| සුන්තරලිංගම්, කේ. | දේශීය ආදායම් | දෙමළ (අ) සහ (ආ) |
| සුබ්‍රමානියම්, එස්. | ඔඩිට් | දෙමළ (අ) සහ (ආ) |
| සෙන්තිවෙට්පිල්ලේ, වී. | සෞඛ්‍ය | ගණිත් |
| සෙනෙවිරත්න, ඒ. එච්. | ග්‍රාම සංවර්ධන හා ගෘහ කර්මාන්ත | සිංහල (අ) සහ (ආ) |
| සෙබනායගම්, ඒ. සී. | ඉඩම් සංවර්ධන | දෙමළ (අ) සහ (ආ) |
| සෙබස්තියන්, එම්. ඒ. | ඔඩිට් | දෙමළ (අ) සහ (ආ) |
| සෙල්ලතුරෙයි, එස්. | කම්කරු | දෙමළ (අ) සහ (ආ) |
| සෙල්වරත්නම්, එස්. | ග්‍රාම සංවර්ධන හා ගෘහ කර්මාන්ත | ගණිත් |
| සෙල්වරාසා, ටී. | ඇටෝර්නි ජනරාල් | ගණිත් |
| සේනාරත්න, එම්. එන්. එල්. එච්. පී. | කෘෂිකර්ම | සිංහල (අ) සහ (ආ) |
| සොක්කලිංගම්, පී. | වරාය (සංයුක්ත) මණ්ඩලය | දෙමළ (අ) සහ (ආ) |
| හේවගේ, ඩබ්ලිව්. ඩී. | කච්චේරිය, හම්බන්තොට | සිංහල (අ) සහ (ආ) |
| හේවාපතිරන, පී. | කච්චේරිය, කළුතර | සිංහල (අ) සහ (ආ) |

2. මෙහි පහත නම් සඳහන් අපේක්ෂකයන් සාමාන්‍ය ලිපිකරු සේවය පිළිබඳ වාර්තාවේ "සී" උපග්‍රන්ථයෙහි නියමකොට ඇති, සුදුසුකම් ලැබීමේ පරීක්ෂණයෙන් දන් සාමාර්ථය ලබා ඇත :—

| නම | දෙපාර්තමේන්තුව |
|---|---|
| අප්පදුරෙයි, ඒ. | ඔඩිට් |
| අරසරත්නම්, ඒ. ටී. | මහා භාණ්ඩාගාරය |
| ආරුමුගම්, වී. | ඔඩිට් |
| එඩී, එච්. එස්. | කච්චේරිය, කොළඹ |
| කතිරවතේපිල්ලේ, එස්. | සුරාබදු |
| කන්දයියා, එස්. | දේශීය ආදයම් |
| කනගසිංගම්, කේ. | පොලිස් |
| කනපති පිල්ලේ, වී. | වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් කාර්යාලය |
| කුමාරසිංහම්, එස්. | දිස්ත්‍රික් උසාවිය, මඩකලපුව |
| කෛලායපිල්ලේ, වී. | කර්මාන්ත |
| ගුණරත්නම්, ඊ. | ඔඩිට් |
| තර්මලිංගම්, වී. | ඔඩිට් |
| තල්ගොඩපිටිය, ආර්. ඩබ්ලිව්. | පළාත් පාලන |
| තේවසිගාමනි, කේ. | පොලිස් |
| ද අල්විස්, පී. ඒ. ඩී. එම්. | දිස්ත්‍රික් උසාවිය, ගාල්ල |
| ද සිල්වා, එච්. ඩබ්ලිව්. පී. | පළාත් පාලන |
| දෙඩන්වෙල, ටී. බී. | කච්චේරිය, කෑගල්ල |
| ධර්මවර්ධන, එච්. ටී. | රෙජිස්ට්‍රාර් ජනරාල් |
| නමසිවායම්, එය්. | කම්කරු |
| නමසිවායම්, කේ. | පෝට් කොමිෂන් |
| නානායක්කාර, කේ. ඒ. ඩී. එස්. | මහා භාණ්ඩාගාරය |
| පත්මනාතන්, කේ. | කර්මාන්ත |
| පත්මනාතන්, කේ. | දේශීය ආදයම් |
| පන්චාඩිචරම්, සී. | ධීවර |
| පරමේශ්වරම්, එස්. | වාරිමාර්ග |
| පාස්කරන්, ඒ. | මහා භාණ්ඩාගාරය |
| පියසේන, ඩබ්ලිව්. ඒ. ඩී. | දිස්ත්‍රික් උසාවිය, ගම්පහ |
| පොන්නම්පලම්, එස්. | මහා භාණ්ඩාගාරය |
| fපර්ඩිනැන්ඩු, එස්. එස්. | දේශීය ආදයම් |
| fප්‍රැන්සිස්, ඒ. එන්. | ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශය |
| මුරුගුපිල්ලේ, එම්. | කච්චේරිය, යාපනය |
| මෙල්වාගනම්, එම්. | සෞඛ්‍ය |
| රාජපක්ෂ, ආර්. පී. කේ. | අධ්‍යාපන |
| රාමලිංගම්, එස්. | මහා භාණ්ඩාගාරය |
| වික්‍රමනායක, බී. ඩී. ඒ. ද එස්. | මහා භාණ්ඩාගාරය |
| විජයධර්ම, එන්. | ගොවිජන සේවා |
| වීරසිංහ, ඩබ්ලිව්. පී. ජේ. | දිස්ත්‍රික් උසාවිය, මීගමුව |
| වේලායුතම්පිල්ලේ, කේ. | ආහාර කොමසාරිස්ගේ |
| සරත්චන්ද්‍ර, කේ. කේ. | පොලිස් |
| සිරිවර්ධන, ඩී. | ස්වදේශ කටයුතු සහ ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යාංශය |
| සිරිසේන, යූ. ඩබ්ලිව්. | මුදල් අමාත්‍යාංශය |
| සිවඥානසුන්තරම්, එස්. | සෞඛ්‍ය |
| සිවලිංගපිල්ලේ, එස්. | ඔඩිට් |
| සිවසුබ්‍රමනියම්, පී. | දේශීය ආදයම් |
| සෙන්තිවෙට්පිල්ලේ, ඩී. | සෞඛ්‍ය |
| සෙල්වරත්නම්, එස්. | ග්‍රාම සංවර්ධන හා ගෘහ කර්මාන්ත |
| සෙල්වරාසා, ටී. | ඇටෝර්නි ජනරාල් |

වර්ෂ 1960ක් වූ ජූලි මස 16 වැනි දින,
කොළඹ, මහාභාණ්ඩාගාරයේ දී ය.

එච්. ඊ. පීරිස්,
භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්.

---

# ටැන්ඩර් කැඳවීමේ දැන්වීම්

## ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

කොළඹ මහා භාණ්ඩාගාරයේ 270 වැනි කාමරයෙහි වූ මුදල් අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් (තැපැල් ලිපිනය : තැ. පෙ. 500, කොළඹ 1), සුදු පත්‍ර කඩදාසි සැපයීම සඳහා 1960 අගෝස්තු 9 වැනි අඟහරුවාදා පෙරවරු 9.30 තෙක් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

ටෙන්ඩර් විවෘත කරන ඉහත කී වේලාවේදී ටෙන්ඩර්කරුවන්ට ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ.

කොළඹ පාසන්ස් පාරේ ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ අධිකාරි තැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි.

ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් රුපියල් 50ක් ආණ්ඩුවේ බඩු ගබඩාවෙහි හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ බැඳ ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට 1960 අගෝස්තු 8 වැනි සඳුදා දවල් 12 වන තෙක් ටෙන්ඩර් පෝර්ම කොළ දෙනු ලැබේ.

වැඩි විස්තර ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැක..

ලූ. ඒ. විජේසිංහ,
ගබඩා අධිකාරි.

1960 ජූලි 22 වැනි දින,
කොළඹදීය.

## ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

කොළඹ මහා භාණ්ඩාගාරයේ 270 වැනි කාමරයෙහි වූ මුදල් අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් (තැපැල් ලිපිනය : තැ. පෙ. 500, කොළඹ 1), වෙලින්ටන් බූට් සපත්තු (Wellington Gum Boots) සැපයීම සඳහා 1960 සැප්තැම්බර් 6 වැනි අඟහරුවාදා පෙරවරු 9.30 තෙක් ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ.

ටෙන්ඩර් විවෘත කරන ඉහත කී වේලාවේදී ටෙන්ඩර්කරුවන්ට ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ.

කොළඹ පාසන්ස් පාරේ ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ අධිකාරි තැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි.

ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් රුපියල් 50 ක් ආණ්ඩුවේ බඩු ගබඩාවෙහි හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ බැඳ ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළවිට 1960 සැප්තැම්බර් 5 වැනි සඳුදා දවල් 12 වන තෙක් ටෙන්ඩර් පෝර්ම කොළ දෙනු ලැබේ.

වැඩි විස්තර ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවෙන් ලබා ගත හැක.

ලූ. ඒ. විජේසිංහ,
ගබඩා අධිකාරි.

1960 ජූලි 22 වැනි දින,
කොළඹදීය.

---

## රාජකීය ලංකා ගුවන් හමුදව

1. කොළඹ, පාසන්ස් පාරේ පිහිටි රාජකීය ලංකා ගුවන් හමුදවේ ප්‍රධාන මූලස්ථානයට පහත සඳහන් විෂයයන් සැපයීම සඳහා, කොළඹ, සෙනෙට් මන්ත්‍රණ සභා ගොඩනැගිල්ලේ පිහිටි, ආරක්ෂක සහ විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින්, 1960 අගෝස්තු මස 5 වෙනි සිකුරාද උදේ 9.30 වනතුරු ටෙන්ඩර පත්‍ර භාරගනු ලැබේ.

(1) ගෑමට සුදුසු තෙල් මිශ්‍රණ තීන්ත—

| | | | | අධිරාජ්‍ය ගැලුම් |
|---|---|---|---|---|
| (අ) | ෆ්ලැට් අන්ඩර්කෝට්, ගල්පාට | | ... | 80 |
| (ආ) | එම | සුදු | ... | 60 |
| (ඇ) | ඔප නිමාවක් ඇති කරන ආලේපය—සුදු | | ... | 250 |
| (ඈ) | එම | ලානිල් | ... | 100 |
| (ඉ) | එම | ක්‍රීම්පාට | ... | 40 |
| (ඊ) | එම | මධ්‍යම නිල්පාට | ... | 80 |
| (උ) | එම | මධ්‍යම කොළපාට | | 60 |
| (ඌ) | එම | මධ්‍යම රතුපාට | ... | 50 |
| (එ) | එම | කළුපාට | ... | 20 |
| (ඒ) | එම | කහපාට | ... | 30 |
| (ඔ) | එම | මධ්‍යම අළුපාට | ... | 50 |

| | | |
|---|---|---|
| (2) | ලයිනෝරු තෙල්, දෙවරක් උණුකළ ... ... | 30 |
| | ලයිනෝරු තෙල්, පිළියෙල නොකළ ... ... | 50 |
| | ෂෙලැක් වාර්නිස් ... ... ... | 25 |
| | කොපල් වාර්නිස් ... ... ... | 20 |
| | ටර්පන්ටැයින් ... ... ... | 40 |
| | තෙල්සායම දියාරු කරන දේ ... ... | 100 |

(3) තෙල් මිශ්‍රණ ඩිස්ටෙම්පර්—

| | හොණ්ඩර |
|---|---|
| සුදු ... ... ... ... | 10 |
| ලා ක්‍රීම් පාට ... ... ... | 2 |
| ලා නිල් ... ... ... | 3 |
| ලා කොළපාට ... ... ... | 3 |
| ලා රතුපාට ... ... ... | 4 |
| ලා අළුපාට ... ... ... | 4 |

(4) සිමෙන්ති බේස් පේන්ට් වර්ග (ස්නෝසෙම් හෝ ඊට සමාන)—

| | හොණ්ඩර |
|---|---|
| සුදු පාට ... ... ... | 100 |
| දීප්තිය අඩු නිල්පාට ... ... ... | 40 |
| දීප්තිය අඩු අළුපාට ... ... ... | 40 |
| ලා රතුපාට ... ... ... | 40 |
| දීප්තිය අඩු කොළපාට ... ... ... | 40 |
| ඇත්දත් පාට ... ... ... | 20 |
| | ගැලුම් |
| ගල් කරන ද්‍රවය (සෙම්ප්‍රෝවර් හෝ ඊට සමාන) ... | 140 |

(5) ගෑමට සුදුසු තීන්ත මිශ්‍රණය (මළ නොබඳින)—

| | අධිරාජ්‍ය ගැලුම් |
|---|---|
| කළු පාට ... ... ... | 15 |
| රතු ඔක්සයිඩ් පාට ... ... ... | 40 |
| සුදු පාට ... ... ... | 15 |
| ප්‍රංශ අළු පාට ... ... ... | 30 |
| කළු පාට බිටුමැස්ටික් තීන්ත (ගැලුම් 5 පීප්ප) ... | 50 |
| කළු පාට බිටුමැස්ටික් තීන්ත (ගැලුම් 1 පීප්ප) ... | 20 |
| සුදුපාට ස්ප්‍රිතු ... ... ... | 30 |
| බිම ගාන තීන්ත රතුපාට ... ... | 120 |
| එම දුඹුරු පාට ... ... | 40 |
| එම කළු පාට ... ... | 40 |

2. ටෙන්ඩර් පත්‍ර පිළියෙල කළ යුත්තේ කොළඹ, පාසන්ස් පාරේ, ගුවන් හමුදවේ, අණ දෙන නිලධාරියාගෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල ය. එම ටෙන්ඩර් පත්‍රයක් පිටපත් දෙකකින් යුක්තවිය යුතු ය.

3. කොළඹ, පාසන්ස් පාරේ, රාජකීය ලංකා ගුවන් හමුදවේ, ගණකාධිකාරි වෙත, රු. 100 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් තැන්පත් කොට, ඒ සඳහා වූ කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, ටෙන්ඩර් ආකෘති පත්‍රයක් නිකුත් කරනු ලැබේ. එම ආකෘති පත්‍ර 1960 අගෝස්තු මස 4 වෙනි දින දක්වා නිකුත් කරනු ලැබේ.

4. ඉහත සඳහන් පළමුවෙනි ඡෙදයෙහි සඳහන් වේලාවට, එහි සඳහන් ස්ථානයේදී, ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට, ටෙන්ඩර්කරුවන්ට එහි පැමිණ සිටිය හැක.

5. වැඩිදුර විස්තර, ගුවන් හමුදවේ අණදෙන නිලධාරියාගෙන් ලබාගත හැකිය.

ජේ. එල්. බාකර්,
එයාර් වයිස්-මාෂල්,
ගුවන් හමුදවේ අණ දෙන නිලධාරි තැන.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

කොළඹ 8, කොටා රෝඩ්හි බස්නාහිර කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් 1960 අගෝස්තු මස 16 වැනි දින පෙරවරු 11.30 වනතෙක් පහත සඳහන් වැඩ සඳහා ඒ විශයන් ඉදිරියෙන් සඳහන් මුදල් ප්‍රමාණයන් අනුව, වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන්ගෙන් සීල් තබන ලද ටැන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

| වැඩ පිළිබඳ විස්තරය | ලියා පදිංචි ප්‍රමාණය | | ටැන්ඩර් අත්තිකාරම් මුදල |
|---|---|---|---|
| | රු. ශ. | | රු. ශ. |
| (1) ඌරුගොඩවත්තේ තාප්පයක් බැඳීම ... | 20,000 00 | ... | 25 00 |
| (2) ඕවර්සියර්වරුන්ගේ නිවාසයක් සෑදීම—කොළොන්නාව ... | 20,000 00 | ... | 25 00 |

වැඩ විස්තර හා සැලැස්ම බලාගැනීම කර ගත හැක්කේ පහත සඳහන් ස්ථානයෙනි. අනු පිටපතක් සමග එවිය යුතු ටැන්ඩර් පත්‍ර 60.8.13 වන දින සවස 1.00 දක්වා එම ස්ථානයෙන්ම ලබාගත හැකිය. ඕනෑම ටැන්ඩර් පත්‍රයක ඕනෑම කොටසක් පිළිගැනීමේ හෝ ඒවා සම්පූර්ණයෙන් අවලංගු කිරීමේ හෝ බලය රජය සතුය.

ටැන්ඩර් පත්‍ර ලබාගැනීමේදී ඒ සඳහා රුපියල් 25 තැන්පත් මුදලක් ලංකාවේ ඕනෑම කච්චේරියක තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය. නැතහොත් පහත සඳහන් ස්ථානයෙහි තැන්පත් කළ යුතුය.

දැනට රජයේ කොන්ත්‍රාත් ලබාගෙන ඇති ඉල්ලුම්කරුවන් සතුවූ දායක අත්දමින් ඒ වැඩ කෙරෙන බවට ගත් සහතිකයක් ඉදිරිපත් කළ යුතුය.

ජු. ඇ. ලෝබෝ,
වාරිමාර්ග ඉංජිනේරු තැන,
කොළඹ උප කොටස.

වාරිමාර්ග කාර්යාලය,
වේලුවන පාර, කොළඹ 9,
11.7.60.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

### ජාවත්තේ අභිනව ප්‍රධාන වාරිමාර්ග කාර්යාලයයේ අභ්‍යන්තර දුරකථනය හා ශබ්ද වාහිනී ක්‍රමය ඇති කිරීම

1960 ජූලි මස 1 වෙනි දින ඉහත සඳහන් වැඩය සම්බන්ධයෙන් ගැසට් පත්‍රයේ පළ කරන ලද දැන්වීමට අවධානය යොමු කරන්න.

ඉහත සඳහන් ටෙන්ඩර් දැන්වීම මෙයින් අවලංගු කරමි.

වී. කුමාරස්වාමි,
ගොඩනැගිලි උප කොට්ඨාශය භාර
වාරිමාර්ග ඉංජිනේරු තැන.

1960 ජූලි මස 14 වෙනි දින,
ගොඩනැගිලි උප කොට්ඨාශය,
ජාවත්ත පාර, කොළඹ 5.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

තවද 17.6.60 වෙනි දින නො. 12,147 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළමුවෙනි කාණ්ඩයේ දෙවෙනි කොටසේ 719 වෙනි පිටේ ප්‍රසිද්ධ දැන්වීමේ සඳහන් හසලක කුඩා වැවේ ප්‍රවේශ සහ පිටවීමේ වාන්වලට ඔසවන ගියරය (Lifting gear) ආදියෙන් යුත් වාත්තු කල වානේ වාන් දොරටු සහ හසලක කුඩා වැවේ වානට ඔසවන ගියරයෙන් යුත් (Lifting gear) වාත්තුකල වානේ වාන් දොර සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගැනීම 1960 අගෝස්තු මාසේ 17 වෙනි දින දක්වා කල් දමා තිබේ.

ඉහත සඳහන් වැඩට මහනුවර මධ්‍යම කොට්ඨාශය භාර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් 1960 අගෝස්තු මස 17 වෙනි බදාදා පෙරවරු 10 දක්වා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

1960 අගෝස්තු මස 15 වෙනි සඳුදා දක්වා වේරගන්තොට, හසලක උප කොට්ඨාශයයේ වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කායඝිලයෙන් ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ.

වාරිමාර්ග ඉංජිනේරු තැන.

වාරිමාර්ග කායඝිලය,
හසලක උප කොට්ඨාශය,
වේරගන්තොට.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

තංගල්ලේ දකුණු කොට්ඨාශය භාර වාරිමාර්ග ඉංජිනේරු තුමා විසින් හම්බන්තොට උප කොට්ඨාශයෙහි වලවේ වම් ඉවුර ව්‍යාපාරයේ "ඒබ්‍රහම් පාර" අළුත්වැඩියා කිරීම සඳහා 1960 අගෝස්තු මස 16 වන අඟහරුවාදා පෙරවරු 10 දක්වා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

ටෙන්ඩර් පත්‍ර එවිය යුත්තේ හම්බන්තොට උප කොට්ඨාශය භාර වාරිමාර්ග ඉංජිනේරු තුමාගෙන් ලබාගත් පෝර්මවලය. වැඩිදුර කරුණු සඳහා හම්බන්තොට උප කොට්ඨාශය භාර වාරිමාර්ග ඉංජිනේරු තුමාගෙන් විමසන්න, නැතහොත් 9.7.1960 දින දරණ ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම බලන්න.

රු. 13,000 කට හෝ ඊට වැඩි ගණනකට වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වූ බවට සාක්ෂි ඉදිරිපත් කළ කොන්ත්‍රාත්කරුවන්ට 23.7.1960 දින සිට 12.8 60 දින පස්වරු 4.30 දක්වා ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලබන්නේ සෑම ටෙන්ඩරයක් සඳහාම රු. 25ක මුදලක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විටය. මෙම මුදල ඕනෑම කච්චේරියක තැන්පත් කළ හැක.

වෝ. ල. ද. සි. ආදිහෙට්ටි,
වාරිමාර්ග ඉංජිනේරු තැන, හම්බන්තොට.

වාරිමාර්ග කායඝිලය, හම්බන්තොට,
9.7.1960.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

තංගල්ලේ දකුණු කොට්ඨාශය භාර ප්‍රදේශීය වාරිමාර්ග ඉංජිනේරු තුමා විසින් හම්බන්තොට උප කොට්ඨාශයෙහි රිදියගම කාමර 5හේ කම්කරු නිවාසයට කුස්සි 5ක් සෑදීම සඳහා 1960 අගෝස්තු මස 16 වන අඟහරුවාදා පෙරවරු 10 දක්වා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

ටෙන්ඩර් පත්‍ර එවිය යුත්තේ හම්බන්තොට උප කොට්ඨාශය භාර වාරිමාර්ග ඉංජිනේරු තුමාගෙන් ලබාගත් පෝර්මවලය. වැඩිදුර කරුණු සඳහා හම්බන්තොට උප කොට්ඨාශය භාර වාරිමාර්ග ඉංජිනේරු තුමාගෙන් විමසන්න, නැතහොත් 9.7.1960 දින දරණ ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම බලන්න.

රු. 6,000 කට හෝ ඊට වැඩි ගණනකට වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වූ බවට සාක්ෂි ඉදිරිපත් කළ කොන්ත්‍රාත්කරුවන්ට 23.7.1960 දින සිට 12.8.60 දින පස්වරු 4.30 දක්වා ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලබන්නේ සෑම ටෙන්ඩරයක් සඳහාම රු. 25ක මුදලක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විටය. මෙම මුදල ඕනෑම කච්චේරියක තැන්පත් කළ හැක.

වෝ. ල. ද. සි. ආදිහෙට්ටි,
වාරිමාර්ග ඉංජිනේරු තැන, හම්බන්තොට.

වාරිමාර්ග කායඝිලය, හම්බන්තොට,
9.7.1960.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

තංගල්ලේ දක්ෂිණ කොට්ඨාශය භාර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් 1960 අගෝස්තු මස 23 වෙනි දින පෙරවරු 10 දක්වා වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඇඹිලිපිටිය උප කොට්ඨාශයේ පහත සඳහන් කොන්ත්‍රාත් වැඩ සම්බන්ධව මෙම දෙපාර්තමේන්තුවේ යට දැක්වෙන ගණන් වලට ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ගෙන් ටෙන්ඩර් භාරගනු ලැබේ :—

2.

| වැඩ පිළිබඳ විස්තර | | ලියාපදිංචිය යුතු මුදල රු. | ශ. | | ටෙන්ඩර් තැන්පත් මුදල රුපියල් |
|---|---|---|---|---|---|
| උඩවලව ව්‍යාපාරයට ප්‍රවේශවීමේ මාර්ගයේ 1 වන 2 වන සැතපුම් ප්‍රමාණයේ පාර සෑදීම සඳහා | | ... 46,000 | 0 | හෝ ඊට වඩා | ... 50 |
| හුලංදඹය ජලාශ ව්‍යාපාරයේ 'ට්‍රැක්ට්' 2 දරන කොටසේ පහත සඳහන් අංශයන්ගේ වැඩ සඳහා— | | | | | |
| "යුනිට්" | (ඒ) | ... 12,000 | 0 | ,, | ... 25 |
| "යුනිට්" | (බී) | ... 10,000 | 0 | ,, | ... 25 |
| "යුනිට්" | (සී) | ... 7,000 | 0 | ,, | ... 25 |
| "යුනිට්" | (ඩී) | ... 18,000 | 0 | ,, | ... 25 |
| "යුනිට්" | (ඊ) | ... 15,000 | 0 | ,, | ... 25 |
| "යුනිට්" | (ඇෆ්) | ... 17,000 | 0 | ,, | ... 25 |
| "යුනිට්" | (ජී) | ... 23,000 | 0 | ,, | ... 25 |
| "යුනිට්" | (එච්) | ... 28,000 | 0 | ,, | ... 50 |
| "යුනිට්" | (අයි) | ... 30,000 | 0 | ,, | ... 50 |
| "යුනිට්" | (ජේ) | ... 34,000 | 0 | ,, | ... 50 |
| "යුනිට්" | (කේ) | ... 10,000 | 0 | ,, | ... 25 |
| "යුනිට්" | (එල්) | ... 31,000 | 0 | ,, | ... 50 |
| "යුනිට්" | (එම්) | ... 33,000 | 0 | ,, | ... 50 |
| "යුනිට්" | (එන්) | ... 20,000 | 0 | ,, | ... 25 |
| "යුනිට්" | (ඕ) | ... 18,000 | 0 | ,, | ... 25 |

3. ඇඹිලිපිටිය උප කොට්ඨාශය භාර වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් ලබාගන්නා ලද ටෙන්ඩර් පෝර්මවල එක වැඩක් සඳහා ටෙන්ඩර් දෙක බැගින් ඉදිරිපත් කළ යුතුයි.

4. 1960 අගෝස්තු මස 15 වෙනි දින සිට 17 වෙනි දින දක්වා (දෙදිනම ඇතුළුව සහ අවසාන දින සවස 3 දක්වා පමණක්) කායඝිල වේලාවල් තුළදී ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් පෝර්ම ලබාගැනීම පිණිස ඉහත සඳහන් එක වැඩක් හෝ වැඩ කීපයක් සඳහා අවශ්‍ය තැන්පත් මුදල, ඕනෑම කච්චේරියක තැන්පත් කර ලබාගත් කුවිතාන්සියද ලියාපදිංචි කරන ලද පොතද ඉදිරිපත් කළ යුතුය. දැනට රජයේ කොන්ත්‍රාත් ලබා තබෙන අය එම වැඩ භාර නිලධාරීන්ගෙන් එම වැඩය හෝ වැඩ සතුටුදායක ලෙසට කරගෙන යන බවට සහ දැනට ආණ්ඩුව යටතේ තිබෙන වැඩ ප්‍රමාණය ගැනද සහතික ඉදිරිපත් කළ යුතුයි.

5. ටෙන්ඩර් පත්‍ර සම්පූර්ණයෙන් හෝ කොටසක් හෝ පිළිගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය සම්පූර්ණයෙන් රජය සතුය.

ඇම්. ජේ. ඇෆ්. ආර්. සේනාරත්න,
ඇඹිලිපිටිය උප කොට්ඨාශය භාර වාරිමාර්ග ඉංජිනේරු තැන.

වාරිමාර්ග කායඝිලය, ඇඹිලිපිටිය,
1960.7.13.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

උතුරු දිශාව භාර වවුනියාවේ වාරිමාර්ග ඉංජිනේරු තුමා විසින් 1960 අගෝස්තු මස 9 වන දා උදේ 9.30 දක්වා පහත සඳහන් ටෙන්ඩර් වෙන වෙනම භාරගනු ලැබේ :—

(i) ඉරට්පෙරිය කුලම් වැව බැම්මේ පස් වැඩ කිරීම සඳහා, වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රු. 25,000කට හෝ ඊට වැඩියෙන් ලියාපදිංචි වූ පස් පෙරලන යන්ත්‍ර ඇති හා පස් දුරබැහැර ගෙන යාමට පුලුවන් කොන්ත්‍රාත් කරුවන් ගෙන් ද,

(ii) මුහන්තාන් කුලම් වැව් බැම්මේ පස් වැඩ කිරීම හඳහා, වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රු. 45,000කට හෝ ඊට වැඩියෙන් ලියාපදිංචි වූ පස් පෙරලන යන්ත්‍ර ඇති හා පස් දුර බැහැර ගෙන යාමට පුලුවන් කොන්ත්‍රාත් කරුවන් ගෙන් ද,

(iii) මානියාර්කුලමේ පාලමක් තැනීම සඳහා මෙම දෙපාර්තමේන්තුවේ රු. 25,000කට හෝ ඊට වැඩියෙන් ලියාපදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ගෙන් ද,

ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. වවුනියාවේ වාරිමාර්ග ඉංජිනේරු තුමාගේ කායඝිලයෙන් ලබාගත හැකි ආකෘති පත්‍ර වල පිළියෙල කරන ලද ටෙන්ඩර් පත්‍ර දෙක බැගින් මුද්‍රා තැබූ කවරවල බහා ඉදිරිපත් කළ යුතුයි. වැඩ පිළිබඳ විස්තර ද ටෙන්ඩර් පත්‍ර ද වාරිමාර්ග ඉංජිනේරු තුමාගෙන් කාර්යාල වේලාවල දී ලබා ගත හැක. එවන සියලුම ටැන්ඩර් පත්‍රවල කවරයේ වම් කෙලවරේ "ඉරට්පේරියකුලමේ පස් වැඩ සඳහා ටැන්ඩර්" හෝ "මුහන්තාන්කුලමේ වැව් බැම්මේ පස් වැඩ සඳහා ටෙන්ඩර්" හෝ "මනියාර්කුලමේ පාලම තැනීම සඳහා ටෙන්ඩර්" යනුවෙන් ඒ ඒ කාරණය අනුව සඳහන් කළ යුතුයි.

3. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි වී ඇති, රු. 25ක් කච්චේරියේ තැන්පත් කළ බැව් පෙන්වා සිටින කොන්ත්‍රාත් කරුවනට 1960 අගෝස්තු මස 8 වනදා දක්වා ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ.

4 දනට ආණ්ඩුවේ ටෙන්ඩර් ලබාගෙන ඇති ටෙන්ඩර් කරුවන් තමන් ටෙන්ඩර් ආකෘති පත්‍ර ඉල්ලා සිටින විට, ඒ ඒ වැඩය භාර නිලධාරින්ගෙන් ඉතිරිවී ඇති වැඩවල මිල මුදල් සහ කෙටි විස්තර යක් සහිතව වැඩ සතුටුදායක බවට සහතිකයක් ඉදිරිපත් කළ යුතුයි. ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කිරීමට පළමු, සහතිකයේ ඇතුලත් ටෙන්ඩර් හැර අන් කිසි ආණ්ඩුවේ ටෙන්ඩරයක් තමා යටතේ නැතිබවට ප්‍රකාශනයක් කළ යුතුයි.

5. පළමුවැනි ඡේදයේ i සහ ii කොටස් සඳහා ආයුධ හෝ ද්‍රව්‍ය සපයනු නොලැබේ. iii වන කොටස සඳහා වුවමනා සිමෙන්ති පමණක් දෙපාර්තමේන්තුව මගින් වැඩපොල අසල ගබඩාවෙන් සපයනු ඇත. අන් කිසි ද්‍රව්‍යයක් හෝ ආයුධයක් සපයනු නො ලැබේ.

6. 1960 අගෝස්තු මස 9 වන දා උදේ 9.30 ට උතුරු කොට්ඨාශය භාර වාරිමාර්ග ඉංජිනේරු තුමාගේ කාර්යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. 1960 අගෝස්තු මස 9 වන දා සිට සති 6 ක් යන තෙක් සියලුම ටෙන්ඩර් පත්‍ර සැලකිල්ලට භාජන වන බව සැලකිය යුතුයි.

වී. බාලසුබ්‍රමානියම්,
වාරිමාර්ග ඉංජිනේරු තුමා,
වවුනියා උපකොට්ඨාශය.

වවුනියාව,
15. 7. 1960.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

වයඹ කොට්ඨාශය භාර කුරුණෑගල ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් කුරුණෑගල දිස්ත්‍රික්කයේ හක්වටුනා ඔය ජලාශ ව්‍යාපාරයේ යාන්ත්‍රික අංශයේ සුළු විවාහක සේවකයන් සඳහා අර්ධ ස්ථිර නිවාස 4 ක් සෑදීම සඳහා 1960 අගෝස්තු මස 17 වෙනි බුද දින පෙ. ව. 9.30 දක්වා ටැන්ඩර් භාරගනු ලැබේ.

2. හක්වටුනා ඔය ජලාශ ව්‍යාපාරයේ වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් ලබාගත් ෆෝරම පිටපත් දෙකක ටැන්ඩර් ඉදිරිපත් කළ යුතුය. මෙම ෆෝරම නිසි ලෙස පුරවා කොන්ත්‍රාත් කරුගේ අත්සන සහ දාතම යොදා කවරයක බහා සීල් තබා එවිය යුතුය. ලියුම් කවරයේ උඩ වම් කෙළවරෙහි වැඩයේ නම සඳහන් කළ යුතුය. මෙම ටැන්ඩර් කුරුණෑගල ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. නොඑසේ නම් එතුමාගේ කායඹාලයේ ඇති ටැන්ඩර් පෙට්ටියෙහි තැන්පත් කළ යුතුය. මෙම වැඩයට අදාල සියළුම තොරතුරු හක්වටුනා ඔය ජලාශ ව්‍යාපාරයේ වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් විමසා දැනගත හැකි අතර සිතියම් ආදිය එතුමාගේ කායඹාලයේදී පරීක්‍ෂා කළ හැක.

3. හක්වටුනා ඔය ජලාශ ව්‍යාපාරයේ වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් ටැන්ඩර් ෆෝරම නිකුත් කරනු ලබන්නේ 1960 අගෝස්තු මස 16 වෙනි දින දවල් 12 දක්වා පමණි. මෙම දෙපාර්තමේන්තුවේ රු. 7,000කට හෝ ඊට වැඩි ගණනකට ලියාපදිංචිවී ඇති බව ඔප්පු කළ හැකි කොන්ත්‍රාත් කරුවනට ටැන්ඩර් ෆෝරම නිකුත් කරනු ලැබේ. මෙම ෆෝරම ලබාගැනීමේදී රු. 25ක මුදලක් තැන්පත් කොට ඒ සඳහා කුවිතාන්සි ඉදිරිපත් කළ යුතුය. මෙම මුදල වාරිමාර්ග අධ්‍යක්‍ෂක තැන වෙනුවෙන් කච්චේරියේ තැන්පත් කළ හැක.

කේ. වෙල්වරාජා,
වාරිමාර්ග ඉංජිනේරු තැන,
හක්වටුනා ඔය ජලාශ ව්‍යාපාරය.

මකුල්පොත,
ඉබ්බාගමුව හරහා.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

පුත්තලම උප කොට්ඨාශයේ පුත්තලමේ ගෙවල් සෑදූ ඇති ඉඩමට පස් පිරවීම සඳහා රු. 14,000කට හෝ ඉන් ඉහල වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ගෙන් 1960 අගෝස්තු මස 3 වැනි බදාදා පෙරවරු 9.30 වන තෙක් කුරුණෑගල ප්‍රාදේශීය වාරිමාර්ග. ඉංජිනේරුතැන විසින් ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. අනුපිටපතක් ද සමග එවිය යුතු ටෙන්ඩර් පත් පුත්තලම උප කොට්ඨාශයේ වාරිමාර්ග ඉංජිනේරු කායඹාලයෙන් ලබාගත හැකි අතර එහිදී අදාළ සැලැස්මද බැලිය හැක.

3. ප්‍රථම ඡේදයේ සඳහන් කොන්ත්‍රාත්කරුවනට 1960 අගෝස්තු 1 වෙනි සඳුදා තෙක් ටෙන්ඩර් පත් නිකුත් කෙරෙන්නේ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවකු බවට සෑහෙන සාධක දක්වා සිටින හා රු. 25ක තැන්පත් ටෙන්ඩර් මුදලකට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විටය. ටෙන්ඩර් මුදල පුත්තලම් උප කොට්ඨාශයේ වාරිමාර්ග ඉංජිනේරු කායඹාලයේ හෝ කිච්චුම කච්චේරියේ හෝ තැන්පත් කළ හැක.

පී. මුත්තයියා,
වාරිමාර්ග ඉංජිනේරු තැන, පුත්තලම, උ.කො.

පුත්තලමේ වාරිමාර්ග කායඹාලයේ දී ය.

---

පුත්තලම උප කොට්ඨාශයේ මහළුස්වැව ව්‍යාපාරයේ වැව් බැම්මට කලුගල් දැමීම සඳහා රු. 13,000ට හෝ ඉන් ඉහළ වාරිමාග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන් ගෙන් 1960 අගෝස්තු මස 3 වැනි බදාදා පෙරවරු 9.30 වන තෙක් කුරුණෑගල ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරුතුමා විසින් ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. අනුපිටපතක් ද සමග එවිය යුතු ටෙන්ඩර් පත් පුත්තලම උප කොට්ඨාශයේ වාරිමාර්ග ඉංජිනේරු කායඹාලයෙන් ලබාගත හැකි අතර එහිදී අදාළ සැලැස්මද බැලිය හැක.

3. ප්‍රථම ඡේදයේ සඳහන් කොන්ත්‍රාත්කරුවනට 1960 අගෝස්තු මස 1 වැනි සඳුදා තෙක් ටෙන්ඩර් පත් නිකුත් කෙරෙන්නේ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවකු බවට සෑහෙන සාධක දක්වා සිටින හා රු. 25 තැන්පත් ටෙන්ඩර් මුදලකට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විටය. ටෙන්ඩර් මුදල පුත්තලම් උප කොට්ඨාශයේ වාරිමාර්ග ඉංජිනේරු කායඹාලයේ හෝ කිච්චුම කච්චේරියේ හෝ තැන්පත් කළ හැක.

පී. මුත්තයියා,
වාරිමාර්ග ඉංජිනේරුතැන, පුත්තලම, උ. කො.

පුත්තලමේ
වාරිමාර්ග කායඹාලයේදීය.

---

උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් හුරුලුවැව වැවේ වම් ඉවුරේ මහ ඇල ශුද්ධ කිරීම සඳහා 1960 අගෝස්තු මස 17 වෙනි බදාදා සවස 2 දක්වා ටැන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

1960.7.27 වෙනිදා සිට 1960 අගෝස්තු මස 16 වෙනි අඟහරුවාදා සවස 3 දක්වා ටැන්ඩර් ෆෝර්ම නිකුත් කරනු ලැබේ. ඒවා නිකුත් කරනු ලබන්නේ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රු. 25,000 හෝ ඊට වැඩියෙන් ලියාපදිංචි බව ඔප්පු කිරීමට හැකි කොන්ත්‍රාත් කරුවනට සහ ටෙන්ඩරය සඳහා රු. 50ක් ඕනෑම කච්චේරියක හෝ මෙගොඩ වැව පිහිටි හුරුලු වැව උප කොටසේ වාරිමාර්ග කායඹාලයේ තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ අයට පමණකි.

හුරුලු වැව උප කොටසේ, හුරුලු වැව උප කොටස භාර නිලධාරි තැනගෙන් ටැන්ඩර් ෆෝර්ම සහ වැඩි විස්තර ලබාගත හැක. ටැන්ඩර් ෆෝර්ම පිටපත් දෙක බැගින් යුක්තව ඉදිරිපත් කළ යුතුය.

ඒ. ඇෆ්. මහගමගේ,
හුරුලු වැව උප කොටස භාර නිලධාරී තැන,
හුරුලු වැව උප කොටස.

මෙගොමවැව,
1960 ජූලි මස 15 වෙනිදා.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

උතුරු මධ්‍යම කොට්ඨාශයේ අනුරාධපුර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් පහත සඳහන් සේවාවන් සඳහා වෙන වෙනම ටෙන්ඩර් පත්‍ර වෂී 1960ක්වූ අගෝස්තු මස 10 වෙනි බදාදා පෙරවරු 9.30 දක්වා භාරගනු ලැබේ.

| | සේවා විස්තර | ලියාපදිංචි කළ ගණන | ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල |
|---|---|---|---|
| | | රු. ශ. | රු. ශ. |
| 1. | පොලිස් පරීක්ෂක මහතුන්ගේ අර්ධ-ස්ථිර නිවාසයන් තැනීම ... | ... 12,500 00 | ... 25 00 |
| 2 | පොලිස් සැරයන්ලාගේ අර්ධ-ස්ථිර නිවාස දෙකක් ඉදිකිරීම ... | ... 15,000 00 | ... 25 00 |
| 3. | පොලිස් කොස්තාපල්වරුන්ගේ අර්ධ-ස්ථිර නිවාස හයක් ඉදිකිරීම | ... 45,000 00 | ... 25 00 |
| 4. | කණිෂ්ඨ නිලධාරීන්ගේ ස්ථිර නිවාස හතරක් ඉදිකිරීම ... | ... 22,000 00 | ... 25 00 |
| 5. | උස්ගල සියඹලන්ගමුව මාර්ගයේ පැන්නුම් පාලම ඉදිකිරීම ... | ... 10,000 00 | ... 25 00 |

2. ඉහත සඳහන් සේවාවන් ඉදිරියෙහි දක්වා ඇති ගණන්වලට හෝ ඊට වැඩි ගණනකට වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් මේ සඳහා ටෙන්ඩර් දැමීමට සුදුස්සෝය.

3. ටෙන්ඩර් දැමිය යුත්තේ රාජංගන උප කොට්ඨාශයේ වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් ලබාගත් ටෙන්ඩර් ආකෘති පත්‍රවලය. මේ සඳහා වැඩි විස්තර ඔහුගෙන් ලබාගත හැකිය.

4. ටෙන්ඩර් ආකෘති පත්‍ර වර්‍ෂ 1960 ජූලි මස 18 වෙනිදා සිට වර්‍ෂ 1960 අගෝස්තු මස 8 වෙනි දින දක්වා කාර්යාලීය වැඩ කරන කාලයන්හිදී පමණක් ලබාගත හැක.

පී. ආර්. ද සිල්වා,
රාජංගන උප කොට්ඨාශයේ වාරිමාර්ග ඉංජිනේරු තැන.

වාරිමාර්ග කාර්යාලය,
තඹුත්තේගම, 1960.7.9.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

උතුරු මැද පළාත භාර අනුරාධපුර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් මහකනදරාව උප කොට්ඨාශයේ පහත සඳහන් වැඩ සඳහා වර්‍ෂ 1960 අගෝස්තු මස 17 වැනි බදාදා පස්වරු 2.30 වන තෙක් වෙන් වෙන් වශයෙන් ටැන්ඩර් භාරගනු ලැබේ :—

(අ) අනුරාධපුර නව නගරයේ වාරිමාර්ග ගොඩනැගිලි අතර පාර වල් ගල් දමා, තාර දැමීම සහ බෝක්කු බැඳීම.

(ආ) මහකනදරාවට හැරී යන පාර පළමුවන හැතැප්ම ගල් දමා තාර දැමීම.

(ඉ) අනුරාධපුර නව නගරයේ වාරිමාර්ග ගොඩනැගිලි වලට ජලය සැපයීම සඳහා සිමෙන්ති කොන්ක්‍රීට්වලින් මුදුන් ටැන්කියක් ගොඩනැගීම.

(ඊ) නාච්චදූවේ ස්ථිර ඕවර්සියර් නිවාසයක් ගොඩනැගීම.

(උ) මහකනදරාව ස්ථිර කම්කරු නිවාසයක් ගොඩනැගීම.

(අ) සහ (ආ) යනුවෙන් සඳහන් ටැන්ඩර් සඳහා රුපියල් 40,000 ටත් සෙසු ටැන්ඩර් සඳහා රුපියල් 15,000 ටත් දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි වූ කොන්ත්‍රාත්කරුවන් සුදුස්සන් වෙත්.

සෑම ටැන්ඩරයක්ම පිටපත් දෙකකින් යුක්ත විය යුතුය. මේ සඳහා පෝර්ම කොල සහ සියලු විස්තර මිහින්තලේ, මහකනදරාව වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් ලබාගත හැකිය. 1960 ජූලි මස 25 වැනි දින සිට අගෝස්තු මස 13 වැනි සෙනසුරාදා දක්වා පෝරම කොල නිකුත් කරනු ලැබේ.

ටැන්ඩර් පෝර්ම දෙනු ලබන්නේ කච්චේරියක හෝ මහකනදරාව වාරිමාර්ග කායර්‍යාලයෙහි රුපියල් 25ක් තැන්පත් කර කුවිතාන්සියක් ඉදිරිපත් කරන දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි වූ බවට සහතික පෙන්විය හැකි කොන්ත්‍රාත් කරුවනට පමණි.

ටැන්ඩර් භාරගැනීම අවසාන කරන දින පස්වරු 3ට අනුරාධපුර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තුමා විසින් ටැන්ඩර් විවෘත කර බලන අවස්ථාවේ ටැන්ඩර්කරුවනට පැමිණ සිටිය හැක.

ඞී. වී. ඒ. සේනාරත්න,
වාරිමාර්ග ඉංජිනේරු.

මහකනදරාව උප කොට්ඨාශය,
1960 ජූලි මස 14 වෙනි දින,
මිහින්තලේ.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

උතුරු මැද පළාතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින්, (අ) දිවුල්වැව වැවේ සහ (ආ) රම්පත්විල වැවේ ගංවතුරින් කැඩී බිඳී ගිය තැන් අලුත්වැඩියා කිරීම සඳහා 1960 අගෝස්තු මස 17 වෙනි බදාදා සවස 2.00 වනතුරු එක් එක් වැඩය සඳහා වෙන වෙනම ටැන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

1960 ජූලි මස 27 වෙනිදා සිට 1960 අගෝස්තු මස 16 වෙනි අඟහරුවාදා සවස 2.00 දක්වා ටැන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ. ඒවා නිකුත් කරනු ලබන්නේ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රුපියල් 30,000 හෝ ඊට වැඩියෙන් ලියාපදිංචි බව ඔප්පු කිරීමට හැකි කොන්ත්‍රාත්කරුවනට සහ ඒ අය එක් එක් ටෙන්ඩරය සඳහා රුපියල් 50ක් ඕනෑම කච්චේරියක හෝ මෙගොඩවැව පිහිටි හුරුලුවැව උප කොටසේ වාරිමාර්ග කාර්යාලයේ තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ අයට පමණි.

හුරුලුවැව උප කොටසේ හුරුලුවැව උප කොටස භාර නිලධාරි තැනගෙන් ටැන්ඩර් පෝර්ම සහ වැඩි විස්තර ලබාගත හැක. ටැන්ඩර් පෝර්ම පිටපත් දෙක බැගින් ඉදිරිපත් කළ යුතුය.

ඒ. ඇෆ්. මහගමගේ,
හුරුලුවැව උප කොටස භාර නිලධාරි තැන,
හුරුලුවැව උප කොටස.

මෙගොඩවැව, 60.7.13.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

පොළොන්නරු ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තුමා විසින් ගල් අමුණ ව්‍යාපාරයේ 3 වෙනි කොටසේ අඩි 0 සිට අඩි 1ක දක්වා නිර්මාන 33ක් සෑදීම, ගල් අමුණ ව්‍යාපාරයේ 1 වෙනි සහ 3 වෙනි කොටස්වල කම්කරු නිවාස සෑදීම සහ අත්තරගල් ලැව අමුණ ව්‍යාපාරයේ නඩත්තු ඕවර්සියර් බංගලාවක් සෑදීම සඳහා මෙම දෙපාර්තමේන්තුවේ රුපියල් 6,000, රුපියල් 11,000, රුපියල් 11,000 සහ රුපියල් 17,000කට වැඩියෙන් ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ගෙන් අගෝස්තු මස 17වෙනි දින පෙරවරු 9.30 දක්වා වෙන වෙන ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. තමන් විසින් එවන ලද ටෙන්ඩර් පෝරම දෙක සම්පූර්ණ කර එවිය යුතුය. මේ සම්බන්ධව සියලුම විස්තර මින්නේරිය උප කොටස භාර වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් ලබාගත හැක.

3. 1960 ජූලි මස 22 වෙනි දින සිට අගෝස්තු මස 12 වෙනි දින දක්වා මින්නේරිය උප කොටස භාර වාරිමාර්ග ඉංජිනේරු තුමා ටෙන්ඩර් පෝරම නිකුත් කරනු ලැබේ.

4. ටෙන්ඩර් පෝරම සඳහා කොන්ත්‍රාත්කරුවන් විසින් රුපියල් 25, රුපියල් 25, රුපියල් 25, සහ රුපියල් 25 වෙන වෙනම තැන්පත් කළ යුතුය.

5. මොනයම් කරුණක් සඳහා හෝ කොන්ත්‍රාත්කරුවන්ට ආණ්ඩුවේ ආවුද දෙනු නොලැබේ. සිමෙන්ති පමණක් කොන්ත්‍රාත්කරුවන්ට ආණ්ඩුව මගින් සපයනු ලැබේ.

ජී. එස්. එම්. ෂොක්මන්,
වාරිමාර්ග ඉංජිනේරු තැන,
මින්නේරිය උප කොටස.

මින්නේරිය, 11.7.1960.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

ඊශාන කොටස භාර පොළොන්නරුවේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් ගල්ලිඳ මහ වැවේ අඟල් 15ක සොරොව්වක් තැනීම සඳහා මෙම දෙපාර්තමේන්තුවේ රුපියල් 7,000 හෝ ඊට වැඩියෙන් ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ගෙන් අගෝස්තු මස 17 වැනි දින පෙරවරු 9.30 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

තමන් විසින් එවනු ලබන ටෙන්ඩර් පෝර්ම දෙක සම්පූර්ණ කොට එවිය යුතුයි. මේ සම්බන්ධව සියලුම විස්තර මින්නේරිය උප කොට්ඨාශය භාර වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් ලබාගත යුතුය.

1960 ජූලි මස 22 වැනි දින සිට අගෝස්තු මස 12 වැනි දින දක්වා මින්නේරිය උප කොට්ඨාශයේ වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ.

ටෙන්ඩර් පෝර්ම සඳහා කොන්ත්‍රාත්කරු විසින් රුපියල් 25ක් තැන්පත් කළ යුතුයි.

මොනයම් කරුණක් සඳහා හෝ කොන්ත්‍රාත්කරුවනට ආණ්ඩුවේ ආයුධ දෙනු නොලැබේ.

ජී. එස්. එම්. ෂොක්මන්,
වාරිමාර්ග ඉංජිනේරු තැන,
මින්නේරිය උප කොටස.

මින්නේරිය,
1960.7.13.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

පොළොන්නරුවේ ඊසාන දිසාව භාර ප්‍රදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් පහත සඳහන් වැඩ සඳහා මෙම දෙපාර්තමේන්තුවේ රුපියල් 18,000කට ලියාපදිංචිවී ඇති කොන්ත්‍රාත් කරුවන්ගෙන් ටෙන්ඩර් 1960 අගෝස්තු මස 17 වෙනි බදාදා පෙරවරු 9.30 වන තෙක් භාරගනු ලැබේ:—

| වැඩ විස්තර | තැන්පත් කළ යුතු මුදල |
|---|---|
| (1) කවුඩුල්ල උප කොට්ඨාශයේ මින්නේරියේ ඕවර්සියර් නිවාසයක් සෑදීම | රු. 25 |
| (2) කවුඩුල්ල උප කොට්ඨාශයේ රොටවැව ඕවර්සියර් නිවාසයක් සෑදීම | රු. 25 |

තැන්පත් කළ යුතු මුදල කවුඩුල්ල වාරිමාර්ග කාර්යාලයෙහි හෝ ඕනෑම කච්චේරියක තැන්පත් කොට රිසිට් පතක් ඉදිරිපත් කිරීමෙන් 1960.8.1 වෙනි දින සිට 1960.8.15 වෙනි දිනු දක්වා ටෙන්ඩර් පත්‍ර කවුඩුල්ල වාරිමාර්ග කාර්යාලයෙන් ලබාගත හැක.

ආණ්ඩුවේ දැනට වැඩ කරගෙන යන කොන්ත්‍රාත්කරුවන් ඔවුන්ගේ වැඩවල තත්ත්වය පිළිබඳව සහතිකයක් එම වැඩ භාර නිලධාරි තැනගෙන් ඉදිරිපත් කළ යුතුය.

ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී පෙනී සිටීමට කැමති කොන්ත්‍රාත්කරුවන් 1960වේ අගෝස්තු මස 17 වෙනි දින පෙරවරු 9.30ට ඊසාන දිසාව භාර ප්‍රදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයට පැමිණිය යුතුයි.

වැඩි විස්තර සඳහා කවුඩුල්ල උප කොට්ඨාශය භාර වාරිමාර්ග නිලධාරි තැනගෙන් විමසන්න.

ඕ. ඒ. ගුණවර්ධන,
වාරිමාර්ග ඉංජිනේරු තැන,
කවුඩුල්ල උප කොට්ඨාශය.

1960වේ ජූලි මස 14 වෙනි දින,
හිඟුරක්ගොඩදීය.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

ඊශාන කොටස භාර පොළොන්නරුවේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉන්ජිනේරු තැන විසින් මින්නේරිය ව්‍යාපාරයේ හතරවැනි අවස්ථාවේ ඕවසියර් නිවාසයක් සහ කම්කරු නිවාසයක් තැනීම සඳහා මෙම දෙපාර්තමේන්තුවේ රුපියල් 17,000 සහ රුපියල් 13,000 යනාදී වශයෙන් හෝ ඊට වැඩියෙන් ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන්ගෙන් වෙන් වශයෙන් 1960 අගෝස්තු මස 17 වැනි දින පෙරවරු 9.30 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

තමන් විසින් ලබාගන්නා ටෙන්ඩර් පෝරම දෙකම සම්පූර්ණ කොට එවිය යුතුයි. මේ සම්බන්ධව සියලුම විස්තර මින්නේරිය උප කොට්ඨාශය භාර වාරිමාර්ග ඉන්ජිනේරු තැනගෙන් ලබාගත යුතුයි.

1960 ජූලි මස 22 වෙනි දින සිට අගෝස්තු මස 12 වෙනි දින දක්වා මින්නේරියේ උප කොටස භාර වාරිමාර්ග ඉන්ජිනේරු තැන විසින් ටෙන්ඩර් පෝරම නිකුත්කරනු ලැබේ.

එක් එක් ටෙන්ඩර් පෝරමය සඳහා කොන්ත්‍රාත්කරුවන් විසින් රුපියල් 25ක් තැන්පත් කළ යුතුයි.

මොනයම් කරුණක් සඳහා හෝ කොන්ත්‍රාත්කරුවන්ට ආණ්ඩුවේ ආයුධ දෙනු නොලැබේ.

ජී. එස්. එම්. හොක්මන්,
වාරිමාර්ග ඉංජිනේරු තැන,
මින්නේරි උප කොටස.

1960 ජූලි මස 13 වැනි දින,
මින්නේරියේ දීය.

---

## කෘෂිකම් දෙපාර්තමේන්තුව

### පේරාදෙණියේ මධ්‍ය පර්යේෂණායතනයේ රබර්ගස් සඳහා ටෙන්ඩර්

පේරාදෙණියේ කෘෂිකම් දෙපාර්තමේන්තුවේ කෘෂිකම් අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් පහත සඳහන් සේවාවන් සඳහා ටෙන්ඩර් පත්‍ර 1960 අගෝස්තු මස 12 වැනි දින පස්වරු 2.30 වන තෙක් භාර ගනු ලැබේ.

පේරාදෙණියේ ඊරියගම රබර් වත්තේ රබර් ගස් 1,200 ක් මුලින් උදුරා වත්තෙන් පිටතට ගෙනයාම.

2. පේරාදෙණියේ මධ්‍යම පර්යේෂණායතනයේ කෘෂිකම් විද්‍යාලයාධිපති ගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ඒවායෙහි එවිය යුතුයි. සියළුම ටෙන්ඩර් පත්‍ර ලියදු කවරයක දමා සීල් තබා සභාපති මහතා, ටෙන්ඩර් මණ්ඩලය, කෘෂිකම් අංශය, කෘෂිකම් දෙපාර්තමේන්තුව, පේරාදෙණිය'' යන්න එහි පිට ලියා එහිම මුදුනේ වම් කොනෙහි "රබර්ගස් සඳහා සැපයීමේ ටෙන්ඩර්'' යන්න ලියා එවිය යුතුයි. එක ගසකට ගෙවිය හැකි මිල ගණන ටෙන්ඩරයේ සඳහන් කළ යුතුයි.

3. ටෙන්ඩර් පත්‍ර රිජිස්ටර් තැපෑලෙන් එවිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර රෙජිස්ටර් තැපෑලෙන් නොඑවතොත් ටෙන්ඩර්කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් විසින් පේරාදෙණියේ කෘෂිකම් දෙපාර්තමේන්තුවේ කෘෂිකම් අංශයේ පරිපාලන නිලධාරි තැනට ඒවා අතින්ම භාර දිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර බහා ලන ලද කවරයෙහි "රබර් ගස් සඳහා සැපයීමේ ටෙන්ඩර් පත්‍රය" යන්න ලියා ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය ද සඳහන් කළ යුතුයි.

4. රෙජිස්ටර් තැපෑලෙන් එවන ලද ටෙන්ඩර් පත්‍ර ලැබුණ බව ඒවා විවෘත කරන දිනයේදීම සියළු ටෙන්ඩර්කරුවන්ට දන්වනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම නැවැත්වූ විට එදින සිට දින හතරක් ඇතුළත යම් ටෙන්ඩර්කරුවෙකුට එවැනි දන්වීමක් නොලැබුණ හොත් ඔහු පේරාදෙණියේ, කෘෂිකම් දෙපාර්තමේන්තුවේ කෘෂිකම් අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැනගෙන් වහාම ඒ ගැන කරුණු විමසිය යුතුය.

5. ටෙන්ඩර් පත්‍ර භාර ගන්නා අවසාන දින දවල් 12 වන තෙක් ටෙන්ඩර් පෝර්ම දෙනු ලැබේ. ඒ දීම කරන්නේ ටෙන්ඩර් පත්‍රයක් වෙනුවෙන් රුපියල් 10 ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ පසුවය. මේ තැන්පත් කිරීම කච්චේරියක හෝ මහා භාණ්ඩාගාරයේ හෝ කළ යුතුයි. පොරොන්දු පත්‍රය අත්සන් කළ පසු ටෙන්ඩර් තැන්පත් මුදල ආපසු දෙනු නොලැබේ.

පත් කර ගනු ලැබූ ටෙන්ඩර්කරුවන්ට ඔහුගේ ටෙන්ඩර් පත්‍රය පිළිගත් බව දන්වා 10 දිනක් ඇතුළත දී අවශ්‍ය වුවහොත් ගිවිසුම් පත්‍රයක් අත්සන් කළ යුතුය.

6. නියමිත පෝර්මයේ ලියා නැති නැතහොත් එහි නියමිත කොන්දේසි සම්පූර්ණ වශයෙන් ඉටුවී නැති කිසිම ටෙන්ඩර් පත්‍රයක්, ටෙන්ඩර් පත්‍රයක් ලෙස සළකණු නො ලැබේ. ටෙන්ඩර් ප්‍රමාණයන් සහ ගණන් පැහැදිලි ලෙස තීන්තෙන් සළකුණු කළ යුතුවාත් හැර ඒවා සම්බන්ධයෙන් යම්කිසි වෙනසක් කළහොත් ඒ තැන්වල ටෙන්ඩර්කරුවාගේ කෙටි අත්සන තැබිය යුතුද වේ.

7. ටෙන්ඩර්කරුවන් තම ලිපිනය පැහැදිලි අකුරින් ටෙන්ඩර් පත්‍රයෙහි ලියවිය යුතුයි.

8. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් වූද පිළිගනු ලැබුවාවූද දේවල මුළු වියදමෙන් සියයට 5 ක ඇප මුදලක් කෘෂිකම් අධ්‍යක්‍ෂක තැනගේ නමින් තැන්පත් කිරීමටත් පොරොන්දු පත්‍රයක් අත්සන් කිරීමටත් පත්කර ගනු ලැබූ ටෙන්ඩර්කරුවාට නියම කරනු ලැබේ. මේ මුදල ආපසු දෙන්නේ මේ කොන්ත්‍රාත්තුව නිසි පරිදි ඉටුකොට නිමවූ විට පමණකි. පත් කරගනු ලැබූ ටෙන්ඩර්කරුට මේ කොන්ත්‍රාත්තුව ඉටු නොකළ හොත් ඔහුගේ ඇප මුදල රාජසන්තක වෙනවා පමණක් නොව ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වෙනවා ද ඇත.

9. ගිවිසුම් පත්‍රයට ඇලවිය යුතු මුද්දරවල වටිනාකම පත් කර ගනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින් ගෙවිය යුතුයි.

10. යම්කිසි ටෙන්ඩර් පත්‍රයක් හෝ සියළුම ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්‍ෂෙප කිරීමේත්, ටෙන්ඩර් පත්‍රයක යම්කිසි කොටසක් පිළිගැනීමේ බලය කෘෂිකම් අධ්‍යක්ෂක වෙත තබා ගනී.

11. පත් කර ගනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් වැඩය කිරීම සඳහා ලාංකික කම්කරුවන් පමණක් ගත යුතුය. "ලාංකිකයා" යන වචනයේ අර්ථය නම් පරම්පරාවෙන් හෝ ලියා පදිංචි කරවා ගැනීමෙන් හෝ ලංකාවේ පුරවැසියෙක්වූ තැනැත්තෙක් ය යන්නයි.

12. 1934රේ, 19 වැනි අංකය දරණ කම්කරු වන්දි ආඥපනත (117 වැනි පරිච්ඡෙදය) යටතේ තමාගේ සේවකයෙකු හෝ සේවක යෙකු වෙනුවෙන් වන්දි ඉල්ලා එවන ඉල්ලුම් පත්‍ර ගැන වගකීමෙන් කොන්ත්‍රාත්කරුවා ආණ්ඩුව නිදහස් කළ යුතුයි.

13. කොන්ත්‍රාත්කාරයාට බාරදිය යුතු සියළු දැන්වීම් ඔහුගේ අතට දුන්නොත් නැතහොත් ඔහු විසින් සඳහන් කර ඇති ලිපිනයට තැපෑලෙන් යැව්වොත් ඔහු අතටම භාර දුන්නා කොට සැළකිය යුතුයි.

14. වැඩට ගැනීමට නුසුදුසු යයි කල්පනා කරනු ලබන යම්කිසි කම්කරුවෙකු හෝ කොන්ත්‍රාත්කරුවා වැඩට ගැනීම ගැන විරුද්ධ වීමේ හෝ ඕනෑම කම්කරුවෙකු වැඩට ගැනීම ගැන විරුද්ධ වීමේ හෝ බලය ආණ්ඩුවට තබා ගනු ලැබේ.

15. වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ ආණ්ඩුවේ ලැයිස්තුවට තනි තනිව හෝ ඒ ලැයිස්තුවේ නම සඳහන් වෙන කෙනෙකුගේ නම සමඟ හෝ නම ඇතුළත්වූ හෝ තමාට සැහේ යයි පෙනී යන හේතු පිට කෘෂිකම් අධ්‍යක්‍ෂ තැන විරුද්ධ වන හෝ කිසිවකු සමඟ කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නො ලැබේ.

16. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් කරනු ලබන සියළුම මිල ගණන් යටත් පිරිසෙයින් මාස 2 කටවත් වෙනස් නොවන සථිර ඒවා විය යුතුයි.

17. වැඩි විස්තර පේරාදෙණියේ මධ්‍යම පර්යේෂණ ස්ථානයේ කළමනාකාර තැනගෙන් දැන ගත හැක.

18. කළමනාකාර තැනගෙන් අවසරය ඇතිව උදේ 9 සිට සවස 4.30 දක්වා රබර් ගස් පරීක්‍ෂා කළ හැක.

19. තෝරා ගත් ගෙන්ඩර්කරු විසින් සම්පූර්ණ මුදල ගෙවා ටෙන්ඩරය පිළිගෙන මාස තුනක් ඇතුළත රබර් ගස් කපා වත්තෙන් ඉවතට ගෙන යා යුතුය.

ඒ. වී. රිචර්ඩ්ස්,
වැ. බ. කෘෂිකම් අධ්‍යක්‍ෂක.

1960 ජූලි 11 දින, පේරාදෙණියේදීය.

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### කෘෂිකර්ම රසායන ද්‍රව්‍ය සැපයීම

පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, කෘෂිකර්ම අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිවරයා විසින් පහත සඳහන් කෘෂිකර්ම රසායන ද්‍රව්‍ය සැපයීම සඳහා 1960 අගෝස්තු 12 දින පස්වරු 2.30 වන තෙක් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ :—

| | | ගැලුම් |
|---|---|---|
| 1. | පෙන්ටක්ලෝරෝ පිනෝල් 12% ක් අඩංගු පැළෑටි නාශක ද්‍රව්‍ය (ගැලුම් 4–5 ඇසුරු ආපසු නොදෙන පීප්පවල) | 200 |
| 2. | 2, 4-ඩී ඇමයින් සෝල්ට් 50% සිට 60% ක් අඩංගු පැළෑටි නාශක ද්‍රව්‍ය (ගැ. 44–45 ඇසුරු ආපසු නොදෙන පීප්පවල) | 200 |
| 3. | ඩැලැපෝන් 80% (22 ඩයික්ලෝරෝප්‍රෝ පියෝනික් ඇසිඩ් අඩංගු ඇටෝරා තෘණ විනාශකිරීමේ බලයක් ඇති තෝරා ගන්නාලද තෘණ නාශක ද්‍රව්‍ය රා. 50–60 ක් ඇසුරු භාජනවල) ... ... ... | රා. 300 |
| 4. | සිමසීන් 50%ක් අඩංගු වල් පැළෑටි නාශක ද්‍රව්‍ය ... | 56 |

2. පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම අංශයේ පරිපාලන නිලධාරි තැනගෙන් ෆෝර්ම කොළ ලබාගෙන ඒවා පිර වීමෙන් ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙක බැගින් පුරවා අත්සන් තැබිය යුතු අතර ඒවා බහාලන කවරය සිල් තබා "පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වරයා" යන්නෙන් ලිපිනය ලියා එහිම මුදුන් කෙළවරෙහි "කෘෂිකර්ම රසායන ද්‍රව්‍ය සැපයීමේ ටෙන්ඩර් පත්‍රය" යන්න සඳහන් කොට එවිය යුතුයි.

3. ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන් වෙත 1960 අගෝස්තු 12 වැනි දින දවල් 12 වනතෙක් ටෙන්ඩර් ෆෝර්ම නිකුත් කරනු ලැබේ. ඒවා නිකුත් කරන්නේ එක් එක් ටෙන්ඩරයක් වෙනුවෙන් රුපියල් 100ක මුදලක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ පසුවය. මේ මුදල කච්චේරියක හෝ කොළඹ මහා භාණ්ඩාගාරයේ හෝ තැන් පත් කළ යුතුය. පොරොන්දු පත්‍රය අත්සන් කළ පසු මේ මුදල ආපසු දෙනු ලැබේ. තෝරා ගනු ලැබූ ටෙන්ඩර්කරුට ඔහුගේ ටෙන්ඩරය පිළි ගත් බව දන්වා දින 10 ක් තුළදී අවශ්‍ය ඇපය තැබීමට අපොහොසත් වුවහොත් හෝ පොරොන්දු පත්‍රය අත්සන් කිරීමට නොහැකි වුව හොත් හෝ ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක වෙනවාත් හැර ඔහුට විරුද්ධව රජය මගින් ඉදිරිපත් කළ හැකි කවර අන්දමේ හිමිකම් පෑමකට හෝ අයිතියක් නොවන පරිදි ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරි කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වන්නට ඉඩ තිබේ.

4. ටෙන්ඩර් පත්‍ර රෙජිස්ටර් තැපෑලෙන් එවිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර රෙජිස්ටර් තැපෑලෙන් නොඑවන විට ටෙන්ඩර්කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් හෝ විසින් පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්ත මේන්තුවේ කෘෂිකර්ම අංශයේ ටෙන්ඩර් ලිපිකරුට ඒවා අතින්ම භාර දිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර බහාලන ලද කවරයෙහි "කෘෂිකර්ම රසායන ද්‍රව්‍ය සැපයීමේ ටෙන්ඩර්" යන්න ලියා ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනයද සඳහන් කළ යුතුය. රෙජිස්ටර් තැපෑලෙන් එවන ලද ටෙන්ඩර් පත්‍ර ලැබුණු බව ඒවා විවෘත කරන දිනයේදීම සියලු ටෙන්ඩර්කරුවන්ට දන්වනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර භාරගැනීම අවසන් වන දින සිට දින හතරක් ඇතුළත යම් ටෙන්ඩර්කරුවකුට එවැනි දැන්වීමක් නොලැබුණහොත් ඔහු පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්ත මේන්තුවේ කෘෂිකර්ම අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිවරයා ගෙන් ඒ ගැන වහාම කරුණු විමසිය යුතුයි.

5. ටෙන්ඩර්කරුවන්ට වුවමනා නම් ටෙන්ඩර් විවෘත කරන වේලා වේදී ඉදිරියෙහි සිටීමට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් භාරගැනීම අවසන් වන යට කී දිනයේ යටකී වේලාවේදී පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම අංශයේදී ඒවා විවෘත කරනු ලැබේ.

6. නියමිත ෆෝර්මයේ ලියා නැතහොත් එහි නියමිත කොන්දේසි සම්පූර්ණ වශයෙන් ඉටුවී නැති කිසිම ටෙන්ඩර් පත්‍රයක්, ටෙන්ඩර් පත්‍රයක් ලෙස සලකනු නොලැබේ. ටෙන්ඩර් ප්‍රමාණයන් සහ ගණන් පැහැදිලි ලෙස තීන්තෙන්. ලකුණු කළ යුතුවාත් හැර ඒවා සම්බන්ධ යෙන් යම්කිසි වෙනසක් කළහොත් ඒ තැන්වල ටෙන්ඩර්කරුවාගේ කෙටි අත්සන තැබිය යුතු ද වේ.

7. ටෙන්ඩර්කරුවන් තම ලිපිනය පැහැදිලි අකුරින් ටෙන්ඩර් පත්‍ර යෙහි ලිවිය යුතුයි.

8. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් වූද පිළිගනු ලැබුවාවූද දේවල මුළු වියදමෙන් සියයට පහක ඇප මුදලක් කෘෂිකර්ම අධ්‍යක්ෂ තැනගේ නමින් තැන්පත් කිරීමටත් පොරොන්දු පත්‍රයක් අත්සන් කිරීමටත් තෝරාගනු ලැබූ ටෙන්ඩර්කරුවාට නියම කරනු ලැබේ. මේ මුදල ආපසු දෙන්නේ මේ කොන්ත්‍රාත්තුව නිසි පරිදි ඉටු කොට තුන්මසක් ගතවූ විට පමණකි. ඒ ද ඒ කාල සීමාව තුළ කිසියම් පීඩාවක් නොලදහොත් පමණකි. තෝරාගනු ලැබූ ටෙන්ඩර්කරුවා මේ කොන්ත්‍රාත්තුව ඉටු නොකළහොත් ඔහුගේ ඇප මුදල රාජසන්තක වනවා පමණක් නොව ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරි කොන්ත්‍රාත්කරුවන්ගේ නම් ලැයිස්තුවට ඇතුළත් වෙනවා ද ඇත.

නාරාහේන්පිට කෘෂිකර්ම මධ්‍ය ගබඩා භාර සම්බන්ධතා නිලධාරි තැනට මෙම කෘෂිකර්ම රසායන ද්‍රව්‍ය, ටෙන්ඩරය පිළිගෙන දින 21ක් ඇතුළතදී සැපයිය යුතුය. මෙම කාලය තුළදී සැපයීම් කළ නොහැකි වුවහොත් දිනකට රු. 10 බැගින් කොන්ත්‍රාත්කරු විසින් අලාභයක් ගෙවිය යුතුයි.

9. පොරොන්දු පත්‍රයට හා/හෝ බැඳුම්කරයට ඇලවිය යුතු මුද්දරවල වටිනාකම පත්කරනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින් ගෙවිය යුතුය.

10. ටෙන්ඩර් පත්‍රයෙහි සඳහන් කරන සියලුම මිළ ගණන් යටත් පිරිසෙයින් සති 6කටවත් වෙනස් නොවන ස්ථිර මිළ ගණන් විය යුතුය.

11. යම්කිසි ටෙන්ඩර් පත්‍රයක් හෝ සියලුම ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කිරීමේත්, කිසියම් ටෙන්ඩරයක කොටසක් පිළිගැනීමේත් බලය රජය වෙත තබාගනු ලැබේ.

12. කොන්ත්‍රාත්කාරයාට භාරදිය යුතු සියලුම දැන්වීම් ඔහුගේ අතට දුනහොත් හෝ ඔහු විසින් සඳහන් කර ඇති ලිපිනයට තැපෑලෙන් යැව්වහොත් හෝ ඔහු විසින් සඳහන් ලිපියෙහි සඳහන් ස්ථානයෙහි තැබුවහොත් ඒවා ඔහු අතටම භාරදුන්නා සේ සලකනු ලැබේ.

13. කෘෂිකර්ම අධ්‍යක්ෂවරයාට අවශ්‍ය යයි හැඟෙන්නේ නම් තෝරා ගත හැකි ටෙන්ඩර්කරුවන් විසින් ඇපකරුවෙකු හෝ ඊට වැඩි දෙනෙකු ඉදිරිපත් කිරීමටත් කොන්ත්‍රාත්කරුගේ වියදමින් ඒ අයට බැඳුම්කරයකට ඇතුළත් වීමටත් අවශ්‍ය වනවා ඇත. තෝරාගනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින් නම් කරනු ලැබූ ඇපකරුවන් සඳහා කෘෂිකර්ම අධ්‍යක්ෂවරයාගේ අනුමැතිය ලැබිය යුතුය.

14. වැඩ පැහැර හරින කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ ආණ්ඩුවේ ලැයිස්තුවට තනි තනිව හෝ ඒ ලැයිස්තුවේ නම සඳහන් වෙන අයෙකුගේ නම සමග හෝ නම ඇතුළත්ව හෝ තමාට සෑහේ යයි පෙනී යන හේතු පිට කෘෂිකර්ම අධ්‍යක්ෂවරයා විරුද්ධ වන හෝ කිසිවකු සමග කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නොලැබේ.

15. කොන්ත්‍රාත්තුවේ කොන්දේසි කඩකරන විට එම කොන්ත්‍රාත්තුව අවලංගු කිරීමේ අයිතිවාසිකම් කෘෂිකර්ම අධ්‍යක්ෂවරයාට හිමිය.

16. වැඩි විස්තර පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම අංශයේ පරිපාලන නිලධාරි තැනගෙන් ලබාගත හැකිය. ඔහුට යවන ලියකියවිලි ඔහුගේ පෞද්ගලික නමට නොව රාජකාරිය පිළිබඳ නිලතලය සඳහන් කොට යැවිය යුතුය.

ඒ. වී. රිචඩ්ස්,
වැඩ බලන කෘෂිකර්ම අධ්‍යක්ෂ.

1960 ජූලි 15 වැනි දින,
පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේදී ය.

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### වීරපාන රජයේ ගොවිපළට ගඩොල් 20,000ක් සැපයීම සහ ගෙන ගොස් භාරදීම

මාතර දිස්ත්‍රික් කෘෂිකර්ම ව්‍යාප්ත හා නිෂ්පාදන නිලධාරි තැන විසින් වීරපාන රජයේ ගොවිපළට ගඩොල් 20,000 සැපයීමට සහ ගෙන ගොස් භාර දීමට ටෙන්ඩර් පත්‍ර 1960 අගෝස්තු මස 12 වන දින පෙරවරු 2.30 වන තෙක් භාරගනු ලැබේ.

2. ෆෝර්ම කොළ මාතර දිස්ත්‍රික් කෘෂිකර්ම ව්‍යාප්ත හා නිෂ්පාදන නිලධාරි තැනගෙන් ලබාගෙන ඒවායේ ටෙන්ඩර් පත්‍ර අනු පිට පතක්ද සහිතව ලියුම් කවරයක බහා සීල් තබා "දිස්ත්‍රික් කෘෂිකර්ම ව්‍යාප්ත හා නිෂ්පාදන නිලධාරි තැන, කෘෂිකර්ම කාර්යාලය, මාතර" යන්න ලියා එහිම මුදුන් වම් කොනේ "වීරපානට ගඩොල් සැපයීම" යන්න ලියා, මාතර කෘෂිකර්ම ව්‍යාප්ත හා නිෂ්පාදන නිලධාරි තැන වෙත එවිය යුතුයි.

3. ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දින දවල් 12 වන තෙක් ටෙන්ඩර් ෆෝර්ම දෙනු ලැබේ. ඒ දීම කරන්නේ එක් එක් ටෙන්ඩර් පත්‍රයක් වෙනුවෙන් රුපියල් 10ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ පසුවය. මේ තැන්පත් කිරීම, කච්චේරියක හෝ මහා භාණ්ඩාගාරයේ හෝ කළ යුතුයි. පොරොන්දු පත්‍රය අත්සන් කළ පසු ටෙන්ඩර් තැන්පත් මුදල ආපසු දෙනු ලැබේ. පත්කර ගනු ලැබූ ටෙන්ඩර්කරුවාට ඔහුගේ ටෙන්ඩර් පත්‍රය පිළිගත් බව දන්වා දින 10ක් ඇතුළත අවශ්‍ය ඇපය තැබීමට හෝ පොරොන්දු පත්‍රය අත්සන් කිරීමට හෝ නොහැකි වුවහොත් ඔහුගේ ටෙන්ඩර් තැන් පත් මුදල රාජසන්තක වෙනවාත් හැර ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වෙන්නට ඉඩ තිබේ.

4. ටෙන්ඩර් පත්‍ර රිජිස්ටර් තැපෑලෙන් එවිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර රිජිස්ටර් තැපෑලෙන් නොඑවුවහොත් ටෙන්ඩර්කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයින් හෝ විසින් මාතර දිස්ත්‍රික්කයේ කෘෂිකර්ම ව්‍යාප්ත හා නිෂ්පාදන නිලධාරි තැනට ඒවා අතින්ම භාර දිය යුතුයි. රිජිස්ටර් තැපෑලෙන් එවන ලද ටෙන්ඩර් පත්‍ර ලැබුණු බව ඒවා විවෘත කරන දිනයේම දන්වනු ලැබේ. යම් ටෙන්ඩර්කරුවෙක් විසින් එවැනි දැන්වීමක් ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීමට නියමව තිබූ දින සිට දින 4ක් ඇතුළත නොලැබුනේ නම් ඒ ගැන මාතර කෘෂිකර්ම ව්‍යාප්ත හා නිෂ්පාදන නිලධාරි තැනගෙන් වහාම විමසිය යුතුයි.

5. ටෙන්ඩර්කරුවන්ට වුවමනා නම් ටෙන්ඩර් පත්‍ර විවෘත කරන වේලාවේදී ඉදිරිපත් පෙනී සිටීමට ඉඩ දෙනු ලැබේ. ඉහත කියන ලද ටෙන්ඩර් භාර ගැනීම නැවැත්වීමට නියමිත දිනයේ එකී වේලාවේදී මාතර කෘෂිකර්ම කායනීලයේදී ඒවා විවෘත කරනු ලැබේ.

6. නියමිත පෝරමයේ ලියා නැති හෝ එහි නියමිත කොන්දේසි සම්පූර්ණ වශයෙන් ඉටුවී නැති හෝ කිසිම ටෙන්ඩර් පත්‍රයක් ටෙන්ඩර් පත්‍රයක් ලෙස සලකනු නොලැබේ. ටෙන්ඩර් ප්‍රමාණයන් සහ ගණන් පැහැදිලි ලෙස තීන්තෙන් ලකුණු කළ යුතුවාත් හැර ඒවා සම්බන්ධයෙන් යම්කිසි වෙනසක් කළහොත් ඒ ඒ තැන්වල ටෙන්ඩර් කරුවාගේ කෙටි අත්සන තැබිය යුතු ද වේ.

7. ටෙන්ඩර්කරුවන් විසින් තම ලිපිනය පැහැදිලි අකුරෙන් ටෙන්ඩර් පත්‍රයෙහි ලිවිය යුතුයි.

8. ටෙන්ඩර් පත්‍රයෙහි සඳහන් වූද, පිළිගනු ලැබුවාවූද දේවල් මුළු වියදමෙන් සියයට 5ක ඇප මුදලක් කෘෂිකර්ම අධ්‍යක්ෂක තුමාගේ නමින් තැන්පත් කිරීමටත් පොරොන්දු පත්‍රයක් අත්සන් කිරීම ටත් පත්කර ගනු ලැබූ ටෙන්ඩර්කරුවාට නියම කරනු ලැබේ. මෙම මුදල ආපසු දෙනු ලබන්නේ යථෝක්ත කොන්ත්‍රාත්තුව නිසි පරිදි ඉටුකොට නිමවූ විට පමණකි. පත්කර ගනු ලැබූ ටෙන්ඩර්කරුවා මෙම කොන්ත්‍රාත්තුව ඉටු නොකළහොත් ඔහුගේ ඇප මුදල රාජ සන්තක වෙනවා පමණක් නොව ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වෙනවා ද ඇත.

9. පොරොන්දු පත්‍රයට ඇලවිය යුතු මුද්දරවල වටිනාකම පත්කර ගනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින්ම ගෙවිය යුතුයි.

10. ටෙන්ඩර් පත්‍රයෙහි සඳහන් කරන සියලුම මිළ ගණන් යටත් පිරිසෙයින් සති 3කට වත් වෙනස් නොවන සේථිර ඒවා විය යුතුයි.

11. යම්කිසි ටෙන්ඩර් පත්‍රයක් හෝ සියලුම ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂෙප කිරීමේත් ටෙන්ඩර් පත්‍රයක යම්කිසි කොටසක් පිළි ගැනීමේත් බලය කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙත තබා ගනී.

12. පත්කර ගනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් වැඩය කිරීම සඳහා ලාංකික කම්කරුවන් පමණක් ගත යුතුයි. "ලාංකිකයා" යන වචනයේ අර්ථය නම් පරම්පරාවෙන් හෝ ලියා පදිංචි කරවා ගැනීමෙන් හෝ ලංකාවේ පුරවැසියෙක් වූ තැනැත්තෙක්ය යන්නයි.

13. කොන්ත්‍රාත්කාරයාට බාරදිය යුතු සියලු දැන්වීම් ඔහුගේ අතට දුන්නොත් හෝ ඔහු විසින් සපයන ලද ලිපිනයට තැපෑලෙන් යැවුවොත් හෝ ඔහු අතටම භාරදුන්නා කොට සැලකිය යුතුයි.

14. 1934ජේ අංක 19ය දරණ කම්කරු වන්දි ආඥාපනත (117 වැනි පරිච්ඡේදය) යටතේ තමාගේ යම්කිසි සේවකයෙකු විසින් හෝ සේවකයකු වෙනුවෙන් වන්දි ඉල්ලා එවන ඉල්ලුම් පත්‍ර ගැන වග කීමෙන් කොන්ත්‍රාත්කරුවා ආණ්ඩුව නිදහස් කළ යුතුයි.

15. වැඩට ගැනීමට නුසුදුසුයයි කල්පනා කරනු ලබන යම්කිසි කම් කරුවකු කොන්ත්‍රාත්කරුවා විසින් වැඩට ගැනීම ගැන විරුද්ධවීමේ හෝ ඕනෑම කම්කරුවෙකු වැඩට ගැනීම ගැන විරුද්ධවීමේ හෝ බලය ආණ්ඩුව වෙත තබා ගනු ලැබේ.

16. වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ ආණ්ඩුවේ ලැයිස්තුවට තනි තනිව හෝ ඒ ලැයිස්තුවේ නම සඳහන් වෙන කෙනෙකුගේ නම සමග හෝ නම ඇතුළත් වූ හෝ තමාට සැහේයයි පෙනීයන හේතු පිට කෘෂිකර්ම අධ්‍යක්ෂ තුමා විරුද්ධත්වය පළකරන හෝ කිසිවෙකු සමග කොන්ත්‍රාත්තුවට බැඳෙනු නොලැබේ.

17. වැඩි විස්තර මාතර දිස්ත්‍රික් කෘෂිකර්ම ව්‍යාප්ත හා නිෂ්පාදන නිලධාරි තැනගෙන් දැනගත හැක.

ඒ. වී. රිචර්ඩ්ස්,
වැඩ බලන කෘෂිකර්ම අධ්‍යක්ෂක.

1960 ජූ මස 14 දින,
පේරාදෙනියේ දීය.

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### ගොවිපළවලට සත්ව ආහාර සැපයීම

පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් රජයේ ගව මධ්‍යස්ථාන හා කෘෂිකර්ම ගොවිපළවලට පහත සඳහන් සත්ව ආහාර සැපයීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර, කොළඹ මහලේකම් කායනීලයේ තැ. පෙ. 500, කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් 1960 අගෝස්තු මස 19 වැනි දින පස්වරු 2.30 වන තෙක් භාරගනු ලැබේ :—

| සත්ව ආහාර | හය මාසයකට උවමනා කරන සාමාන්‍ය ප්‍රමාණය හොණ්ඩර |
|---|---|
| තල පුන්නක්කු ... ... ... ... ... | 500 |
| මාළුවන්ගෙන් සාදන කෑම ... ... ... ... | 1,800 |
| සුදු ඕස්ට්‍රේලියානු ඕට්ස් ... ... ... ... | 60 |
| ඉරිඟු කුඩු ... ... ... ... ... | 700 |
| තිරිඟු පරළු ... ... ... ... ... | 23 |
| විෂබීජ නැතිකළ ඇට කුඩු ... ... ... ... | 200 |
| ඛනිජ මිශ්‍රණය ... ... ... ... ... | 600 |
| කඩල ... ... ... ... ... | 50 |
| වියලි බීරමල් ... ... ... ... ... | 33 |

2. ඉහත සඳහන් වන්නේ 1960 ඔක්තෝබර් 1 වැනි දින සිට හය මාසයක් තුළ උවමනා කරන ප්‍රමාණයන් ය.

3. සත්ව ආහාර හොඳ තත්ත්වයක තිබීමත් හැර පහත සඳහන් විශෙෂ ලක්ෂණයන් ද තිබිය යුතු ය :—

| සත්ව ආහාර | අදහස් කරන ලද විස්තර | සහතික කළ සංයෝගය | |
|---|---|---|---|
| තල පුන්නක්කු ... | වෙළඳාමට ගතහැකි පිරිසිදු තල ඇට වලින් තෙල් ඉවත් කිරීමෙන් ලබාගන්නකි. | මාංශජනක ධාතු 42–45%, තෙතමනය 10% | පිටස්තර දේ නො තිබිය යුතු යි. |
| මාළුවන්ගෙන් සාදන කෑම ... | කුණු නොවන ලද මාළුවන් සහ වැඩකට ගත නොහැකි මාළුවන්ගේ කොටස් වියලීමෙන් සහ ඇඹරීමෙන් සාද ගන්නකි | මාංශජනක ධාතු 50–55%, ළුනු 4% නොවැඩි, තෙතමනය 10% නොවැඩි | පිටස්තර දේ සහ ගෙන්දගම් නොතිබිය යුතුයි. |
| කපු ඇට ... | කපු ඇට ... | මාංශ ජනක ධාතු 22–23%, තෙතමනය 12% නොවැඩි | පිටස්තර දේ නො තිබිය යුතු සහ සතුන් විසින් නොවිදින ලද |
| සුදු ඕස්ට්‍රේලියානු ඕට්ස් ... | ඇට හෝ කුඩු කරන ලද ... | මාංශජනක ධාතු 9–10%, තෙතමනය 12% නොවැඩි | එම |
| ඉරිඟු කුඩු ... | — ... | මාංශජනක ධාතු 10% නො අඩු, තෙතමනය 10% නොවැඩි | පිටස්තර දේ නොතිබිය යුතුයි. |
| තිරිඟු පරළු ... | — ... | මාංශජනක ධාතු 17% නො අඩු, තෙතමනය 10% නොවැඩි | එම |
| විෂබීජ නැතිකළ ඇට කුඩු ... | වෙළඳාමට ගතහැකි පිරිසිදු ඇටකටු තම්බා කුඩු කිරීමෙන් සාද ගන්නකි. ඇන්ත්‍රැක්ස් ක්ෂුද්‍ර බීජ නැති බවට සහතික කළ යුතුයි. | පී 2 ඕ 5, 30–35% | එම |
| ඛනිජ මිශ්‍රණය ... | — ... | කැල්සියම් 20–22%, ප්‍රභාශ ද 5.5%-6.5%, සෝඩියම් 11.5%-12.5%, ක්ලෝරින් 18–20%, යකඩ 1–2% | මැන්ගනීස් තඹ, කොබෝල් අයිඩීන්වල මූලික ධාතු සාමාන්‍යයෙන් තිබිය යුතුයි. |
| කඩල ... | කඩල ... | මාංශජනක ධාතු 22–23%, තෙතමනය 12% නොවැඩි | පිටස්තර දේද නොතිබෙන සතුන් විසින් නොවිදින ලද |
| වියලි බීරමල් ... | බීර සෑදීමේදී ලබා ගන්නා බීර මල් ... | මාංශජනක ධාතු 49% නො අඩු, තෙතමනය 10% නොවැඩි | — |

7. අයදුම්කරුවන් විසින් තැන්පත් කළ මුදලට ලබාගත් කුවිතාන්සි ටෙන්ඩර පත්‍ර නිකුත් කෙරෙන අවසාන දින දවල් 12 ට පෙර ඉදිරිපත් කර අවශ්‍ය පෝර්ම ලබාගත යුතුයි. තැපෑලෙන් ටෙන්ඩර පෝර්ම ඉල්ලුම් කරන අය මුදල් තැන්පත් කළ කුවිතාන්සි කල් වේලා ඇතිව එවීමෙන් අවසාන දිනයට ප්‍රථම ටෙන්ඩර එවීම සඳහා පෝර්ම ලබාගත හැකිය.

8. සෑම ටෙන්ඩරයක්ම කොළඹ, ගාලුමුවදොර, මහලේකම් කාර්යාලය යාබද "බී" අක්ෂරය දරන ගොඩනැගිල්ලේ පිහිටි, සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ මුදල් අංශයේ තැ. පෙ. 584 සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක තැනගේ නමට එවිය යුතුයි. සීල් තැබූ ටෙන්ඩර පත්‍රය එවන කවරයේ වම්පස උඩ කෙළවරේ, එය කුමණ සේවාවක් සඳහා ද යන්න ඇතුළු ටෙන්ඩරකරුගේ නම සහ ලිපිනයත් සඳහන් කළ යුතුයි. ටෙන්ඩර පෝර්ම මෙම කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර පෙට්ටියට දැමීමෙන් හෝ කොන්ත්‍රාත් සහ සැපයීම පිළිබඳ ගණකාධිකාරීවරයාට පුද්ගලිකව භාර දී එය ලැබුණු බවට කුවිතාන්සියක් ද ලබා ගත යුතුයි. ටෙන්ඩර්කරුවන්ට සිය ටෙන්ඩර පත් ලියාපදිංචි කළ තැපෑලෙන් ද එවිය හැකිය. ටෙන්ඩර පත් භාරගන්නා අවසාන දින පෙරවරු 10 ට පසු තැපෑලෙන් හෝ පැමිණ භාරදෙන සෑම ටෙන්ඩරයක්ම ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

9. මෙම දෙපාර්තමේන්තුවේ දැනට කොන්ත්‍රාත්තුවක් නොදරන අය ටෙන්ඩර පත්‍ර ඉල්ලා එවීමට පෙර, තමතමන්ගේ වටිනාකම් පිළිබඳ තොරතුරු මා වෙත හෝ ඒවා ලබාගැනීමට බලාපොරොත්තු වන සෞඛ්‍ය සේවා අධිකාරීන් වෙත දැන්විය යුතුය. මේ සඳහා අවශ්‍ය පෝර්ම මගෙන් හෝ සෞඛ්‍ය සේවා අධිකාරීන්ගේ කාර්යාල වලින් ලබාගත හැක. දැනට මෙම දෙපාර්තමේන්තුවේ කොන්ත්‍රාත්තු දරන අයදුම්කරුවන් ඒ බව සඳහන් කළ යුතුය.

**සැ. යු.**—ටෙන්ඩරකරුවන්ගේ මුදල් තත්ත්වයේ ස්ථිර භාවය පිළිබඳ තොරතුරු දැනගැනීමට ප්‍රථම ඔවුන් විසින් එවන ලද ටෙන්ඩර ගැන තීරණයක් කළ නොහැකි බැවින් තම තමන්ගේ වටිනාකම් පිළිබඳ තොරතුරු කල්වේලා ඇතිව ඉදිරිපත් කළ යුතුයි.

10. පසුගිය වර්ෂය තුළ සැපයූ සාමාන්‍ය ආහාර ප්‍රමාණය එම ආයතනයේ වෛද්‍ය නිලධාරී තැනගෙන් දැනගත හැක. පසුගිය වර්ෂය තුළ සැපයූ ආහාර ප්‍රමාණය හෝ ඊට ආසන්න ප්‍රමාණයක හෝ සපයවා ගැනීමට රජයෙන් ඇණවුමක් ලැබීමට හෝ නොලැබීමට ඉඩ තිබේ. ආයතනය මගින් ඉල්ලුම් කරන ප්‍රමාණය ටෙන්ඩරකරුවන් සැපයිය යුතුයි.

11. ටෙන්ඩරය පිළිබඳ කොන්දේසි ටෙන්ඩර පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩරයක් ඉල්ලුම්කරන විට එහි අඩංගු කොන්දේසි දැනගත යුතුවාක් මෙන් ඒවා පිළිපැදිය යුතුද වන්නේ ය.

ඇස්. ඥානසේගරම්,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක වෙනුවට.

සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ මුදල් අංශය,
තැ. පෙ. 584, කොළඹ.
16.7.1960.

## උපලේඛනය

| (1) ආයතනයේ නම | (2) ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල | (3) ඇප මුදල | (4) ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය හා වේලාව |
|---|---|---|---|
| | රු. | රු. | |
| මානසිකාරෝග්‍යශාලාව, පැලවත්ත ... | 100 | ... 300 | 16.8.60 පෙරවරු 10 ට |
| පිඹුර ආරෝග්‍යශාලාව ... | 100 | ... 400 | |
| හම්බන්තොට ආරෝග්‍යශාලාව ... | 100 | ... 400 | |
| මොරවක ආරෝග්‍යශාලාව සහ මාතෘ නිවාසය ... ... | 100 | ... 200 | |
| කෑගල්ල ආරෝග්‍යශාලාව ... | 100 | ... 300 | |
| වලස්මුල්ල ආරෝග්‍යශාලාව ... | 100 | ... 600 | |
| බගවන්තලාව ආරෝග්‍යශාලාව ... | 100 | ... 300 | |
| කඩුගන්නාව ග්‍රාමීය ආරෝග්‍යශාලාව ... | 100 | ... 200 | |
| බුත්තල ආරෝග්‍යශාලාව ... | 100 | ... 300 | |
| කොස්ලන්ද ආරෝග්‍යශාලාව ... | 100 | ... 300 | |
| මතුරට ආරෝග්‍යශාලාව ... | 100 | ... 300 | |
| මොනරාගල ආරෝග්‍යශාලාව ... | 100 | ... 200 | |
| රම්බොඩ ආරෝග්‍යශාලාව ... | 100 | ... 300 | |
| රිකිලිගස්කඩ ග්‍රාමීය ආරෝග්‍යශාලාව ... | 100 | ... 200 | |
| උඩපුස්සැල්ලාව ආරෝග්‍යශාලාව ... | 100 | ... 300 | |
| මිහින්තලේ ආරෝග්‍යශාලාව ... | 100 | ... 200 | |
| හිරිපිටිය ග්‍රාමීය ආරෝග්‍යශාලාව සහ මාතෘ නිවාසය ... ... | 100 | ... 200 | |
| මාහෝ ග්‍රාමීය ආරෝග්‍යශාලාව සහ මාතෘ නිවාසය ... ... | 100 | ... 200 | |
| මුවන්පොල ග්‍රාමීය ආරෝග්‍යශාලාව ... | 100 | ... 200 | |
| අරණායක ආරෝග්‍යශාලාව ... | 100 | ... 300 | |
| දැරණියගල ආරෝග්‍යශාලාව ... | 100 | ... 200 | |
| කිතුල්ගල ආරෝග්‍යශාලාව ... | 100 | ... 300 | |
| කළවාන ග්‍රාමීය ආරෝග්‍යශාලාව ... | 100 | ... 200 | |
| කොළොන්න ආරෝග්‍යශාලාව ... | 100 | ... 300 | |

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

1960 ජූලි මස 8 වැනි දින අංක 12,156 දරන රජයේ ගැසට් පත්‍රයේ සඳහන්ව තිබූ පහත සඳහන් ආයතනයන්ට ආහාර සැපයීමේ ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දිනය පහත සඳහන් දින දක්වා දීර්ඝකළ බව මෙයින් දන්වමි.

| ආයතනය | ටෙන්ඩර් පත් භාරගන්නා අවසාන දිනය සහ වේලාව |
|---|---|
| උඩුගම ආරෝග්‍යශාලාව<br>වීරවිල ලය රෝහල ... | 16.8.1960 වැනි දින පෙරවරු 10 ට |
| නෑබොඩ ආරෝග්‍යශාලාව<br>පිඹුර ආරෝග්‍යශාලාව ...<br>වලස්මුල්ල ආරෝග්‍යශාලාව<br>මිහින්තලේ ආරෝග්‍යශාලාව | 18.8.1960 පෙරවරු 10 ට |

ඇස්. ඥානසේගරම්,
සෞඛ්‍ය අධ්‍යක්ෂ වෙනුවට.

1960 ජූනි මස 16 වැනි දින,
සෞඛ්‍ය දෙපාර්තමේන්තුව,
කොළඹ.

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### ජාතික කිරි ව්‍යාපාරය—පිරිසිදු එළකිරි එහා මෙහා ගෙනයාම

වර්ෂ 1960 ඔක්තෝබර් මස 1 වෙනිදා සිට 1961 සැප්තැම්බර් මස 30 වෙනිදා දක්වා (දෙදින ඇතුළුව) කාලය තුළ මේ සමග ඇති උපලේඛනයෙහි පළමුවන තීරයෙහි සඳහන් වන, ආයතනයන්ට, දුම්රිය ස්ථානවල/සෞඛ්‍ය කාර්යාලවල/ආණ්ඩුවේ කොව්පළවල සිට කිරි මධ්‍යස්ථානවලට පිරිසිදු එළකිරි ගෙනයාම සඳහා ලාංකිකයන්ගෙන් සහ ලාංකික වෙළඳ සමාගම් විසින් එවනු ලබන සීල් තැබූ ටෙන්ඩර් පත්‍ර, කොළඹ, ගාලු මුවදොර, මහාලේකම් කාර්යාලය යාබද "බී" අක්ෂරය දරණ ගොඩනැගිල්ලේ පිහිටි, සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ මුදල් අංශයේදී සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ තැන විසින් භාරගනු ලැබේ.

2. (i) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—මෙහි උපලේඛනයෙහි දෙවන ජේදයෙහි සඳහන් පරිදි, රු. 100 ක තැන්පත් මුදලක්, මා නමට කොළඹ හැර අනිකුත් කච්චේරියක හෝ කොළඹ බ්‍රිස්ටල් වීදියේ ඇති ලංකා බැංකුවේ හෝ තැන්පත් කොට කුවිතාන්සියක් ලබා ගත යුතුයි.

**සැ. යු.**—කොළඹ ලංකා බැංකුවේ මුදල් තැන්පත් කිරීම සඳහා වුවමනා පෝර්ම මෙම කායසීලයෙන් ලබාගත හැක.

(ii) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වන තුරු මෙම කායසීලයෙන් හෝ අනුරාධපුරය, බදුල්ල, මඩකළපුව, කොළඹ, ගාල්ල, යාපනය, කළුතර, නුවර කෑගල්ල, කුරුණෑගල, මාතර, මාතලේ, පුත්තලම, රත්නපුරය සහ වවුනියාව යන තැන්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරීවරුන්ගේ කායසීල වලින් හෝ ලබාගත හැක. නියමිත පෝර්මයේ නො වන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නො ලැබේ. ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේ දී මුදල් තැන්පත් කළ බවට ගන්නා ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුයි. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පෝර්ම ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි පෝර්ම සඳහා තැපැලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම් පත්‍ර වේලාසනින් එවිය යුතුයි.

3. **වත්කමේ විස්තර.**—මෙම දෙපාර්තමේන්තුවේ දැනට කොන්ත්‍රාත්තුවක් නො දරණ අය ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ සැළකිය යුතු කාලයකට පළමු තම වත්කම මට හෝ තමා ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරීන්ට හෝ දැන්විය යුතුයි. මේ සඳහා වුවමනා පෝර්ම ඉහත

පෙනෙන දෙවන ඡේදයේ සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නො හැකිවීම හෝ මූදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරන ලෙස දන්වූ විට එසේ කිරීමට අපොහොසත් වූවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමිවන්නට ඉඩ තිබේ.

**4. ප්‍රමාණයන්.**—සැපයිය යුතු ආහාර ප්‍රමාණයන් දළ වශයෙන් දැන ගැනීමට, මේ සමග ඇති උප්ලේඛනයෙහි 3 වැනි තීරය බලන්න.

**5. ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියළුම ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා "සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ 'බී' අක්ෂරය දරණ ගොඩනැගිල්ල, මුදල් අංශය, මහලේකම් කාර්යාලයය, ගාලු මුවදොර, කොළඹ" කියා එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම් පස උඩ කෙළවරේ එය කවර සේවාවක් සඳහාද යන්න පැහැදිලිව සඳහන් කළ යුතුවාක් මෙන්ම, එහි වම් පස පහත කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුයි. කවරයෙහි බහන ලද ටෙන්ඩර් පත් මෙම කායඞාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ තමාම ගණකාධිකාරී මහතාට (සැපයීම සහ කොන්ත්‍රාත්) දීමෙන් ඒ ලැබුණු බවට ඔහු විසින් නිකුත් කරනු ලබන කුවිතාන්සියක් ගැනීමෙන් හෝ ලියා පදිංචි තැපෑලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක.

**6. ටෙන්ඩර් පත් භාර ගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 4 වන තීරයේ සඳහන් දිනයන්හි පෙරවරු 10 ට ටෙන්ඩර් පත් භාර ගැනීමට අවසන් වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ.

**7. ටෙන්ඩර් පත් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කිරීම කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර් කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිල ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියෙහි කියවනු ලැබේ. ඕනෑම ටෙන්ඩර් කරුවකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇති වූවහොත් ඒ සැකය දුරු කර ගැනීමට මා සමග කටයුතු පිළියෙල කර ගැනීම හෝ ම විසින් බලය පවරනු ලැබ නියෝජිතයකුගේ අනුමැතිය ඇතිව හෝ ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

**8. ටෙන්ඩරයෙහි සඳහන් කරන ලද මිල ගණන් වලංගු කාල සීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිල ගණන් මෙහි පළමුවන ඡේදයේ සඳහන් කාල සීමාව ඉකුත් වනතුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂ අවසරයක් නො වේ නම් එහි සඳහන් මිල ගණන් මොනම හේතුවක් නිසා හෝ එම කාලය තුල වෙනස් කිරීමට ඉඩ දෙනු නො ලැබේ.

**9. තැන්පත් මුදල්.**—තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි 3 වන තීරයෙහි සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

**10. ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර් කරුවකු වීමට බලාපොරොත්තු වන්නන්, එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාක් හැර පිළිපැදිය යුතු ද වන්නේ ය.

**11. වෙනත් විස්තර.**—තවදුරටත් විස්තර දැනගැනීම සඳහා මෙහි දෙවන ඡේදයෙහි සඳහන් කුමන කාර්යාලයකින් හෝ ඉල්ලුම් පත්‍රයක් මගින් පුළුවන.

එස්. ඥානසේගරම්,
සෞඛ්‍යසේවා අධ්‍යක්ෂ වෙනුවට.

සෞඛ්‍යසේවා දෙපාර්තමේන්තුව,
මුදල් අංශය, ගාලුමුවදොර,
මහලේකම් කායඞාලය,
කොළඹ, 1960 ජූලි මස 18.

## උපලේඛනය

| (1) සේවය | (2) ප්‍රදේශය | (3) යැවිය හැකි ප්‍රමාණය කිටවූ වශයෙන් | (4) අවසන් දිනය |
|---|---|---|---|
| **යාපනේ කොට්ඨාශය** | | | |
| වාවාකච්චේරිය සෞඛ්‍ය කාර්යාලයේ සිට වාවාකච්චේරිය සෞඛ්‍ය කායඞාලය භාර නිලධාරිතැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථානවලට ... | වාවාකච්චේරිය ... | 5,511 | 17.8.60 |
| පොයින්ට් පේද්‍රු සෞඛ්‍ය කායඞාලයේ සිට පොයින්ට් පේද්‍රුවේ සෞඛ්‍ය කායඞාලය භාර නිලධාරිතැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථානවලට ... | පොයින්ට්පේද්‍රු ... | 10,850 | 17.8.60 |
| තෙලිපලෙයි සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතැනගේ කායඞාලයේ සිට තෙලිපලෙයි සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථානවලට ... | තෙලිපලෙයි ... | 6,758 | 17.8.60 |
| **මාතලේ කොට්ඨාශය** | | | |
| මාතලේ දුම්රිය ස්ථානයේ සිට මාතලේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතැනගේ කායඞාලයට, මාතලේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි තැනගේ කායඞාලයේ සිට මාතලේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි-තැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථාන-වලට ... | මාතලේ ... | 5,610 | 17.8.60 |
| මාතලේ දුම්රිය ස්ථානයේ සිට රත්තොට සෞඛ්‍ය කායඞාලයට, රත්තොට සෞඛ්‍ය කායඞාලයේ සිට රත්තොට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථානවලට ... | රත්තොට ... | 2,220 | 17.8.60 |
| පොළොන්නරුවේ සතුන් ඇති කරන ගොවිපලේ සිට පොළොන්නරුවේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතැනගේ කායඞාලයට, පොළොන් නරුවේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතැනගේ කායඞාලයේ සිට පොළොන්නරුවේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි තැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථාන වලට ... | පොළොන්නරුව | 7,000 | 17.8.60 |

---

## ජල සම්පාදන යෝජනා ක්‍රම—කැකිරාව සහ කරවෙඩ්ඩි

කැකිරාව සහ කරවෙඩ්ඩි නගර සඳහා වූ නල මගින් ජලය සැපයීමේ යෝජනා ක්‍රම පිහිටුවීම පිළිබඳව ටෙන්ඩර් ඉල්ලුම් පත්‍ර කැඳවමින් 1960 ජූනි මස 24 වැනි දින දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරන්නට යෙදුන නිවේදනය ගැන තවදුරටත් දන්වා සිටින වගයි. මේ ජල සම්පාදන යෝජනා ක්‍රම සඳහා ටෙන්ඩර් ඉල්ලුම් පත්‍ර නිකුත් කිරීම පිණිස අවශ්‍ය ලියා පදිංචි කිරීමේ සීමාව රු. 1,50,000ක් හා ඊට වැඩි මුදලක් විය යුතු බවට සංශෝධනය කර ඉල්ලන බවත්, ටෙන්ඩර් ඉල්ලුම් පත්‍ර නිකුත් කිරීමේ අවසාන දිනයත් ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනයත් පිළිවෙලින් 1960 වේ අගෝස්තු මස 8 වැනි දින දක්වා හා 1960 අගෝස්තු මස 17 වැනි දින දක්වා ද දීර්ඝ කරනු ලැබේ.

වී. සී. ජයසූරිය,
වැඩබලන පළාත් පාලන කොමසාරිස්.

වර්ෂ 1960 ජූලි මස 15 වැනි දින,
කොළඹ දීය.

## ජාතික නිවාස දෙපාර්තමේන්තුව

### හලාවත නිවාස යෝජනා ක්‍රමය සඳහා ඇතුල් පාරවල් තැනීම

හලාවත නිවාස යෝජනා ක්‍රමය සඳහා ඇතුල් පාරවල් තැනීම පිණිස ජාතික නිවාස ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1960 අගෝස්තු මස 26 වෙනි සිකුරාද පෙරවරු 10 වන තුරු ටෙන්ඩර් බාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර එදින එකී වේලාවට විවෘත කරන විට ටෙන්ඩර් කරුවන්ට පැමිණ සිටිය හැක.

පිටපත් දෙකකින් යුත් ටෙන්ඩර් පත්‍ර මෙම දෙපාර්තමේන්තුවේ නිර්මාණක ඉංජිනේරු තැනගෙන් ලබාගත හැකිවා මෙන්ම වැඩි විස්තරද ඔහුගෙන් ලබාගත හැක.

ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ පාරවල් තැනීමේ වැඩ සඳහා රුපියල් 15,000 කට හෝ ඊට වැඩි ගණනකට ලියා පදිංචි කරන ලද කොන්ත්‍රාත්කරුවෝ පමණක් ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමට සුදුස්සෝ වෙති. එම ලියා පදිංචි කරන ලද සහතිකය සහ මෙම දෙපාර්තමේන්තුවේ සරප්තැන වෙත රුපියල් 25 ක තැන්පත් මුදලක් තැබූ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කරන අයවලුන්ට 1960 අගෝස්තු මස 24 වෙනි බදාදා දවල් 12 වන තුරු ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ.

රෙ. ලෝ. ආර්නෝල්ඩා,
ජාතික නිවාස කොමසාරිස් තැන.

ජාතික නිවාස දෙපාර්තමේන්තුව,
තැපැල් පෙට්ටිය, නො. 544,
කොළඹ 2,
1960 ජූලි මස 12 වෙනි දින දීය.

---

## ග්‍රාම සංවර්ධන සහ ගෘහ කර්මාන්ත දෙපාර්තමේන්තුව

ගාල්ලේ රෙදි කැඳ දැමීමේ යන්ත්‍රස්ථානයකට ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා ස්වදේශ කටයුතු භාර අමාත්‍යාංශයේ, ටෙන්ඩර් මණ්ඩලයේ, සභාපති තුමා විසින් 60.8.23 දින පෙරවරු 10.30 දක්වා ටෙන්ඩර් පත්‍ර බාරගනු ලැබේ.

ටෙන්ඩර් පත්‍ර භාර ගැනෙන්නේ රජයේ දෙපාර්තමේන්තු සඳහා රු. 1,50,000 සහ ඊට වැඩි වැඩ සාර්ථක ලෙස කර ඇති කොන්ත්‍රාත් කරුවන්ගෙන් පමණි. ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබාගැනීම සඳහා රු. 250ක ඇප මුදලක් මේ දෙපාතීමේන්තුවේ කාර්යාලයේ හෝ කොළඹින් පිට කච්චේරියක හෝ තැන්පත් කර කුවිතාන්සිය ඉදිරිපත් කළ යුතුය. වැඩි විස්තර සඳහා ග්‍රාමසංවර්ධන සහ ගෘහකර්මාන්ත අධ්‍යක්ෂ තැනගෙන් හෝ ගාල්ල කච්චේරියේ ග්‍රාම සංවර්ධන සහ ගෘහ කර්මාන්ත දිස්ත්‍රික් නිලධාරි තැනගෙන් හෝ විමසන්න.

ඇම්. ඇස් පෙරේරා,
ග්‍රාම සංවර්ධන සහ ගෘහ කර්මාන්ත අධ්‍යක්ෂ.

60.7.15,
ටොරිංටන් චතුරශ්‍රයේදීය.

---

## රජයේ විදුලි දෙපාර්තමේන්තුව

### සේවයට අයෝග්‍ය වායුසම්පීඩන යන්ත්‍රයක් මිලයට ගැනීම සහ ඉවත් කිරීම

ඉහත කී බඩු කොලොන්නාවේ පිහිටි රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ ගබඩාවෙන් මිලයට ගැනීම සහ ඉවත් කිරීම සඳහා ටෙන්ඩර් පත්‍ර වෂී 1960ක්වූ අගෝස්තු මස 10 වන බදාදා පූ.භා. 10 දක්වා රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන (තැ. පෙ. 540, කොළඹ) විසින් බාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර සම්බන්ධව ලියකියවිලි කොළඹ මැකලම් පාරේ පිහිටි කොන්ත්‍රාත් හා සැපයීම් භාර විදුලි ඉංජිනේරු තැනගේ කාර්යාලයෙහි දී කියවා බලා ගත හැක. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමට අදහස් කරන අයවලුන් විසින් රු. 100ක මුදලක් ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් ද, රු. 5ක මුදලක් ටෙන්ඩර් පෝර්ම සැපයීමේ ගාස්තුව වශයෙන් ද, රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ සරප් තැන වෙත ගෙවා ලබාගත් කුවිතාන්සි කොන්ත්‍රාත් හා සැපයීම් භාර විදුලි ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් පෝර්ම සැපයීමේ ගාස්තුව වන රු. 5 ගේ මුදල ආපසු ගෙවනු නොලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 100 ය ටෙන්ඩර් කොන්දේසි උඩ ආපසු ගෙවනු ලැබේ.

3. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුත්තේ ඉහත කී අයුරු ලබාගත් ටෙන්ඩර් පෝර්ම වලයි. වෂී 1960ක්වූ අගෝස්තු මස 5 වන දින වන තෙක් ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ.

4. වෂී 1960ක්වූ අගෝස්තු මස 10 වෙනි දින පූ.භා. 10 ට රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැනගේ කාර්යාලයෙහිදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර් කරුවන්ට පෙනී සිටීමට අවසර ඇත.

ඊ. සී. ප්‍රනාන්දු,
රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ
ප්‍රධාන කළමනාකාර තැන.

තැ. පෙ. 540,
කොළඹ.
1960ක්වූ ජූලි මස 22 වෙනි දින දීය.

---

## තැපැල් සහ විදුලි සන්දේශ දෙපාර්තමේන්තුව

### සේවයට නුසුදුසු යයි සම්මත කළ භාණ්ඩ මිලට ගැනීම

විවිධ ඉංජිනේරු භාණ්ඩ මිලට ගැනීම සඳහා 1960 අගෝස්තු මස 24 වෙනි දින පෙරවරු 9.30 වන තෙක් කොළඹ මධ්‍ය විදුලි පණිවුඩ කාර්යාලයේ ප්‍රධාන ඉංජිනේරු තැන විසින් ටෙන්ඩර පත්‍ර භාරගනු ලැබේ.

1. මරදානේ විදුලි සන්දේශ ගබඩාවේ ඉංජිනේරු තැනගෙන් විමසා මේ භාණ්ඩ පරීක්ෂා කර බැලිය හැක.

3. කොළඹ මධ්‍ය විදුලි පණිවුඩ කාර්යාලයේ ටැලිග්‍රාෆ් කැෂියර් වෙත හෝ කොළඹින් පිට පළාතක නම්, ප්‍රදේශයේ තැපැල් ස්ථානාධිපති තැන වෙත හෝ, මුදලින් රුපියල් 100ක් තැන්පත් කොට ලබා ගත් රිසිට් පත්‍රයක් ඉදිරිපත් කිරීමෙන් 1960 අගෝස්තු මස 23 වෙනි දින පස්වරු 4 වන තෙක් ප්‍රධාන විදුලි සන්දේශ ඉංජිනේරු තැනගෙන් ලබාගත හැකි පෝර්ම වල ලියා අනු පිටපතක් ද සමග ටෙන්ඩර පත්‍ර ඉදිරිපත් කළ යුතුය.

4. කවරයේ පිට පැත්තේ "භාණ්ඩ මිලට ගැනීමට ටෙන්ඩර" යනු සඳහන් කර සීල් තැබූ ටෙන්ඩර පත්‍ර කොළඹ මධ්‍ය විදුලි පණිවුඩ කාර්යාලයේ ප්‍රධාන විදුලි සන්දේශ ඉංජිනේරු තැන නමට ලිපිනය ලියා රෙජිස්ටර් තැපෑලෙන් එවිය යුතුය. එසේ නැතහොත් ප්‍රධාන ලිපිකරුට භාරදිය යුතුය.

5. විකිණීමට ඇති මුලු භාණ්ඩ තොගයම මිලට ගැනීමට එවන ටෙන්ඩර පත්‍රවල ඒ ඒ භාණ්ඩ විෂයයන් සඳහා සඳහන් කර ඇති, මිල ගණන්, භාණ්ඩ ස්වල්පයක් සඳහා පමණක් වන ටෙන්ඩර පත්‍රවල සඳහන් කර තිබෙන මිල ගණන් වලට අඩු වුවත්, මුලු තොගය සඳහා එවන ටෙන්ඩර පත්‍රවලට වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

6. තෝරාගනු ලැබූ ටෙන්ඩර්කරු තමාගේ ටෙන්ඩරය භාරගත් බව දන්වා දින 7ක් ඇතුළත් ටෙන්ඩරයේ මුලු වටිනාකම මධ්‍ය විදුලි පණිවුඩ කාර්යාලයේ ටැලිග්‍රාෆ් කැෂියර් වෙත මුදලින් තැන්පත් කළ යුතුය. නැතහොත් ඒ මුදලට පෝස්ට් මාස්ටර් ජනරාල් තුමා නමට ලියූ රේඛිත පතක් ප්‍රධාන විදුලි සන්දේශ ඉංජිනේරු තැන වෙත එවිය යුතුය.

7. 1960 අගෝස්තු මස 24 වෙනි දින පෙරවරු 10 ට ප්‍රධාන විදුලි සන්දේශ ඉංජිනේරු කාර්යාලයේදී ටෙන්ඩර පත්‍ර විවෘත කරනු ලැබේ. ටෙන්ඩර කරුවන්ට ඒ අවස්ථාවේ එහි පැමිණ සිටිය හැක.

එච්. ඊ. සෙනෙවිරත්න,
පෝස්ට් මාස්ටර් ජනරාල්.

ප්‍රධාන තැපැල් කාර්යාලය,
කොළඹ. 13.7.1960.

---

## කොළඹ වරාය කොමිෂන් සභාව

කොළඹ වරාය කොමිෂන් සභාවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් 1960 අගෝස්තු මස 4 වෙනි බ්‍රහස්පතින්ද පස්වරු 2.30 දක්වා කොළඹ වරාය කොමිෂන් සභාවට ඇලුමිනියම් ලොරි බොඩි දෙකක් සාද භාර දීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ. 1960 අගෝස්තු මස 4 වෙනි දින පස්වරු 2.30 ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර්කරුවන්ට එහි පෙනී සිටින්ට අවසර දෙනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර රිජිස්ටර් තැපෑලෙන් නොඑවන අය විසින් ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් ටෙන්ඩර් භාර ගැනීම සඳහා බලය පවරන ලද නිලධාරියාට ටෙන්ඩර් පත්‍ර පුද්ගලිකව භාර දී ඒ පිළිබඳව එම නිලධාරියාගෙන් කුවිතාන්සියක් ලබාගත යුතුය.

3. ටෙන්ඩර් පිළිබඳ ලිපි ලේඛන කොළඹ වරාය කොමිෂන් කාර්යාලයේදී පරීක්ෂා කළ හැක. රු. 50 මුදලක් වරාය කොමිෂන් කාර්යාලයේ තැන්පත් කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝර්ම කොළ ලබා ගත හැක. ටෙන්ඩර් කොන්දේසි වලට අනුව ඇප මුදල ආපසු ගෙවනු ලැබේ.

4. ඉහත සඳහන් අන්දමට ලබා ගත් පෝර්ම කොලවල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. 1960 අගෝස්තු මස 3 වෙනි බදාදා දවල් 12 දක්වා ටෙන්ඩර් පෝර්ම කොල නිකුත් කරනු ලැබේ. පිළිගත්

ටෙන්ඩරය සඳහා ඇපකරුවන් අවශ්‍ය වී නම් එය සැපයීමට ටෙන්ඩර්කරු සූදානම්ව සිටිය යුතුය. ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනයේ සිට යටත් පිරිසෙයින් දින 60 ක් සෑම ටෙන්ඩරයක්ම වලංගුව පවතී.

ඒ. ඇස්. කොහොඹන්වික්‍රම,
වරායේ කොමසාරිස්.

1960 ජූලි මස 13 වෙනි දින,
කොළඹ, වරාය කොමිෂන් කාර්‍යාලයේදීය.

---

## ලංකා ගමනාගමන මණ්ඩලය

හොරණ-මුණගම හොරණ-රත්නපුර පාර යාබදව ගරාජයක් පිහිටුවීමට බිම සකස් කිරීම සඳහා එවන ටෙන්ඩර පත්‍ර කොළඹ 5, කිරුළ පාරේ 200 වෙනි ස්ථානයෙහි වූ ලංකා ගමනාගමන මණ්ඩලීය ටෙන්ඩර මණ්ඩලයේ සභාපති මහතා විසින් 1960 අගෝස්තු මස 10 වෙනිදා පෙ. ව. 10 වනතෙක් භාරගනු ලැබේ. බොරලැස්ගමුවේ වේරහැර ලංකා ගමනාගමන මණ්ඩලීය නියෝජ්‍ය ප්‍රධාන (සිවිල්) ඉංජිනේරු මහතාගෙන් වැඩි විස්තර අසාගත යුතුයි.

ටෙන්ඩර පත්‍ර එවීමට සුදුස්සෝ නම් රු. 35,000ක් හෝ ඊට වැඩියෙන් බියදම් යන වැඩ කිරීමට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවෝ පමණකි. ඔවුන් විසින් තම සහතික පත්‍ර ආදිය පරීක්ෂාව හා අනුමත කිරීම පිණිස බොරලැස්ගමුවේ වේරහැර ලංකා ගමනාගමන මණ්ඩලීය නියෝජ්‍ය ප්‍රධාන (සිවිල්) ඉංජිනේරු මහතා වෙත ඉදිරිපත් කළ යුතුයි. ඒ මහතා ඒවා පිළිගත් පසු ඔවුන් විසින් කොළඹ 5, කිරුළ පාරේ 200 වෙනි ස්ථානයෙහි සිටින ලංකා ගමනාගමන මණ්ඩලීය ප්‍රධාන ගිණුම් නිලධාරි මහතා වෙත රු. 100ක ටෙන්ඩර මුදලක් තැන්පත් කළ යුතුයි.

මුදල තැන්පත් කොට ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට නියෝජ්‍ය ප්‍රධාන (සිවිල්) ඉංජිනේරු මහතා විසින් 1960 අගෝස්තු මස 6 වෙනිදා වන තෙක් ටෙන්ඩර ලිපි නිකුත් කරනු ලැබේ.

කොයි ටෙන්ඩර පත්‍රයක් ලියා එවිය යුත්තේ ලංකා ගමනාගමන මණ්ඩලයෙන් දෙන ටෙන්ඩර පෝරම කොළවලය.

ලංකා ගමනාගමන මණ්ඩලයේ ලේකම් තැන.

1960 ජූලි මස 14 වෙනි දිනදීය.

---

## ටෙන්ඩර් දැන්වීමයි—කොළඹ කච්චේරිය

නිට්ටඹුවේ මැටි කර්මාන්ත මධ්‍යස්ථානයේ දැනට ඇති පෝරණයේ බඩු ආදිය පාවිච්චි කිරීමෙන් එම පෝරණය නැවත සෑදීම සහ යකඩ පටි සවි කිරීම සඳහා 1960.8.9 වන දින පස්වරු 2 දක්වා කොළඹ කච්චේරියේ ග්‍රාම සංවර්ධන සහ ගෘහ කර්මාන්ත භාර දිස්ත්‍රික්ක නිලධාරි තැන විසින් සීල් තබන ලද ටෙන්ඩර් පත් භාරගනු ලැබේ. 1960.8.5 වන දින පස්වරු 2 දක්වා ටෙන්ඩර් පෝරම පහත දැක්වෙන ලිපිනය ඇති කාර්යාලයෙන් ලබාගත හැකිය. ටෙන්ඩර් පෝරම ලබාගැනීම සඳහා රුපියල් දහයක මුදලක් බැඳිය යුතු වේ. අවශ්‍ය විස්තර පහත සඳහන් ලිපිනයෙන් විමසන්න.

ඇස්. සිවගුරුනාදන්,
කොළඹ රජයේ ඒජන්ත තැන වෙනුවට.

ග්‍රාම සංවර්ධන සහ ගෘහ කර්මාන්ත
දිස්ත්‍රික්ක කාර්යාලයය,
කච්චේරිය, කොළඹ.

---

## මොණරාගල කච්චේරියේ ගරාජ සහිත ගොඩනැගිල්ලක් සෑදීම

මොණරාගල දිස්ත්‍රික්කයේ දිසාපති තුමා විසින් දොරවල් රහිත ගරාජ 4ක්, දොරවල් සහිත ගරාජ 2ක් සහ ගබඩා කාමරයකින්ද යුක්ත ගොඩනැගිල්ලක් සෑදීම සඳහා රජයේ ලියාපදිංචි කරන ලද කොන්ත්‍රාත්කරුවන්ගෙන් 1960 අගෝස්තු මස 5 වෙනි දින දවල් 12 වනතෙක් ටැන්ඩර් භාරගනු ලැබේ.

ටැන්ඩර් එවිය යුත්තේ මොණරාගල දිසාපති තුමා විසින් සපයනු ලබන නියමිත පෝර්ම මගිනි. මෙම පෝර්ම 1960 අගෝස්තු මස 3වෙනි දින පස්වරු 3 දක්වා නිකුත් කරනු ලැබේ. ටැන්ඩර් පෝර්ම ලබා ගැනීම සඳහා දිවයිනේ ඕනෑම කච්චේරියක හෝ මහා භාණ්ඩාගාරයේ රුපියල් 25ක මුදලක් තැන්පත් කොට ඒ වෙනුවට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුයි.

සෑම ටැන්ඩරයක්ම සුරක්ෂිත ලෙස සීල් තබා ලියුම් කවරයේ "ගරාජයක් සෑදීම සඳහා ටැන්ඩර්" යනුවෙන් සඳහන් කොට මොණරාගල දිසාපති තුමා වෙත ලැබෙන සේ එවිය යුතුයි. ටැන්ඩර් ලියාපදිංචි කළ තැපෑලෙන් එවීමට හෝ මොණරාගල කච්චේරියේ කාර්යාල සහායක තැන ළග ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීම කළ හැකිය.

තෝරාගත් ටැන්ඩර්කරු තම කොන්ත්‍රාත්තුව භාරගත් වහාම ඉහත සඳහන් ගොඩනැගිල්ල සෑදීමේ වැඩ පටන් ගත යුතුයි.

ටැන්ඩර් සියල්ලම ප්‍රතික්ෂෙප කිරීමේ හෝ භාර ගැනීමේ අයිතියද, කොටසක් භාර ගැනීමේ අයිතියද සම්පූර්ණයෙන්ම මොණරාගල දිසාපති තුමා වෙත පැවරී තිබේ.

වී. පී. සිල්වා,
මොණරාගල දිස්ත්‍රික්කයේ දිසාපති තුමා වෙනුවට

1960 ජූලි මස 12 වෙනි දින,
මොණරාගල දිසාපති කාර්යාලයේදීය.

---

## ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුව

මීරිගම ආණ්ඩුවේ අභ්‍යාස විද්‍යාලයේ කතිකා ශාලාව තැනීම සඳහා 1960 ජූනි මස 10 වෙනි දින අංක 12,143 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ වූ ටැන්ඩර් දැන්වීම මෙයින් අවලංගු කරනු ලැබේ.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
අධ්‍යක්ෂ වෙනුවට.

1960 ජූලි මස 16 වැනි දින,
කොළඹ, ආණ්ඩුවේ වැඩ දෙපාතීමේන්තුවේ
කාර්යාලයේ දීය.

---

වැල්ලවත්තේ අළුත් ආහාර ගබඩාවක් තැනීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ 1, ට්‍රාන්ස්වර්ක්ස් හවුස්හී පිහිටි රජයේ තැපැල් වැඩ හා විදුලි බල පිළිබඳ අමාත්‍යාංශයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වෂී 1960 අගෝස්තු මස 10 වෙනි බදාදා පෙරවරු 9.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීමට නියමිත වේලාව වන මෙදින පස්වරු 2.30ට ටෙන්ඩර්කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. කොළඹ ටොරිංටන් චතුරශ්‍රයේ ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි පිළිබඳ විධායක ඉංජිනේරු තැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධව සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වෂී 1960 ජූලි මස 29 වෙනි සිකුරාදා පස්වරු 4:30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රු. 1,70,000ට නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක්, ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 200ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. පහත සඳහන් ආයතන හා සමිති වලින් තැන්පත් මුදල් අවශ්‍ය නැත :—

(අ) සමූපකාර තොග වෙළඳ ආයතනය.

(ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන ; නිදසුනක් : "වෛනා නැෂනල් මැෂිනරි ඉම්පෝට් කෝපරේෂන්"

(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ තැන විසින් අනුමත කරනු ලැබූ ග්‍රාම සංවර්ධන සමිති, සහ

(ඈ) සමූපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර් තැන විසින් ලියා පදිංචි කරන ලද සමූපකාර සමිති.

5. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්‍යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
අධ්‍යක්ෂ වෙනුවට.

1960 ජූලි මස 16 වැනි දින,
කොළඹ, ආණ්ඩුවේ වැඩ දෙපාතීමේන්තුවේ
කාර්යාලයේ දීය.

---

අඹේපුස්ස තානායමේ නවීන වර්ණ ක්‍රමය ආදිය සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වෂී 1960 අගෝස්තු මස 10 වෙනි බදාදා පෙරවරු 10.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී බදාදා පෙරවරු 10.30ට ටෙන්ඩර්කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. කෑගල්ලේ ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන නිර්මාණ විධායක ඉංජිනේරු තැනගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක්ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල්ද ඔහුගේ කාර්යාලයේ දී බලා ගැනීමට පුළුවන.

3. වෂී 1960 අගෝස්තු මස 5 වෙනි සිකුරාද පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රු. 7,100ට නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 25ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. පහත සඳහන් ආයතන හා සමිති වලින් තැන්පත් මුදල් අවශ්‍ය නැත :—

(අ) සමුපකාර තොග වෙළඳ ආයතනය.

(ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන ;
නිදසුනක් : " වෙනා නැෂනල් මැෂිනරි ඉම්පෝට් කෝපරේෂන් "

(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්‍ෂ තැන විසින් අනුමත කරනු ලැබූ ග්‍රාම සංවර්ධන සමිති, සහ

(ඈ) සමුපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර් තැන විසින් ලියා පදිංචි කරන ලද සමුපකාර සමිති.

5. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කායඹාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
අධ්‍යක්‍ෂ වෙනුවට.

1960 ජූලි මස 16 වැනි දින,
කොළඹ, ආණ්ඩුවේ වැඩ දෙපාතීමේන්තුවේ
කාර්යාලයේ දීය.

---

නෝටන් බ්‍රිජ්හි කැරොලිනා-නෝටන්-වනරාජා පාරේ රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ ඕවර්සියර් තැනගේ නිවාසය තැනීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වෂී 1960 අගෝස්තු මස 10 වෙනි බදාදා පෙරවරු 10.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී බදාදා පෙරවරු 10.30ට ටෙන්ඩර්කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. නෝර්වුඩ් ආ. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක්ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල්ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වෂී 1960 ජූලි මස 29 වෙනි සිකුරාද පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රු. 27,000ට නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 50ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. පහත සඳහන් ආයතන හා සමිති වලින් තැන්පත් මුදල් අවශ්‍ය නැත :—

(අ) සමුපකාර තොග වෙළඳ ආයතනය.

(ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන ;
නිදසුනක් : " වෙනා නැෂනල් මැෂිනරි ඉම්පෝට් කෝපරේෂන් "

(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්‍ෂ තැන විසින් අනුමත කරනු ලැබූ ග්‍රාම සංවර්ධන සමිති, සහ

(ඈ) සමුපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර් තැන විසින් ලියා පදිංචි කරන ලද සමුපකාර සමිති.

5. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කායඹාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
අධ්‍යක්‍ෂ වෙනුවට.

1960 ජූලි මස 16 වැනි දින,
කොළඹ, ආණ්ඩුවේ වැඩ දෙපාතීමේන්තුවේ
කාර්යාලයේ දීය.

වැලිමඩ ග්‍රාමීය ආරෝග්‍යශාලාවේ ඇඳන් 24කට සෑහෙන වාට්ටුවක් තැනීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ 1, ට්‍රාන්ස්වර්ක්ස් හවුස්හි පිහිටි රජයේ වැඩ පිළිබඳ අමාත්‍යාංශයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වෂී 1960 අගෝස්තු මස 10 වෙනි බදාදා පෙරවරු 9.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීමට නියමිත වේලාව වන මෙදින පස්වරු 2.30ට ටෙන්ඩර්කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. දියතලාව ආ. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධව සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල්ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වෂී 1960 ජූලි මස 29 වෙනි සිකුරාද පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රු. 57,700ට නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක්, ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 100ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. පහත සඳහන් ආයතන හා සමිති වලින් තැන්පත් මුදල් අවශ්‍ය නැත :—

(අ) සමුපකාර තොග වෙළඳ ආයතනය.

(ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන ;
නිදසුනක් : " වෙනා නැෂනල් මැෂිනරි ඉම්පෝට් කෝපරේෂන් "

(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්‍ෂ තැන විසින් අනුමත කරනු ලැබූ ග්‍රාම සංවර්ධන සමිති, සහ

(ඈ) සමුපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර් තැන විසින් ලියා පදිංචි කරන ලද සමුපකාර සමිති.

5. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කායඹාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
අධ්‍යක්‍ෂ වෙනුවට.

1960 ජූලි මස 16 වැනි දින,
කොළඹ, ආණ්ඩුවේ වැඩ දෙපාතීමේන්තුවේ
කාර්යාලයේ දීය.

---

කොළඹ-නුවර පාරේ 25 වෙනි සැතපුම් කණුව අසල හබරාදූවේ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තු ඕවර්සියර් තැනගේ නිවාසය තැනීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වෂී 1960 අගෝස්තු මස 10 වෙනි බදාදා පෙරවරු 10.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී බදාදා පෙරවරු 10.30ට ටෙන්ඩර්කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. වේයන්ගොඩ ආ. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක්ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල්ද ඔහුගේ කාර්යාලයේ දී බලා ගැනීමට පුළුවන.

3. වෂී 1960 ජූලි මස 29 වෙනි සිකුරාද පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රු. 23,000ට නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක්, ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 25ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. පහත සඳහන් ආයතන හා සමිති වලින් තැන්පත් මුදල් අවශ්‍ය නැත :—

(අ) සමුපකාර තොග වෙළඳ ආයතනය.

(ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන ;
නිදසුනක් : " වෙනා නැෂනල් මැෂිනරි ඉම්පෝට් කෝපරේෂන් "

(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්‍ෂ තැන විසින් අනුමත කරනු ලැබූ ග්‍රාම සංවර්ධන සමිති, සහ

(ඈ) සමුපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර් තැන විසින් ලියා පදිංචි කරන ලද සමුපකාර සමිති.

5. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

පී. ගුණරත්නම්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
අධ්‍යක්ෂ වෙනුවට.

1960 ජූලි මස 16 වැනි දින,
කොළඹ, ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේ දීය.

---

# බඩු බාහිරාදිය විකිණීම්

## වතුපිටිවල රජයේ තරුණ අභ්‍යාස විද්‍යාලය

### සතුන් වෙන්දේසියේ විකිණීම

පහත නම් සඳහන් වර්ගවල තෝරන ලද සතුන් වතුපිටිවල තරුණ වරදකරුවන්ගේ අභ්‍යාස විද්‍යාලයීය ගොවි පළේදී අගෝස්තු මස 8 වෙනි සඳු දින පෙරවරු 10ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

නිවාඩු දිනයන් හැර අන් සෑම දවස්වලම පෙරවරු 9 යේ සිට පස්වරු 4.30 දක්වා සතුන් බැලීමට ඉඩ තිබේ. වෙන්දේසියේ ඉල්ලා ගන්නා සතුන් ඒ ස්ථානයේදී ම මුදල් දී ගෙන යා යුතුය.

| | |
|---|---|
| වහු පැටවුන් ... ... ... | 9 යි |
| ලොකු ඊරියන් ... ... ... | 2 යි |
| ලොකු ඌරන් ... ... ... | 1 යි |
| ඩබ්ලිව්. ඇල්. කිකිළියන් ... ... | 35 යි |
| ආර්.අයි.ආර්. කිකිළියන් ... ... | 15 යි |
| වයස් ගත වූ හරක් ... ... ... | 1 යි |

උපාලි ඇස්. ගුණරත්න,
අධිකාරි,
රජයේ තරුණ වරදකරුවන්ගේ
අභ්‍යාස විද්‍යාලය,

වතුපිටිවල, නිට්ටඹුව.

---

## කැලෑ දෙපාර්තමේන්තුව

කොළඹ මැක්ලම් පාරේ පිහිටි මධ්‍යම දැව ගබඩාවේ තිබෙන ඉරාපු ලී ලොට් 8ක් 1960වේ ජූලි මස 29වෙනි සිකුරාදා උදේ 9.30ට එම ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වැඩි විස්තර කොළඹ මැක්ලම් පාරේ පිහිටි මධ්‍යම දැව ගබඩාව භාරකරුගෙන් දැනගත හැක.

ජේ. ඇල්. ඊ. ප්‍රනාන්දු,
වන සංරක්ෂක.

තැ. පෙ. 509,
කිව් පාර, කොළඹ 2.

---

## කැලෑ දෙපාර්තමේන්තුව

කැළණිවැලි ශූඩ්ස් යාඩ්හි ලී ගබඩාවේ තිබෙන බුරුත කොටන් 80ක් 1960වේ අගෝස්තු මස 2වෙනි අඟහරුවාදා උදේ 9.30ට එම ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වැඩි විස්තර කොළඹ මැක්ලම් පාරේ කැළණිවැලි ලී ගබඩාව භාරකරුගෙන් දැනගත හැක.

ජේ. ඇල්. ඊ. ප්‍රනාන්දු,
වන සංරක්ෂක.

තැ. පෙ. 509,
කිව් පාර, කොළඹ 2.

## කැලෑ දෙපාර්තමේන්තුව

ඝන අඩි 200ක් ඇති ඉරාපු ලී ගොඩවල් 10ක්ද, වට කණු 200ක් ඇති ගොඩවල් 10ක්ද සහ සිල්බර 500ක් ඇති ගොඩවල් 20ක්ද, 1960 ජූලි මස 28 වැනි ගුරු දින පෙරවරු 9ට බූස්සේ පිහිටි කැලෑ දෙපාර්තමේන්තුවේ මධ්‍යම ලී ගබ්ඩාවේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වැඩි විස්තර බූස්සේ විශේෂ වන පාලක තැනගෙන් විමසා දැන ගන්න.

ජේ. ඇල්. ඊ. ප්‍රනාන්දු,
වන සංරක්ෂක.

කැලෑ දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 509,
කිව් පාර, කොළඹ 2.

---

## ප්‍රසිද්ධ වෙන්දේසියයි

කොග්ගල ගුවන් තොටුපලේ පිහිටි පහත සඳහන් උප ලේඛනයෙහි සඳහන් ගොඩනැගිලි කඩා, උපකරණ ආදිය ඉවත් කර ගැනීම පිණිස, එම ගොඩනැගිලි පිහිටි ස්ථානයේදී, ගාල්ලේ දිසාපති තැන විසින් 1960 අගෝස්තු මස 9 වෙනි දින පෙරවරු 9.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

2. මෙම වෙන්දේසියේදී ඉහල ඉල්ලුම්කරුවනට ගොඩනැගිලි භාර දෙන නමුත්, යම්කිසි ඉල්ලුම්කරුවෙකුගේ ඉල්ලීමක් කිසි හේතුවක් නොදක්වා ප්‍රතික්ෂෙප කිරීමේ බලය දිසාපති තැනට ඇති බැව් සැළකිය යුතුයි.

3. ගොඩනැගිලි මිලට ගනු ලබන අය 1960. 8. 9 දින සිට දින තිහක් ඇතුලත ගොඩනැගිලි කඩා භූමිය සමතලා කොට උපකරණ පිටත ගෙන යා යුතුය. භූමිය සමතලා කිරීමේ කොන්දේසිය අනුව ගැනුම් කරුවන් විසින් රු. 250 ඇප මුදලක් වෙන්දේසිය නිමවූ විගස ගෙවිය යුතුයි. මේ මුදල එම කොන්දේසිය ඉටු කළාට පසු ආපසු ලැබෙනු ඇත.

4. වෙන්දේසිය අවසානයේ සම්පූර්ණ මුදල් ගෙවිය යුතුයි. යම් හෙයකින්, මුදල් එම අවස්ථාවේ නොගෙවන ලදනම්, ඊළඟ ඉල්ලුම් කරුගේ ඉල්ලීම භාරගැනීමට හෝ වෙන්දේසිය සම්පූර්ණයෙන් අවලංගු කිරීමට බලය දිසාපති තැනට තිබේ.

5. වෙන්දේසිය පහත උප ලේඛනයෙහි සඳහන් මූලික ගණන් වලින් අරඹනු ලැබේ. මෙම මුදල් වලට ඉල්ලුම්කරුවන් නොසිටිය හොත් වෙන්දේසිය නොපැවැත්වීමට දිසාපති තැනට බලය තිබේ.

ඇන්. ඩී. ජයවීර,
ගාලු දිස්ත්‍රික්කයේ දිසාපති වෙනුවට.

දිසාපති කාර්යාලය,
ගාල්ල,
1960 ජූලි 13 වැනි දින.

### උපලේඛනය

| අනුපිළිවෙල | ගොඩනැගිලි සම්බන්ධ විස්තරය | අඩි | මූලික මුදල රු. |
|---|---|---|---|
| 1. | නො. 127 ඒ ගොඩනැගිල්ල | 86 × 26 | 1,000 |
| 2. | නො. 127 බී ගොඩනැගිල්ල | 112 × 35 | 1,600 |
| 3. | නො. 127 සී ගොඩනැගිල්ල | 21 × 14 | 50 |
| 4. | නො. 280 ගොඩනැගිල්ල | 121 × 22 | 1,100 |
| 5. | නො 300 ගොඩනැගිල්ල | 121 × 42 | 2,500 |
| 6. | නො. 304 ගොඩනැගිල්ල | 51 × 32 | 750 |
| 7. | නො. 310 ගොඩනැගිල්ල | 43 × 22 | 750 |
| 8. | නො. 315 ගොඩනැගිල්ල | 62 × 20 | 500 |
| 9. | නො. 316 ගොඩනැගිල්ල | 49 × 26 | 520 |

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී